# වාර්ෂික වාර්තාව

# 2016

ජාතික තරුණ සේවා සභාව

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

## හැඳින්වීම

ජාතික තරුණ සේවා සභාව 2016 වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්හි ප්‍රතිඵල මෙම වාර්ෂික වාර්තාව තුළින් පිළිබිඹු වේ.

දේශිය මෙන්ම විදේශීය තරුණ ප්‍රජාව සම්බන්ධ කර ගනිමින් තරුණ සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නගමින් ආයතනික ඉලක්ක කරා ලගාවීම සඳහා යොදාගත් උපක්‍රම හා ඉන් ලද ප්‍රතිඵලයන් මේ තුළින් විදහා දැක්වේ. භෞතික හා මානව සම්පත් තරුණ සංවර්ධන ක්‍රියාවලිය සඳහා උපයෝගී කරගත් ආකාරය මෙහි දක්වා ඇත.

ආයතනික තීන්දු තීරණ ගැනීම සඳහා මෙන්ම, බාහිර පාර්ෂවයන්ටද ආයතනය පිළිබඳව ප්‍රතිරූපයක් ගොඩ නගා ගැනීමට මෙම වාර්ෂික වාර්තාව ඉවහල් වනු ඇත. විශේෂයෙන් ඉදිරි වර්ෂය සඳහා ප්‍රතිපාදන ලබාගැනීමේදී මෙහි සඳහන් කාර්යසාධනයන් වැදගත් වේ.

තවද රාජ්‍ය නොවන සංවිධාන සහ ආයතනය පිළිබඳ උනන්දුවක් දක්වන බාහිර පාර්ශවයන් ජාතික තරුණ සේවා සභාව සමඟ සම්බන්ධ වී කටයුතු කිරීමේදී තීරණ ගැනීම සඳහා වාර්ෂික වාර්තාව උපයෝගී කරගත හැක. එමෙන්ම අපේක්ෂිත දිශාව තුළ ගමන් කළේ ද යන්න අවබෝධ කර ගැනීමට වාර්ෂික වාර්තාව බෙහෙවින් වැදගත් වේ.

2016 වර්ෂය තුළ ජාතික තරුණ සේවා සභාවේ යෞවන සමාජ පිහිටුවීම, යොවුන් පාර්ලිමේන්තුව, තරුණ නායකත්ව වැඩසටහන්, සංහිඳියාවේ සූර්ය මංගල්‍ය, යෞවන ක්‍රිඩා උළෙල, ක්‍රිඩා භාණ්ඩ බෙදාදීමේ වැඩසටහන, තුරුණු ශ්‍රම ශක්ති ප්‍රජා සංවර්ධන වැඩසටහන, යෞවන සම්මාන උළෙල, යොවුන් නාට්‍ය තරඟාවලිය, (නිස්කෝ) තරුණ සමූපකාර සමිති වැඩසටහන, විදේශ සංචිත, තරුණ හුවමාරු වැඩසටහන් වැනි වැඩසටහන් රාශියක් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

නිලධාරීන්ගේ වෘත්තීමය සුදුසුකම් ඉහළ නැංවීම සහ ඉහළ අධ්‍යාපන මට්ටමක් සහිත නිලධාරීන් සම්බන්ධ කරගැනීමේ අවශ්‍යතාවය දැඩිව පවතී. භෞතික සම්පත් වල හිඟතාවය, සමාන සේවා සපයන ආයතන සමඟ තරඟ කිරීමට ආයතනයට සම්පත් ප්‍රමාණවත් නොවීම මෙම වර්ෂයේද ආයතනයේ අභියෝගයන් විය. මෙම ගැටළු වලට පිළියමක් ලෙස පුහුණු අවශ්‍යතා විශ්ලේෂණයකින් පසු නිළධාරි පුහුණු කිරීම, වෘත්තිය මට්ටමේ ප්‍රවීණයන්ගේ සහාය ලබා ගැනීම සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) යාවත්කාලීන කිරීම සහ භෞතික සම්පත් යාවත්කාලින කිරීම යනාදිය සිදු කිරීමේ දැඩි අවශ්‍යතාවය පවතී.

ජාතික තරුණ සේවා සභාවේ සියළු කාර්යයන් සාර්ථකව පවත්වාගෙන යෑම සඳහා මාර්ගෝපදේශකත්වය හා නායකත්වය සපයනු ලැබූ **ගරු අග්‍රාමාත්‍යතුමා, අමාත්‍යතුමා ඇතුළු ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන් සහ** ජාතික තරුණ සේවා සභාවේ සභාපති / අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු මෙහිලා සහය දැක් වූ සියළු දෙනා ගෞරවයෙන් සිහිපත් කරමු.

සහකාර අධ්‍යක්ෂ
සැලසුම් සහ සංවර්ධන අංශය

## දැක්ම

අභිමානවත්, ශ්‍රී ලාංකේය තරුණයා බිහි කිරීමේ විශ්වාසනීය නියමුවා බවට පත්වීම.

## මෙහෙවර

දැනුමින් හා කුසලතා වලින් පරිපූර්ණ, දේශියත්වය ගරු කරන, ජාත්‍යන්තරය ජයගත හැකි, විනයගරුක, ශ්‍රී ලාංකේය තරුණයා බිහි කිරීම උදෙසා, තරුණ සංවර්ධනයේ ප්‍රමුඛයා වශයෙන් කටයුතු කරමින් සිය සේවා විශිෂ්ඨ සහ විශ්වාසනීය අයුරින් සැපයීම.

## අරමුණු

- ජාතික හැඟුම පිළිබඳ උද්යෝගයක්, විනය පිළිබඳ හැඟීමක්, සමාජ හා ආර්ථික ගැටළු පිළිබඳ අවබෝධයක් සහ ශ්‍රමාභිමානය පිළිබඳ හැඟීමක් තරුණයන් අතර පෝෂණය කිරීම.

- ජාතික සංවර්ධන යෝජනා ක්‍රමයන්හි තරුණයන්ගේ සහභාගිත්වය ඇති කර ගැනීම.

- ශ්‍රී ලංකාවේ හා වෙනත් රටවල තරුණයන් අතර සුහදතාවය සහ අන්‍යෝන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීම.

- තරුණයන් අතර තරගකාරිත්වය හා ජයග්‍රහණය පිළිබඳ හැඟීම සඳහා දිරිගැන්වීම.

- තරුණයන්ගේ දැනුම පුළුල් කිරීම සහ සංවර්ධනයට අදාළ ක්ෂේත්‍රයන්හි පුහුණුවීම ලබාදීම.

- තරුණයන් අතර සංස්කෘතික සාහිත්‍යමය හා කලාත්මක ක්‍රියාකාරකම් සඳහා දිරි ගැන්වීම.

- තරුණයන් අතර ශාරීරික ප්‍රාගුණය හා ක්‍රීඩා වර්ධනය සඳහා දිරි ගැන්වීම.

- තරුණයන් සඳහා විනෝද කටයුතු සහ විනෝද සැපයුම් පිළිබඳ පහසුකම් සැලසීම.

- ආබාධිත තරුණයන්ට සහය වීම.

- රජයේ ආර්ථික සැළසුම ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව, දීර්ඝ කාලීන ප්‍රතිපත්ති පදනමක් මත ඵලදායී ලෙස අරමුදල් ආයෝජනය කිරීමෙන් තරුණයන් සඳහා ක්‍රමික සේවා නියුක්තිය සඳහා අවස්ථාව සැලසීම.

- ප්‍රතිපත්ති සැකසීමේ හා ක්‍රියාත්මක කිරීමේ දී තරුණයන්ගේ සහභාගිත්වය සඳහා අවස්ථාව සැලසීම.

- තරුණ සංවිධානය පිහිටුවීම සහ තරුණ සුභ සාධනය සඳහා දැනටමත් පිහිටුවා ඇති සංවිධාන වලට සහය වීම.

- තරුණ සේවා ව්‍යාප්තිය සැළසුම් කිරීම, ඒකාබද්ධ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ මෙහෙයවීම.

- එක් එක් තරුණයාගේ ආවේනික ලක්ෂණ වර්ධනය කිරීම.

# <u>ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ සුභ පැතුම් පණිවිඩය</u>

අප අමාත්‍යාංශය යටතේ පාලනය වන, ජාතික තරුණ සේවා මඟින් 2016 වර්ෂයේ සිදු කරන ලද වැඩසටහන් වලට අදාළව සකස් කරන ලද, 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව වෙනුවෙන් සුබ පැතුමක් නිකුත් කරනුයේ හදපිරි සොම්නසිනි.

වත්මන් රජය බලයට පත් වී කෙටි කාලයක් තුළ ශ්‍රී ලාංකේය තරුණ පරපුර වෙනුවෙන් ජාතික තරුණ සේවා සභාව හරහා තරුණ සංවර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීමට හැකි වීම පිළිබඳව මා අතිශයින්ම සතුටට පත්වෙමි.

අතිගරු ජනාධිපතිතුමාගේ මෙන්ම, විෂය භාර අමාත්‍යවරයා වශයෙන්, ගරු අග්‍රාමාත්‍යතුමාගේ උපදෙස් පරිදි, අප අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍ය ගරු නිරෝෂන් පෙරේරා මැතිතුමාගේ මඟ පෙන්වීම අනුව, ජාතික තරුණ සේවා සභාව මඟින් 27 කට පසුව යොවුන්පුරය නැවත වතාවක් ඓතිහාසික සීගිරිය පුරවරයෙන් ආරම්භ කිරීමත්, ස්වාධීන රූපවාහිනී සේවය සමඟ එක් වෙමින් "Youth with Talent" "ගමට කෝටියක්" හා Reality Show වැඩසටහන ආරම්භ කිරීමට ලැබීමත් ශ්‍රී ලාංකේය තරුණ පරපුර ලත් සුවිශේෂී ජයග්‍රහණයක් ලෙසින් හඳුන්වා දිය හැකිය. එමෙන්ම ජාතික යෞවන ක්‍රීඩා උළෙල, 3 වැනි ශ්‍රී ලංකා යොවුන් පාර්ලිමේන්තුව, ජාතික යෞවන සම්මාන උළෙල වැනි වැඩසටහන් රාශියක්ම 2016 තුළ අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට හැකි වූ බව සතුටින් සඳහන් කරමි.

මෙම සියලුම තරුණ සංවර්ධන වැඩසටහන් ඉතාමත් සාර්ථකව හා විචිත්‍රවත්ව සංවිධානය කළ ජාතික තරුණ සේවා සභාවේ සභාපති/අධ්‍යක්ෂ ජනරාල් නීතිඥ ඩබ්.ජී.එස්. එරන්දික මහතා ප්‍රමුඛ ජාතික තරුණ සේවා සභාවේ සමස්ථ කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය මෙයින් පිරිනමමි.

ශාන්ත බණ්ඩාර,
ලේකම් (වැ.බ)
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය.

## ජාතික තරුණ සේවා සභාවේ සභාපති /අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

2016 වර්ෂයට අදාලව ජාතික තරුණ සේවා සභාව මඟින් සංවිධානය කරන ලද තරුණ සංවර්ධන වැඩසටහන් විදහා දැක්වෙන, 2016 වාර්ෂික වාර්තාව සඳහා සුභාශිංශනයක් නිකුත් කරනුයේ ඉමහත් සතුටකිනි.

මෙම ආයතනයේ සභාපති/අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් රාජකාරි භාරගෙන වසරක් වැනි කෙටි කාලයක් තුළ 2016 වර්ෂය වෙනුවෙන් තරුණ සංවර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීමට ලැබීම පිළිබඳව මා අතිශයින් සතුටට පත්වෙමි.

වසර 27 කට පසුව, යොවුන්පුරය වැඩසටහන 2016 මාර්තු 31 දි සිට අප්‍රේල් 03 දින දක්වා ඓතිහාසික සීගිරිය පුරවරය කේන්ද්‍ර කොට ගනිමින් දේශීය හා විදේශීය තරුණ තරුණියන් 5000කගේ සහභාගීත්වයෙන් යුතුව පැවැත්වීමට ලැබීම ශ්‍රී ලාංකේය තාරුණ්‍යය ලත් සුවිශේෂී ජයග්‍රහණයකි. එමෙන්ම මෙරට රියැලිටිකරණ අත්දැකීම් සුවිශේෂී අභියෝගයකට ලක් කරමින් ස්වාධීන රූපවාහිනී සේවය සමඟ එක්ම “Youth with talent” “ගමට කොටියක් ” හා රියැලිටි “show” වැඩසටහන් ඉතාමත් සාර්ථකව නිමා කිරීමට හැකි වීමත් අප ලත් ජයග්‍රහණයක් ලෙසින් හඳුන්වා දිය හැකිය.

මීට අමතරව ජාතික නාට්‍ය පාසල නැවත ආරම්භ කිරීම, 28 වැනි ජාතික යෞවන ක්‍රීඩා උළෙල හා 38 වැනි ජාතික යෞවන සම්මාන උළෙල, 3 වැනි ජාතික යොවුන් පාර්ලිමේන්තුව වැනි වැඩසටහන් අති උත්කර්ශවත් අන්දමින් පැවැත්වීමට අපට හැකියාවක් ලැබිණි.

නවීන තාක්ෂණයත් සමඟින් ශ්‍රී ලාංකේය තරුණ තරුණියන් හා අප ආයතනය අතර මනා සබඳතාවයක් ගොඩ නැඟීමේ අවකාශ සලස්වමින් වෙනමම තොරතුරු තාක්ෂණ අංශයක් ස්ථාපිත කිරීමටත්, නවතම වෙබ් අඩවියක් හඳුන්වා දීමටත් අප අවස්ථාවක් උදා වනුයේ 2016 වසරේදීය. තවද, මෙ වසර තුළදී අලුතින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන කිහිපයක් ආරම්භ කිරීමට ද, ජාත්‍යන්තර යෞවන තිළිණ වැඩසටහන් උතුරු නැගෙනහිර ඇතුළු දිවයිනේ දුෂ්කර ප්‍රදේශ කිහිපයකට හඳුන්වා දීමට ද, අපට මෙම වසර තුළ හැකියාව ලැබුණු බව සතුටින් සිහිපත් කරමි.

මෙම වැඩසටහන් සාර්ථකව නිමා කිරීම සඳහා උපදෙස් ලබාදුන් අතිගරු ජනාධිපති තුමාටත්, විෂය භාර අමාත්‍ය හා ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, මහ පෙන්වීම ලබාදුන් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍ය නිරෝෂන් පෙරේරා මැතිතුමාටත්, ජාතික තරුණ සේවා සභාවේ සමස්ථ කාර්ය මණ්ඩලයටත් මාගේ හදපිරි ස්තුතිය මෙයින් පුදකර සිටිමි.

නීතිඥ ඩබ්.ජී.එස්.එරන්දික,
සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික තරුණ සේවා සභාව.

පටුන


හැඳින්වීම........................................................................................................ III
අමාත්‍යාංශ ලේකම්තුමාගේ සුභපැතුම් පණිවිඩය........................................................ IX
සභාපති / අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සුභ පැතුම් පණිවිඩය.......................................... XI
වගු/ ප්‍රස්ථාර සහ පින්තූර........................................................................................ XIV
1. ජාතික තරුණ සේවා සභාව.................................................................................. 01
1.1 සභා අධ්‍යක්ෂ නාම ලේඛණය.............................................................................. 03
2. විගණක හා කළමනාකරණ කමිටුව - 2016......................................................... 04
3. ජාතික තරුණ සේවා සභාවේ ලැබීම් හා වියදම් පිලිබඳ විස්තර.............................. 05
4. සංවර්ධන ක්‍රියාකාරකම් - 2016.......................................................................... 10
4.1 තරුණ සංවිධාන හා සංවර්ධන වැඩසටහන්.......................................................... 10
4.2 ක්‍රීඩා සංවර්ධන ක්‍රියාකාරකම්............................................................................... 13
4.3 සෞන්දර්යය කුසලතා සංවර්ධනය........................................................................ 16
4.4 කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම්.............................................................. 17
4.5 ජාත්‍යන්තර තරුණ සබඳතා.................................................................................. 35
4.6 නිස්කෝ වීඩියෝ අංශය........................................................................................ 37
4.7 ආර්ථික ප්‍රවර්ධන හා ගොවිපල සංවර්ධන ක්‍රියාකාරකම්.......................................... 38
4.8 සැළසුම් හා සංවර්ධන අංශය............................................................................... 40
4.9 කාර්ය සාධන හා නිලධාරි ඇගයීම් අංශය............................................................. 40
4.10 විශේෂ ව්‍යාපෘති අංශය........................................................................................ 41
4.11 මාධ්‍ය අංශය........................................................................................................ 45
4.12 තොරතුරු තාක්ෂණ අංශය.................................................................................. 46
4.13 විභාග ඇගයීම් අංශය......................................................................................... 47
4.14 යෞවන තිළිණ අධිකාරිය..................................................................................... 47
4.15 තරුණ සමුපකාර හා ව්‍යාපාර සංවර්ධන අංශය...................................................... 49
5. පාලන අංශයේ ක්‍රියාකාරකම් - 2016................................................................... 49
5.1 ආයතනික කටයුතු................................................................................................ 49
5.2 සැපයුම් අංශය..................................................................................................... 54
5.3 ප්‍රවාහන ක්‍රියාකාරකම්........................................................................................ 54
5.4 ලේකම් අංශය...................................................................................................... 55
5.5 අභ්‍යන්තර විගණක අංශය.................................................................................... 55
5.6 නීති විමර්ශක ක්‍රියාකාරකම්................................................................................. 56
5.7 ඉදිකිරීම් හා නඩත්තු අංශය.................................................................................. 56
6. ස්වේච්ඡා වැඩසටහන්........................................................................................... 58
ආශ්‍රිත වාර්තා /ලේඛන............................................................................................ 61
ඇමුණුම් 1 විගණක කමිටු වාර්තාව........................................................................ 62
ඇමුණුම් 2 මූල්‍ය විගණක ප්‍රකාශය........................................................................ 63
ඇමුණුම් 3 විගණකාධිපති වාර්තාව........................................................................ 65

වගු, ප්‍රස්ථාර හා පින්තූර


වගුව 01 - ජාතික තරුණ සේවා සභාවේ 2016 වර්ෂයේ ප්‍රතිපාදන ලැබීම්.................................. 05
වගුව 02 - ජාතික තරුණ සේවා සභාවේ 2016 වර්ෂයේ ප්‍රතිපාදන ගෙවීම්................................ 06
වගුව 03 - ජාතික තරුණ සේවා සභාව වෙත තරුණ සංවර්ධන වැය සඳහා භාණ්ඩාගාරයෙන් සෘජු හා වක්‍ර ලෙස ප්‍රතිපාදන 2011 2016............................................................... 08
වගුව 04 - සංවර්ධන වැඩසටහන් වියදම් සාරාංශය.................................................................. 09
වගුව 05 - තරුණ සංවිධාන හා සංවර්ධන වැඩසටහන් .......................................................... 11
වගුව 06 - 2016 වර්ෂයේ යෞවන සමාජ ලියාපදිංචි වීම......................................................... 11
වගුව 07 - 28 වැනි ජාතික යෞවන ක්‍රීඩා උළෙල (නව තරඟ වාර්තාවන්)................................ 13
වගුව 08 - ක්‍රීඩා සංවර්ධන වැඩසටහන්...................................................................................... 14
වගුව 09 - කණ්ඩායම් තරඟ සහභාගීත්වය.................................................................................. 15
වගුව 10 - සෞන්දර්යය කුසලතා සංවර්ධන වැඩසටහන්........................................................ 16
වගුව 11 - කාර්මික වෘත්තීය පුහුණු අංශයේ ක්‍රියාත්මක වැඩසටහන්....................................... 17
වගුව 12 - 2016 වර්ෂය සඳහා පාඨමලා සඳහා බඳවා ගැනීම.................................................... 32
වගුව 13 - ජාත්‍යන්තර තරුණ සබඳතා අංශය විසින් 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කල වැඩසටහන්.......................................................................................... 35
වගුව 14 - කෘෂි අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්........................................... 39
වගුව 15 - විශේෂ ව්‍යාපෘති අංශය විසින් ක්‍රියාත්මක වැඩසටහන්.............................................. 45
වගුව 16 - නව බඳවා ගැනීම් (ස්ථිර)............................................................................................ 50
වගුව 17 - නව බඳවා ගැනීම් (අනියම්)........................................................................................ 50
වගුව 18 - නව බඳවා ගැනීම් (කොන්ත්‍රාත් පදනම මත)............................................................ 50
වගුව 19 - ද්විතීය පදනම මත බඳවා ගැනීම්.................................................................................. 50
වගුව 20 - උසස්වීම් ලබාදීම........................................................................................................... 50
වගුව 21 - විශ්‍රාම ගැන්වීම.............................................................................................................. 51
වගුව 22 - සේවයෙන් ඉල්ලා අස්වීම............................................................................................ 51
වගුව 23 - ධූරය අතහැර යාම........................................................................................................ 51
වගුව 24 - නැවත සේවයේ පිහිටුවීම.............................................................................................. 52
වගුව 25 - සේවය අවසන් කිරීම.................................................................................................... 52
වගුව 26 - වැඩ තහනම් කිරීම....................................................................................................... 52
වගුව 27 - සේවයෙන් ඉල්ලා අස්වීම............................................................................................ 52
වගුව 28 - සේවකයින් මියයාම..................................................................................................... 52
වගුව 29 - කාර්යක්ෂමතා කඩයිම් විභාග........................................................................................ 53
වගුව 30 - 2016 වර්ෂය පරිපාලන වියදම් ලැබී ඇති හා වියදම් වී ඇති ආකාරය........................ 53
වගුව 31 - 2016 වර්ෂයේ තරුණ සේවා සභාවේ මූල වියදම්.................................................... 54
වගුව 32 - ගොවිපල කාරක ගිණුම............................................................................................. 54
වගුව 33 - ප්‍රවාහන වියදම් ......................................................................................................... 54
වගුව 34 - 2016 වර්ෂයේ සභා රැස්වීම් පැවැත්වූ දිනයන්.......................................................... 55
වගුව 35 - සභා රැස්වීම් පැවැත්වීම සඳහා වියදම්..................................................................... 55
වගුව 36 - ජාතික තරුණ සේවා සභාවට එරෙහිව පවරා ඇති නඩු හා විභාග වෙමින් පවතින නඩු ............................................................................................................ 56
වගුව 37 - නෛතික ආයතන මඟින් පවත්වාගෙන යන පැමිණිලි............................................ 56

වගුව 38 - ඉදිකිරීම් හා නඩත්තු අංශය මඟින් 2016 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති...... 57
වගුව 39 - නිපුණතා අංශික සංවර්ධන වැඩසටහන් (SSDP)............................................. 57
වගුව 40 - ස්වේච්ඡා වැඩසටහන් ප්‍රගතිය............................................................................. 59

ප්‍රස්ථාර 01 - ජාතික තරුණ සේවා සභාවේ ප්‍රතිපාදන ලැබීම්............................................... 07
ප්‍රස්ථාර 02 - ජාතික තරුණ සේවා සභාවේ ප්‍රතිපාදන ගෙවීම් ............................................. 07
ප්‍රස්ථාර 03 - ජාතික තරුණ සේවා සභාව වෙත තරුණ සංවර්ධන වැය සඳහා භාණ්ඩාගාරයෙන් සෘජු හා වක්‍ර ලෙස කළ ප්‍රතිපාදන - 2016 ............................................................. 08
ප්‍රස්ථාර 04 - ලියාපදිංචි යෞවන සමාජ ප්‍රමාණය.................................................................. 12

පින්තූරය 01 - තරුණ සේවා රූපවාහිනී වොලිබෝල් තරගාවලියේ හා තෑගි ප්‍රදානය කිරීමේ අවස්ථාව ............................................................................................. 14
පින්තූරය 02 - 2016 ජාතික යෞවන සම්මාන තරගාවලියේ සම්මාන ප්‍රදානය........................... 16
පින්තූරය 03 - මෝටර් කාර්මික පාඨමාලාව.......................................................................... 31
පින්තූරය 04 - නිපෝන් මාරු නෞකා වැඩසටහනේ විශේෂ අවස්ථා......................................... 37
පින්තූරය 05 - නිස්කෝ වීඩියෝ අංශයේ ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන්.................. 38
පින්තූරය 06 - ආර්ථික ප්‍රවර්ධන හා ගොවිපළ සංවර්ධන අංශයේ ක්‍රියාකාරකම්.......................... 39
පින්තූරය 07 - සැළසුම් හා සංවර්ධන අංශයේ වැඩසටහන්වල විශේෂ අවස්ථා ........................... 40
පින්තූරය 08 - යොවුන්පුර වැඩසටහනේ කළමණාකරණ සහකාරවරුන්ගේ යෝග පුහුණුව........ 41
පින්තූරය 09 - යොවුන් පාර්ලිමේන්තු ඡායාරූප...................................................................... 42
පින්තූරය 10 - යොවුනපුරය සීගිරිය ඡායාරූප......................................................................... 43
පින්තූරය 11 - 2016 වර්ෂය තුළ ක්‍රියාත්මක ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති....................................... 43
පින්තූරය 12 - Youth With Talent Show 2016 අවස්ථා.............................................................. 44
පින්තූරය 13 - විශේෂ සංගීත කණ්ඩායමේ හා නර්තන කණ්ඩායමේ විශේෂ අවස්ථා................... 45
පින්තූරය 14 - කොළඹ දිස්ත්‍රික්කයේ මාධ්‍ය පාසලෙහි විශේෂ අවස්ථා....................................... 46
පින්තූරය 15 - විභාග හා වෘත්තීය ඇගයීම් අංශයේ ක්‍රියාකාරකම්වල විශේෂ අවස්ථා.................... 47
පින්තූරය 16 - නුගවෙල කඳවුරේ හා වටවන කනිටු විදුහලේ දැනුවත් කිරීම් වැඩසටහන............ 48

## ජාතික තරුණ සේවා සභාව

ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ පූර්ණ වර්ධනය සහතික කිරීමට හැකිවන පරිදි ඔවුන්ගේ ස්වාර්ථයන් ප්‍රවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති එකම රාජ්‍ය ආයතනය ජාතික තරුණ සේවා සභාව වේ.

*ජාතික තරුණ සේවා සභාව පිහිටුවීමට අදාළ පාර්ලිමේන්තු පනත් :-*

- 1967 වර්ෂයේ අංක 11 දරණ ස්වේච්ඡා ජාතික තරුණ සේවා පනත.
- 1968 වර්ෂයේ අංක 52 දරණ ස්වේච්ඡා ජාතික තරුණ සේවා (සංශෝධිත) පනත.
- 1969 ජනවාරි 23 වන දින අංක 14837/6 දරණ අතිවිශේෂ ගැසට් පත්‍ර මගින් පනතේ 26 වන ජේදයට අනුව රෙගුලාසි මාලාව ප්‍රකාශයට පත් කිරීම.
- 1979 වර්ෂයේ අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත.
- 1979 දෙසැම්බර් 20 වන දින අංක 67/09 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 1967 අංක 11 දරණ ස්වේච්ඡා ජාතික තරුණ සේවා (සංශෝධන) පනත අහෝසි කිරීම හා 1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත ක්‍රියාත්මක කරන දිනය ප්‍රකාශයට පත් කිරීම.
- 1980 ජනවාරි මස 02 වන දින අංක 69/09 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනතේ 34 වන වගන්තිය යටතේ රෙගුලාසි මාලාව ප්‍රකාශයට පත්කිරීම.
- 1986 මාර්තු මස 10 වන දින අංක 392/05 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 1979 ජාතික තරුණ සේවා පනතේ 34 වන වගන්තිය යටතේ 1986 අංක 01 දරණ ජාතික තරුණ සේවා නියෝග ප්‍රකාශයට පත් කිරීම.
- 1990 පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය ජාතික තරුණ සේවා සභාවට අන්තර්ග්‍රහණය කිරීම.
- 2011 වසරේ ශ්‍රී ලංකා යූත් සංකල්පය ආරම්භ වීම.

1978 වසරේ යෞවන කටයුතු හා රැකී රක්ෂා අමාත්‍යාංශය පිහිටුවීමත් සමග සම්මත වූ 1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත යටතේ ජාතික තරුණ සේවා සභාවට පෙරට වඩා පුළුල් බලතල සහිතව තරුණ සංවර්ධන කටයුතු වල නියැලීමට අවකාශය ලැබුණි.

# සංවිධාන ව්‍යුහය



## සභා අධ්‍යක්ෂ මණ්ඩලය නාමලේඛණය

| අනු අංකය | නම | තනතුර | පත් වූ දිනය |
|---|---|---|---|
| 01 | නීතිඥ ඩබ්.ජී.එස්.එරන්දික මහතා | සභාපති/අධ්‍යක්ෂ ජනරාල් | 2015.02.02 |
| 02 | එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී.බණ්ඩාර මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015.12.07 - 2016.09.26 දක්වා |
| 03 | අශෝකා අලවත්ත මහත්මිය | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015.03.15 |
| 04 | ජී.එල්.එස්.සේනාධීර මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015.12.28 - 2016.08.26 දක්වා |
| 05 | සුමිත් සුරවීර මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2016.12.08 |
| 06 | සී.එච්.එස්.දන්ගල්ල මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015.03.10 |
| 07 | නීතිඥ දසුන් නාගස්හේන මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015.03.15 |
| 08 | නීතිඥ මදුර ප්‍රියභාෂන වෙල්ගම මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015.03.15 |
| 09 | නීතිඥ එච්.එම්.සුදර්ශී භාග්‍යා කරුණාරත්න මහත්මිය | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015.03.15 |
| 10 | පුන්සඳ විජයකුමාර මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015.03.15 |
| 11 | චමින්ද තල්ගස්වත්ත මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015.03.15 |
| 12 | රවී ක්‍රිෂාන් ජයවර්ධන මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015.03.15 |
| 13 | බෙන් රජිත ෂ්‍යාමල් ගුණවර්ධන මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015.03.15 |
| 14 | නිලුක කරුණාරත්න මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015.03.15 |
| 15 | ආදිල් බාකීර් මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015.03.15 - 2016.07.29 දක්වා |
| 16 | ඩබ්.බුද්ධික ලක්මාල් ගුණසේකර මහතා | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015.03.15 |
| 17 | නිරෝෂා විරාජිණී මහත්මිය | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015.03.15 |
| 18 | නිපුණා සාරංගි ගුණරත්න මෙනවිය | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015.03.15 |
| 19 | වී.එච්.එච්.සඳරුවනි මහත්මිය | සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 2015.04.28 |

**විගණන හා කළමනාකරණ කමිටුව - 2016**

- සී.එච්.එස්.දන්ගල්ල මහතා - සභාපති
  සහකාර අධ්‍යක්ෂ
  රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

- නීතිඥ දසුන් නාගස්සේන මහතා - සාමාජික
  සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

- නිපුණා සාරංගි ගුණරත්න මෙනවිය - නිරීක්ෂක
  ප්‍රධාන අභ්‍යන්තර විගණක
  ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

- එම්.ඒ.එස්.පුෂ්පරාණි මහත්මිය - ආරාධිත
  විගණන අධිකාරි
  රජයේ විගණන අංශය

## ජාතික තරුණ සේවා සභාවේ ලැබීම් හා වියදම් පිලිබඳ විස්තර

වගුව 1 - ජාතික තරුණ සේවා සභාවේ 2016 වර්ෂයේ ප්‍රතිපාදන ලැබීම්

| | | 2016 |
|---|---|---|
| භාණ්ඩාගාර | | |
| | පුනරාවර්තන | 849,999,400 |
| | සංවර්ධන | 286,038,490 |
| | ප්‍රාග්ධන | 180,767,581 |
| **භාණ්ඩාගාර** | | 1,316,805,471 |
| අමාත්‍යාංශ | | |
| | පුනරාවර්තන | 374,860,622 |
| | ප්‍රාග්ධන | 732,504 |
| **අමාත්‍යාංශ** | | 375,593,126 |
| විමධ්‍යගත | | |
| | පුනරාවර්තන | 197,731 |
| **විමධ්‍යගත** | | 197,731 |
| විදේශ සංවිධාන | | |
| | පුනරාවර්තන | 14,533,846 |
| | ප්‍රාග්ධන | 166,144,813 |
| **විදේශ සංවිධාන** | | 180,678,659 |
| අභ්‍යන්තර ඉපයීම් | | |
| | | 201,730,654 |
| **අභ්‍යන්තර ඉපයීම්** | | 201,730,654 |
| | එකතුව | 2,075,005,641 |

වගුව 2 - ජාතික තරුණ සේවා සභාවේ 2016 වර්ෂයේ ප්‍රතිපාදන ගෙවීම්

| | | 2016 |
|---|---|---|
| භාණ්ඩාගාර | | |
| | පුනරාවර්තන | 1,014,397,607 |
| | සංවර්ධන | 272,457,576 |
| | ප්‍රාග්ධන | 180,767,581 |
| **භාණ්ඩාගාර** | | 1,467,622,764 |
| අමාත්‍යාංශ | | |
| | පුනරාවර්තන | 374,860,622 |
| | ප්‍රාග්ධන | 732,504 |
| **අමාත්‍යාංශ** | | 375,593,126 |
| විමධ්‍යගත | | |
| | පුනරාවර්තන | 197,731 |
| **විමධ්‍යගත** | | 197,731 |
| විදේශ සංවිධාන | | |
| | පුනරාවර්තන | 14,533,846 |
| | ප්‍රාග්ධන | 166,144,813 |
| **විදේශ සංවිධාන** | | 180,678,659 |
| අභ්‍යන්තර ඉපයීම් | | |
| | සංවර්ධන | 121,169,763 |
| | ප්‍රාග්ධන | 7,528,438 |
| **අභ්‍යන්තර ඉපයීම්** | | 128,698,201 |
| | එකතුව | 2,152,790,481 |

ප්‍රස්ථාර 1 - ජාතික තරුණ සේවා සභාවේ 2016 වර්ෂයේ ප්‍රතිපාදන ලැබීම්




ප්‍රස්ථාර 2 - ජාතික තරුණ සේවා සභාවේ 2016 වර්ෂයේ ප්‍රතිපාදන ලැබීම්



වගුව 3 - ජාතික තරුණ සේවා සභාව වෙත භාණ්ඩාගාරය, අභ්‍යන්තර ඉපයීම් සහ වෙනත් බාහිර ආයතන මඟින් සෘජු හා වක්‍ර ලෙස ප්‍රතිපාදන වලින් දරණ ලද පරිපාලන හා සංවර්ධන වියදම් (රුපියල් මිලියන) 2011 – 2016

| ප්‍රතිපාදන | වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
| සංවර්ධන | 458 | 551 | 716 | 857 | 602 | 602 |
| පරිපාලන | 607 | 630 | 745 | 795 | 1014 | 1014 |

ප්‍රස්ථාර 3 - ජාතික තරුණ සේවා සභාව වෙත භාණ්ඩාගාරය, අභ්‍යන්තර ඉපයීම් සහ වෙනත් බාහිර ආයතන මඟින් සෘජු හා වක්‍ර ලෙස ප්‍රතිපාදන වලින් දරණ ලද පරිපාලන හා සංවර්ධන වියදම් (රුපියල් මිලියන) 2011 – 2016



වගුව 4 - සංවර්ධන වැඩසටහන් වියදම් සාරාංශය

| අනු අංකය | වැඩසටහන | වෙන්කල මුදල රුපියල් | | වැය කල මුදල රුපියල් | |
|---|---|---|---|---|---|
| | | භාණ්ඩාගාර | අමාත්‍යාංශ | භාණ්ඩාගාර | අමාත්‍යාංශ |
| 01. | සෞන්දර්යය කුසලතා සංවර්ධන වැඩසටහන් | 47,000,000.00 | - | 45,827,371.71 | - |
| 02. | ජාත්‍යන්තර තරුණ සබඳතා ක්‍රියාකාරකම් | 25,000,000.00 | - | 25,565,722.96 | - |
| 03. | තරුණ සංවිධාන හා සංවර්ධන වැඩසටහන් | 24,000,000.00 | - | 23,921,547.93 | - |
| 04. | යෞවන තිළිණ අධිකාරිය ක්‍රියාකාරකම් | 4,000,000.00 | - | 3,910,347.69 | - |
| 05. | ක්‍රීඩා සංවර්ධන ක්‍රියාකාරකම් | 99,000,000.00 | - | 98,997,944.91 | - |
| 06. | කාර්මික හා වෘත්තිය පුහුණු ක්‍රියාකාරකම් | 55,000,000.00 | - | 54,981,737.44 | - |
| 07. | තරුණ සමූපකාර හා ව්‍යාපාර සහ සංවර්ධන ක්‍රියාකාරකම් | 5,000,000.00 | - | 4,971,775.40 | - |
| 08. | ආර්ථික ප්‍රවර්ධන හා ගොවිපල ක්‍රියාකාරකම් | 15,000,000.00 | - | 14,756,664.12 | - |
| 09. | මාධ්‍ය ක්‍රියාකාරකම් | 10,000,000.00 | - | 10,524,288.09 | - |
| 10. | නිස්කෝ වීඩියෝ ක්‍රියාකාරකම් | 5,000,000.00 | - | 4,992,500.77 | - |
| 11. | සැලසුම් හා සංවර්ධන ක්‍රියාකාරකම් | 7,000,000.00 | - | 3,189,509.20 | - |
| 12. | තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරකම් | 5,000,000.00 | - | 3,248,650.00 | - |
| 13. | කාර්ය සාධන හා නිලධාරි ඇගයීම් ක්‍රියාකාරකම් | 9,000,000.00 | - | 8,196,637.61 | - |
| 14. | ඉදිකිරීම් ක්‍රියාකාරකම් | 125,000,000.00 | - | 123,800,000.00 | - |
| 15. | සැපයුම් ක්‍රියාකාරකම් | 40,000,000.00 | - | 39,455,000.00 | - |
| 16. | විශේෂ ව්‍යාපෘති ක්‍රියාකාරකම් | - | 400,000,000.00 | - | 374,991,268.75 |
| | එකතුව | 475,000,000.00 | 400,000,000.00 | 466,339,697.83 | 374,991,268.75 |

## 4. සංවර්ධන ක්‍රියාකාරකම් - 2016

ජාතික තරුණ සේවා සභාව මඟින් 2016 වර්ෂයේදී තරුණ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන අංශ මඟින් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් පිලිබඳ තොරතුරු පහත දක්වා ඇත.

### 4.1 තරුණ සංවිධාන හා සංවර්ධන වැඩසටහන්

ජාතික තරුණ සේවා සභාව මගින් දිවයින පුරා ව්‍යාප්ත කර ඇති තරුණ සංවිධාන ජාලය යෞවන සමාජ ව්‍යාපාරය වේ. ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා තරුණ තරුණියන් ඒකරාශී කර විවිධ ප්‍රජා සංවර්ධන කටයුතු මේ මගින් ඉටු කෙරේ.

- පිහිටුවනු ලබන තරුණ සංවිධාන, සංවර්ධනය සඳහා වැඩසටහන් සැළසුම් කර ඒ සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ජාත්‍යන්තර සංවිධාන සමග අරමුදල් සම්පාදනය පිණිස සම්බන්ධීකරණය කිරීම.

- තරුණ සංවර්ධන වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික්කයන් වෙත යොමු කරමින් ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනය සමග ඒකාබද්ධව ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් අතර සම්බන්ධීකරණය.

- මීට අමතරව ජාතික වශයෙන් පිහිටුවා ඇති තරුණ සිවිල් සංවිධාන සඳහා තාක්ෂණික සහයෝගය මග පෙන්වීම ලබාදීම හා එම සංවිධාන නියාමන යාන්ත්‍රණයක් සැකසීම අංශය මගින් සිදු කෙරේ.

- පාසලින් වැඩ ලොවට සංක්‍රමණය වන තරුණ පිරිස් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය ලබාදීම හා වැඩලොව අපේක්ෂාවන් ලගා කර ගත හැකි වන සේ තාක්ෂණික මග පෙන්වීම ලබාදීම.

- ලංකාවේ තරුණ පිරිස් වෘත්තීය මග පෙන්වීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශනය තොරතුරු හා ආයතනික සමානත්මතාවය ලබාදීම හා දිස්ත්‍රික් මට්ටමින් වෘත්තීය මාර්ගෝපදේශනය ලබාදීම.

- දෙමාපියන් ප්‍රතිපත්ති සැළසුම් කරන්නන් හා රැකියා ලබාදෙන ආයතන ආශ්‍රිත සම්බන්ධීකරණය කිරීම හා තරුණ පිරිස් ඔවුන් සමග සම්බන්ධ කිරීම.

- තරුණ තරුණියන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය රැකියා බැංකු මධ්‍යස්ථාන 21 ක් පවත්වාගෙන යාම තුළින් වෘත්තීය මාර්ගෝපදේශන සේවා සැපයීම, කායික හා මානසික වෘත්තීය, පවුල්, ලිංගික හා අධ්‍යාපනික ආදී ගැටළු වලට ලක් වී ඇති තරුණ තරුණියන්ට මනෝවිද්‍යාත්මක උපදේශන ලබාදීම.

- පෞද්ගලික අංශයේ රැකියා පුරප්පාඩු සොයා බලා එම ආයතන වලට තරුණ තරුණියන් රැකියාගත කිරීම.

වගුව 5 - තරුණ සංවිධාන හා සංවර්ධන වැඩසටහන්

| අනු අංකය | වැඩසටහනේ නම | වැඩසටහන් ප්‍රමාණය | තරුණ සහභාගිත්වය |
|---|---|---|---|
| 01 | 2016 HOPE වැඩසටහන | | |
| | A. යෞවන සමාජ පිහිටුවීම | 3000 | 148000 |
| | B. යෞවන සමාජ ප්‍රතිසංවිධානය කිරීම | 9775 | 250687 |
| | C. දැනුවත් කිරීමේ වැඩසටහන් | 334 | 23380 |
| | D. ප්‍රාදේශිය මණ්ඩල පිහිටුවීම | 334 | 30700 |
| | E. දිස්ත්‍රික් මණ්ඩල පිහිටුවීම | 26 | 3150 |
| | F. ජාතික මණ්ඩල නියෝජිත පුහුණුව | 01 | 52 |
| 02 | ජාතික තරුණ දිනය | 307 | 10731 |
| 03 | i. වෘත්තීය මාර්ගෝපදේශනය හා රැකියා බැංකුව | | |
| | ► දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම | | |
| | අ. පුහුණු මධ්‍යස්ථාන | 72 | 5393 |
| | ආ. පාසැල් ශිෂ්‍යයන් | 51 | 3500 |
| | ඇ. පාසැල් හැරගිය තරුණයන් | 121 | 8436 |
| | ඈ. දෙමාපියන් | 52 | 2898 |
| | ii.“සහතිකයයි රැකියාවයි” රැකියා වෙළඳපොල | 18 | 12800 |
| | iii.“යොවුන් මිතුරෝ” උපදේශන මධ්‍යස්ථාන සංවර්ධනය | 01 | - |
| | iv. උපදේශන මධ්‍යස්ථාන සංවර්ධනය | 06 | 7742 |

වගුව 6 - 2016 වර්ෂයේ යෞවන සමාජ ලියාපදිංචි වීම.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශිය මණ්ඩල ප්‍රමාණය | ග්‍රාම නිලධාරි වසම් ප්‍රමාණය | සාමාජික සංඛ්‍යාව | ලියාපදිංචි යෞවන සමාජ ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 01 | කොළඹ | 08 | 454 | 8152 | 354 |
| 02 | කොළඹ 1 | 08 | 103 | 3316 | 125 |
| 03 | ගම්පහ | 13 | 1177 | 22715 | 1049 |
| 04 | කළුතර | 14 | 762 | 19661 | 699 |
| 05 | ගාල්ල | 19 | 895 | 17151 | 792 |
| 06 | මාතර | 16 | 650 | 16589 | 633 |
| 07 | හම්බන්තොට | 12 | 576 | 12968 | 537 |
| 08 | මහනුවර | 20 | 1188 | 33311 | 1129 |
| 09 | මාතලේ | 11 | 545 | 11742 | 470 |
| 10 | නුවරඑළිය | 05 | 491 | 16804 | 508 |
| 11 | මොණරාගල | 11 | 319 | 7746 | 301 |
| 12 | බදුල්ල | 15 | 567 | 19649 | 520 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 13 | කෑගල්ල | 11 | 573 | 14220 | 567 |
| 14 | රත්නපුර | 17 | 575 | 18319 | 541 |
| 15 | කුරුණෑගල | 30 | 1610 | 30700 | 1405 |
| 16 | පුත්තලම | 16 | 548 | 12036 | 436 |
| 17 | අනුරාධපුර | 22 | 694 | 18572 | 705 |
| 18 | පොලොන්නරුව | 07 | 295 | 6178 | 263 |
| 19 | ත්‍රිකුණාමලය | 11 | 230 | 9291 | 252 |
| 20 | මඩකලපුව | 14 | 346 | 24743 | 369 |
| 21 | අම්පාර | 20 | 503 | 18583 | 481 |
| 22 | වව්නියාව | 04 | 102 | 4027 | 99 |
| 23 | මන්නාරම | 05 | 153 | 6118 | 171 |
| 24 | කිලිනොච්චිය | 04 | 95 | 8827 | 91 |
| 25 | මුලතිව් | 06 | 127 | 5504 | 130 |
| 26 | යාපනය | 15 | 435 | 12645 | 426 |
| එකතුව | | 334 | 14013 | 379567 | 13053 |

ප්‍රස්ථාර 4 - ලියාපදිංචි යෞවන සමාජ ප්‍රමාණය.



## 4.2 ක්‍රීඩා සංවර්ධන ක්‍රියාකාරකම්

ජාතික තරුණ සේවා සභාවේ ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් අතර, ශ්‍රී ලාංකේය තරුණ ප්‍රජාවේ කායික හා මානසික සෞඛ්‍ය නංවාලීම උදෙසා ඔවුන් තුළ ඇත්තා වූ ක්‍රීඩා කුසලතාවයන් වර්ධනය කිරීම සඳහා විවිධ වැඩසටහන් සංවිධාන කොට ක්‍රියාත්මක කරනු ලබන ප්‍රබල අංශයක් ලෙස ක්‍රීඩා සංවර්ධන අංශය හඳුන්වාදිය හැක.

ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා විවිධ තලයන් තුළදී කාලීන අවශ්‍යතාවය හඳුනාගනිමින් වාර්ෂිකව වැඩ සැළැස්මට අනුකූලව විවිධ ක්‍රීඩා වැඩසටහන් අංශය මගින් සංවිධානය කොට ක්‍රියාත්මක කරනු ලැබේ.

- ජාතික යෞවන ක්‍රීඩා උළෙල.
- තරුණ සේවා රූපවාහිනී වොලිබෝල් තරඟාවලිය.
- තරුණ සේවා ක්‍රීඩා සමාජ වැඩසටහන.
- හෙයියන්තුඩුව විශේෂ ක්‍රීඩා කණ්ඩායම.

වගුව 7 – 28 වැනි ජාතික යෞවන ක්‍රීඩා උළෙල - නව තරඟ වාර්තාවන්.

| තරග අංශය | ක්‍රීඩක/ක්‍රීඩිකා ගේ නම | දිස්ත්‍රික්කය | නව තරග වාර්තාව |
|---|---|---|---|
| 20 න් පහළ පිරිමි | | | |
| යගුලිය දැමීම | ඩබ්.එම්.ඒ.එම්.මදුශංක | පුත්තලම | 16.13 (මීටර්) |
| 100x4 සහය දිවීම | | මහනුවර දිස්ත්‍රික් කණ්ඩායම හා මාතර දිස්ත්‍රික් කණ්ඩායම | 42.6 (තත්පර) |
| 1500 මීටර් | එල්.සී.ගුණරත්න | මහනුවර | 4:03.5 (තත්පර) |
| 100x4 සහය දිවීම | | මහනුවර දිස්ත්‍රික් කණ්ඩායම | 3:18.0 (තත්පර) |
| 20 න් පහල කාන්තා | | | |
| 400 මීටර් | ඩී.එම්.වයි.දුලංජලී | නුවරඑළිය | 56.5 (තත්පර) |
| 20 න් ඉහල කාන්තා | | | |
| 100 මීටර් | එස්.එල්.විදානදුරගේ | බදුල්ල | 11.9 (තත්පර) |

වගුව 8 - ක්‍රීඩා සංවර්ධන වැඩසටහන්

| අනු අංකය | වැඩසටහනේ නම | වැඩසටහන් ප්‍රමාණය | තරුණ සහභාගීත්වය |
|---|---|---|---|
| 01 | 28 වන ජාතික යෞවන ක්‍රීඩා උළෙල | | |
| | I. ප්‍රාදේශිය මට්ටම | 334 | 240277 |
| | II. දිස්ත්‍රික් මට්ටම | 26 | 25806 |
| | III. ජාතික මට්ටම | 01 | 1523 |
| 02 | ජාතික සංචිත | | |
| | I. වොලිබෝල් | 01 | 35 |
| | II. කබඩි | | 13 |
| | III. ජූඩෝ | | 15 |
| 03 | මහරගම ක්‍රීඩා සමාජය | 14 | 1280 |
| 04 | තරුණ සේවා රූපවාහිනි වොලිබෝල් තරඟාවලිය | | |
| | I. දිස්ත්‍රික් මට්ටම | 26 | 12428 |
| | II. ජාතික මට්ටම | 01 | 839 |

පින්තූරය 01 - තරුණ සේවා රූපවාහිනී වොලිබෝල් තරඟාවලියේ හා තෑගි ප්‍රදානය කිරීමේ අවස්ථාව.





වගුව 09 - කණ්ඩායම් තරඟ සහභාගීත්වය.

| දිස්ත්‍රික් අංකය | දිස්ත්‍රික්කය | නෙට් බෝල් | | වොලි බෝල් | | එල්ලේ | | කඹ ඇදීම | | බාස්කට් බෝල් | | කබඩි | | බීච් වොලි බෝල් | | ක්‍රිකට් | | කැරම් | | | | පාපන්දු | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | තනි | | යුගල | | | |
| | | කාන්තා | පුරුෂ | කාන්තා | පුරුෂ | කාන්තා | පුරුෂ | කාන්තා | පුරුෂ | කාන්තා | පුරුෂ | කාන්තා | පුරුෂ | කාන්තා | පුරුෂ | කාන්තා | පුරුෂ | කාන්තා | පුරුෂ | කාන්තා | පුරුෂ | පුරුෂ | |
| 1 | කොළඹ | - | 7 | 6 | 9 | 18 | 18 | - | 9 | - | - | 6 | 5 | 2 | 2 | 6 | 13 | 1 | 1 | 2 | 2 | - | 107 |
| 2 | කොළඹ 1 | - | - | 7 | 12 | 20 | 18 | 10 | 9 | - | 11 | 7 | 8 | 2 | 2 | 7 | 9 | 1 | 1 | 2 | 2 | 16 | 144 |
| 3 | කළුතර | 11 | 11 | 9 | 10 | - | 18 | 6 | 10 | - | - | - | - | - | 2 | 8 | 14 | 1 | 1 | 2 | 2 | 15 | 120 |
| 4 | ගම්පහ | 11 | 12 | - | 11 | 19 | 19 | 10 | 9 | 7 | 12 | 9 | 9 | 2 | 2 | 8 | 13 | - | 1 | 2 | 2 | 15 | 173 |
| 5 | ගාල්ල | 11 | 9 | - | 10 | 16 | 20 | 9 | 9 | 9 | 9 | 11 | 11 | - | 2 | 8 | 14 | 1 | - | 2 | -2 | 14 | 165 |
| 6 | මාතර | 8 | 11 | 9 | 6 | 17 | 17 | - | 8 | - | 8 | 8 | 9 | - | - | 6 | 10 | 1 | - | 2 | - | 12 | 134 |
| 7 | හම්බන්තොට | - | - | 8 | 9 | 16 | 20 | 9 | 8 | - | - | 12 | 8 | 2 | 2 | 6 | 12 | - | 1 | - | - | 7 | 120 |
| 8 | රත්නපුර | 7 | 8 | - | - | 19 | 18 | - | - | - | - | 8 | 8 | - | - | 8 | 10 | 1 | - | - | - | - | 87 |
| 9 | කෑගල්ල | 11 | 11 | 12 | 12 | 16 | 19 | 10 | 10 | - | 8 | - | 11 | - | 2 | 6 | 12 | 1 | 1 | 2 | 2 | 16 | 160 |
| 10 | මාතලේ | - | 9 | 9 | 12 | 15 | 18 | - | 10 | - | 5 | - | - | - | - | 7 | 12 | 1 | 1 | 2 | 2 | 15 | 118 |
| 11 | මහනුවර | 10 | 12 | 7 | 7 | 17 | 19 | - | 10 | - | - | 9 | 10 | - | - | 5 | 13 | 1 | 1 | 2 | 2 | 14 | 139 |
| 12 | නුවරඑළිය | 11 | - | 11 | 11 | 15 | 18 | - | 7 | - | - | 11 | 11 | - | - | 7 | 13 | 1 | - | 2 | 2 | 14 | 134 |
| 13 | බදුල්ල | 10 | - | 12 | 7 | 17 | 18 | 8 | 10 | - | - | 11 | 12 | - | 2 | 8 | 13 | 1 | 1 | 2 | - | 16 | 150 |
| 14 | මොණරාගල | 8 | 9 | 11 | 10 | 20 | 18 | - | - | - | - | 12 | 9 | 2 | - | 8 | 13 | - | - | - | 2 | 14 | 134 |
| 15 | කුරුණෑගල | - | 10 | 10 | 7 | 17 | 19 | 10 | 10 | - | 8 | 9 | 9 | 2 | 2 | 8 | 14 | 1 | 1 | 2 | 2 | 13 | 154 |
| 16 | පුත්තලම | 9 | 11 | 9 | 10 | 20 | 20 | - | - | - | 12 | - | 11 | 2 | 2 | 8 | 14 | 1 | 1 | 2 | 2 | - | 134 |
| 17 | අනුරාධපුරය | 11 | 12 | 9 | 11 | - | 19 | - | - | - | - | 10 | 10 | - | - | 8 | 14 | - | 1 | - | 2 | 15 | 122 |
| 18 | පොළොන්නරුව | 12 | 12 | - | 11 | - | - | - | - | 11 | - | - | - | - | 2 | 8 | 13 | - | 1 | - | 2 | 14 | 86 |
| 19 | අම්පාර | 12 | 12 | 7 | 8 | 19 | 20 | 7 | 10 | 12 | 11 | 12 | 12 | 2 | - | - | 13 | - | 1 | - | 2 | 15 | 175 |
| 20 | මඩකළපුව | 11 | - | 9 | 11 | 20 | 18 | 8 | 10 | 11 | 7 | 11 | - | 2 | 2 | 8 | 13 | 1 | 1 | 2 | 2 | 15 | 162 |
| 21 | ත්‍රිකුණාමලය | - | - | - | 9 | 18 | 20 | 10 | 10 | - | 12 | - | 11 | 2 | 2 | 8 | 13 | - | 1 | - | 2 | 15 | 133 |
| 22 | මන්නාරම | - | - | - | 10 | 11 | 18 | 10 | 10 | - | 7 | 12 | 12 | - | - | 7 | 13 | 1 | 1 | - | 2 | 15 | 129 |
| 23 | වව්නියාව | - | - | - | 7 | 20 | 20 | - | 9 | - | 8 | 8 | 10 | - | - | - | 11 | 1 | 1 | 2 | 2 | 15 | 114 |
| 24 | යාපනය | 12 | 12 | 9 | 10 | 19 | 17 | 10 | 8 | 11 | 12 | 9 | 12 | - | 2 | 7 | 14 | 1 | 1 | 2 | 2 | 16 | 186 |
| 25 | කිළිනොච්චිය | 11 | 9 | 11 | 9 | 16 | 16 | 10 | 10 | - | - | 11 | 11 | 2 | 2 | 7 | 14 | 1 | 1 | 2 | 2 | 14 | 159 |
| 26 | මුලතිව් | 12 | 9 | 7 | 10 | 20 | 20 | 10 | 10 | 12 | 10 | 11 | 8 | - | - | 8 | 12 | - | 1 | 2 | 2 | 14 | 178 |
| | එකතුව | 188 | 186 | 172 | 239 | 405 | 465 | 137 | 196 | 73 | 140 | 197 | 217 | 22 | 30 | 175 | 329 | 18 | 21 | 36 | 42 | 329 | 3617 |

## 4.3 සෞන්දර්ය කුසලතා සංවර්ධනය

තරුණ තරුණියන්ගේ නර්ථන, සංගීත, නාට්‍යමය ඇතුළු සෞන්දර්ය කුසලතා සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම මෙම අංශයේ කාර්යභාර්ය වේ.

වගුව 10 - සෞන්දර්ය කුසලතා සංවර්ධන වැඩසටහන්

| අනු අංකය | වැඩසටහනේ නම | වැඩසටහන් ප්‍රමාණය | තරුණ සහභාගිත්වය |
|---|---|---|---|
| 01 | යෞවන සම්මාන තරඟාවලිය | | |
| | • දිස්ත්‍රික් තරඟ | 26 | 5391 |
| | • ජාතික තරඟ | 01 | 1481 |
| | • ජාතික යෞවන සම්මාන තරඟාවලිය | 01 | 500 |
| 02 | යූත් නාට්‍ය තරඟාවලිය | 08 | 5020 |
| 03 | සෞන්දර්ය පුහුණු මධ්‍යස්ථාන | 03 | 244 |
| 04 | ඩිප්ලෝමා නාට්‍ය වැඩසටහන | 01 | 30 |
| 05 | විවිධ සංස්කෘතික වැඩසටහන් | 07 | 8325 |

පින්තූරය 2 – 2016 ජාතික යෞවන සම්මාන තරඟාවලියේ සම්මාන ප්‍රදානය හා විශේෂ අවස්ථාවන් කිහිපයක්.





## 4.4 කාර්මික හා වෘත්තිය පුහුණු ක්‍රියාකාරකම්

**ජාතික තරුණ සේවා සභාව මගින් පවත්වාගෙන යනු ලබන සියළුම වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන තත්ව කළමනාකරණ සහතිකය ලත් පුහුණු මධ්‍යස්ථාන බවට පරිවර්තනය කරමින් දේශීය හා විදේශීය නිපුණතා සම්මතයන්ට අනුව පුහුණුව ලබා දෙමින් ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය ලත් පුහුණු ශ්‍රමිකයන් බිහි කිරීම.**

වගුව 11 - 2016 වර්ෂයේ ජාතික තරුණ සේවා සභාව විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිලිබඳ තොරතුරු.

| අනු අංකය | වැඩසටහනේ නම | වැඩසටහන් ප්‍රමාණය | තරුණ සහභාගිත්වය |
|---|---|---|---|
| 01 | රැකියා අභිමුඛ පාඨමාලා සංවර්ධනය | | |
| | • පූර්ණ කාලීන පාඨමාලා | 51 | 1101 |
| | • අර්ධ කාලින පාඨමාලා | 673 | 18489 |
| 02 | රූම් ඇටෙන්ඩන් පාඨමාලාව | 02 | 35 |
| 03 | උද්‍යාන අලංකරණ පාඨමාලාව | 01 | 09 |

**මධ්‍යස්ථානය :- මහරගම පුහුණු මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| වෘත්තිය ඉංග්‍රීසි | විදුලි කාර්මික ශිල්පි |
| ඉංග්‍රීසි ඩිප්ලෝමා | මෝටර් කාර්මික ශිල්පි |
| උසස් ඉංග්‍රීසි ඩිප්ලෝමා | වායු සමීකරණ හා ශිතකරණ අළුත්වැඩියා |
| ලේකම් පරිචය | රේඩියෝ ටීවී අළුත්වැඩියාව |
| රූපලාවන්‍ය ශිල්පි | තොරතුරු තාක්ෂණ ශිල්පය හා සන්නිවේදනය |
| කොන්ඩා මෝස්තර ශිල්පි | පෙර පාසැල් ගුරු පුහුණුව |
| බේකරි ශිල්පී | පරිගණක චිත්‍රක |
| වෘත්තිය සූපශාස්ත්‍ර | |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| දෙමළ භාෂාව | පතරොම් රහිත ඇඳුම් මැසිම |
| ඉංග්‍රීසි ඩිප්ලෝමා | වෘත්තිය සූප ශාස්ත්‍ර |
| ජපන් භාෂාව | පරිඝණක දෘඩාංග |
| කොරියන් භාෂාව | වායු සමීකරණ හා ශිතකරණ අළුත්වැඩියා |
| වෘත්තිය ඉංග්‍රීසි | රේඩියෝ ටීවී අළුත්වැඩියාව |
| කේක් හා කේක් ආකෘති | විදුලි කාර්මික |
| ජන සංනිවේදනය | බේකරි ශිල්පී |

| | |
|---|---|
| රූපලාවන්‍ය ශිල්පි | පරිගණක යෙදවුම් සහායක |
| කොන්ඩා මෝස්තර ශිල්පි | මෝටර් කාර්මික ශිල්පි |
| මානව සම්පත් කළමනාකරණය | |

**මධ්‍යස්ථානය :- ජිනරතන මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| මෝටර් කාර්මික ශිල්පි | ත්‍රිරෝද රථ අළුත්වැඩියාව |
| යතුරු පැදි කාර්මික ශිල්පි | විදුලි කාර්මික |
| වාහන වායුසමීකරණ කාර්මික ශිල්පි | |

**මධ්‍යස්ථානය :- රත්මලාන**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිඝණක වැඩසටහන් | ප්‍රමාණ හා මිණුම්කරණය |
| තොරතුරු තාක්ෂණය ජාතික සහතික පත්‍ර පාඨමාලාව | රූපලාවන්‍ය ශිල්පී |
| පරිඝණක යෙදවුම් සහයක | පෙර පාසැල් ගුරු පුහුණුව |
| පරිඝණක චිත්‍රක | වායු සමන හා ශිතකරණ අළුත්වැඩියා ශිල්පි |
| පරිඝණක ත්‍රිමාණකරණය | වාහන විදුලි කාර්මික |
| පරිඝණක ගත විඩියෝ සංස්කරණය හා ත්‍රිමාණ සංස්කරණය | ඉදිකිරීම් අධීක්ෂණය |
| පරිඝණක දෘඩාංග | කොණ්ඩා මෝස්තර |
| පරිඝණක ජාල පරිපාලනය | ඉංග්‍රීසි |
| සැළසුම් ශිල්පී | |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| වෙබ් අඩවි සංවර්ධනය | මෝටර් එතීම |
| පරිඝණක කාර්යාල | මෝටර් පාලන |
| පරිඝණක වැඩසටහන් | වාහන විදුලි කාර්මික |
| පරිඝණක මුද්‍රණ හා ග්‍රැෆික් නිර්මාණ | පැස්සුම් ශිල්පී |
| වෙබ් අඩවි සංවර්ධනය | ටිග් වෙල්ඩින් ශිල්පී |
| පරිඝණක ආශ්‍රිත ගිණුම්කරණය | විද්‍යුත් තාක්ෂණික ඉංජිනේරු ශිල්පී |
| පරිගණක ගත නිර්රේඛිය වීඩියෝ සංස්කරණය හා ත්‍රිමාණ සජිවිකරණය | මයික්‍රෝ පරිපථ නිර්මාණකරණය |
| පරිඝණක දෘඩාංග ඉංජිනේරු | ඉංග්‍රිසි - සහතික පත්‍ර |
| පරිඝණක ජාල පරිපාලනය | ඉංග්‍රීසි - සාමාන්‍ය |
| ලීනකස් පරිඝණක ජාල පරිපාලනය | ඉංග්‍රීසි - වෘත්තීය |
| උද්‍යාන අලංකරණය | ව්‍යාපාර කළමණාකරණය |
| උද්‍යාන අලංකරණය | තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන තාක්ෂණ |
| ඉංජිනේරු සැළසුම් ශිල්පී | දත්ත කළමණාකරණය |
| ප්‍රමාණ හා මිණුම්කරණය | පරිඝණක රියදුරු බලපත්‍ර පාඨමාලාව |
| පරිඝණක ආශ්‍රිත ඇදීම් | මෝටර් රථ කාර්මික |
| වෘත්තිය කැමරාකරණය | සීස්කෝ ජාලකරණය |
| ලේකම්කරණය | සීස්කෝ / තොරතුරු තාක්ෂණ මෘදුකාංග හා දෘඩාංග |
| මෝටර් විදුලි තාක්ෂණික ශිල්පී | පරිඝනක චිත්‍රක නිර්මාණ |
| සිංහල යතුරු ලියන | ජංගම දූරකථන අළුත්වැඩියාව |
| ඉංග්‍රීසි යතුරු ලියන | මානව සම්පත් කළමණාකරණය |
| ටීවී විඩියෝ වැඩසටහන් නිර්මාණය | මනාලියන් හැඩගැන්වීම හා කොණ්ඩා මෝස්තර |
| රූපලාවන්‍ය ශිල්පී | අලෙවිකරණය |
| කොණ්ඩා මෝස්තර ශිල්පි | මිණුම්කරණ සහායක |
| චිත්‍ර සහ මූර්ති ශිල්පි | මංගල කේක් අකෘති |
| එම් එස් විෂුවල් ස්ටුඩියෝ සිනෙට් යෙදවුම් | ප්‍රමාණ හා මිණුම්කරණය |
| පරිගණක ත්‍රිමාණ ගෘහ නිර්මාණ | ගබඩා කළමණාකරණය |
| වාහන වායු සමන අළුත්වැඩියා ශිල්පි | මානව සම්පත් කළමණාකරණය |
| වායු සමන හා ශිතකරණ අළුත්වැඩියා ශිල්පි | බඳුකරණය |
| වායු සමන හා ශිතකරණ අළුත්වැඩියා ශිල්පි | පරිඝණක පාඨමාලා |
| බල විදුලි | ජාවා වැඩසටහන් නිර්මාණකරණය |

**මධ්‍යස්ථානය :- දෙහිවල මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිඝණක යෙදවුම් සහායක | කොණ්ඩා මෝස්තර ශිල්පී |
| පරිඝණක චිත්‍රක | කාර්යාල සහායක |
| රූපලාවන්‍ය ශිල්පි | |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| යතුරු පැදි කාර්මික ශිල්පි | මනාලියන් හැඩගැන්වීම |
| උසස් පරිඝණක ආශ්‍රිත ඇඳීම් හා ත්‍රිමාණකරණය | මෝටර් කාර්මික ශිල්පි |
| පරිඝණක ත්‍රිමාණකරණය හා නන්ලිනිය(ර්) විඩියෝ | යතුරු ලියනය හා කෙටි සටහන් |
| පරිඝණක ත්‍රිමාණකරණය හා නන්ලිනිය(ර්) විඩියෝ | ව්‍යාපාර කළමණාකරණය |
| වාහන වායුසමනය | කළමණාකරණය |
| පරිගණක දෘඩාංග | වෘත්තිය ඉංග්‍රීසි |
| ජාල පරිපාලනය | ඉංග්‍රීසි ඩිප්ලොමා |
| ජාල ඉංජිනේරු ශිල්පී | වාහන විදුලි කාර්මික |
| පරිඝණක චිත්‍රක | බල විදුලි |
| රූපවාහිනී කැමරාකරණය හා වැඩසටහන් අධ්‍යක්ෂණය | මෝටර් පාලන |
| පරිඝණක අධ්‍යයන ඩිප්ලෝමා | මෝටර් එතීම |
| පරිඝණක මල්ටිමීඩියා | වායුසමන හා ශිතකරණ අළුත්වැඩියා ශිල්පි |
| ගබඩා පාලනය හා කළමනාකරණය | සැලසුම් ශිල්පී |
| කොණ්ඩා කැපිම | ප්‍රමාණ හා මිණුම්කරණය |
| රූපලාවන්‍ය ශිල්පි | මානව සම්පත් කළමණාකරණය |
| ජංගම දුරකතන අළුත්වැඩියාව | |

**මධ්‍යස්ථානය :- කොළොන්නාව මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිසනක යෙදවුම් සහයක | |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| ඇඳුම් මැසීම | රූපලාවන්‍ය ශිල්පි |
| කේක් හා කේක් ආකෘති | කොණ්ඩා මෝස්තර ශිල්පී |
| වෘත්තීය ඉංග්‍රීසි | ඇඳුම් මැසීම |
| පරිඝණක සැලසුම් ශිල්පය | විදුලි කාර්මික |
| පරිඝණක ආශ්‍රිත ගිණුම් | පරිඝණක සහතික පත්‍ර |
| මෝටර් එතීම | පරිඝණක චිත්‍රක |
| මූලික පරිඝණක පාඨමාලාව | පරිඝණක ආශ්‍රිත ඇඳීම් |
| පෙරපාසල් ගුරු පුහුණු පාඨමාලාව | පරිඝණක දෘඩාංග |
| වායුසමන හා ශීතකරණ අළුත්වැඩියා | විදුලි කාර්මික |
| රූපලාවන්‍ය ශිල්පි | මෝටර් රථ කාර්මික ශිල්පි |
| කොණ්ඩා මෝස්තර ශිල්පී | විද්‍යානුකූල ඇඳුම් මැසීම |

**මධ්‍යස්ථානය :- පානදුර මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| රූපලාවන්‍ය ශිල්පි | විද්‍යානුකූල ඇඳුම් මැසීම |
| කොණ්ඩා මෝස්තර ශිල්පී | පරිගණක යෙදවුම් සහයක |
| බේකරි ශිල්පී | පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාව |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිගණක යෙදවුම් සහයක | ඉංග්‍රීසි භාෂාව |
| මනාලියන් හැඩගැන්වීම | |

**මධ්‍යස්ථානය :- කොබ්වක මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිගණක යෙදවුම් සහයක | කොණ්ඩා මෝස්තර ශිල්පී |
| ඇඳුම් මැසීම | විදුලි කාර්මික |
| රූපලාවන්‍ය ශිල්පි | |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| විද්‍යානුකූල ඇඳුම් මැසීම | ඉංග්‍රීසි පාඨමාලාව |

**මධ්‍යස්ථානය :- අගලවත්ත මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිගණක යෙදවුම් සහයක | |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිගණක චිත්‍රක නිර්මාණ | පරිගණක වෙබ් අඩවි නිර්මාණය |

**මධ්‍යස්ථානය :- මීවනපලාන මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිගණක යෙදවුම් සහයක | කාමර සේවක |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිගණක යෙදවුම් සහයක | ඉංග්‍රීසි පාඨමාලාව |
| ඇඳුම් මැසීම | පරිගණක දෘඩාංග |
| පරිගණක චිත්‍රක නිර්මාණ | |

**මධ්‍යස්ථානය :- සපුගස්කන්ද මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| පැස්සුම් ශිල්පී | තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී ජාතික සහතික පත්‍ර |
| විදුලි කාර්මික | යන්ත්‍ර ශිල්පී |
| රේඩියෝ ටීවී අළුත් වැඩියාව | මෝටර් රථ කාර්මික |
| පරිගණක චිත්‍රක නිර්මාණ | |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිගණක චිත්‍රක නිර්මාණ | පරිගණක වෙබ් අඩවි නිර්මාණය |

**මධ්‍යස්ථානය :- මීරිගම මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිගණක යෙදවුම් සහයක | රූපලාවන්‍ය ශිල්පී |
| විදුලි කාර්මික | කොණ්ඩා මෝස්තර ශිල්පී |
| ලේකම්කරණය | |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| මනාලියන් හැඩගැන්වීම | ඉංග්‍රීසි භාෂාව |

**මධ්‍යස්ථානය :- කහව මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| පෙර පාසල් ගුරු | කාමර සේවක |
| විද්‍යානුකූල ඇඳුම් මැසීම | උද්‍යාන අලංකරණය |

**මධ්‍යස්ථානය :- ඇල්පිටිය මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිගණක යෙදවුම් සහයක | රූපලාවන්‍ය ශිල්පී |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| පෙර පාසල් ගුරු | පරිගණක චිත්‍රක නිර්මාණ |
| ඉංග්‍රීසි පාඨමාලාව | දෙමළ භාෂාව |
| පරිගණක සහතික පත්‍ර | රූපලාවන්‍ය ශිල්පී |

**මධ්‍යස්ථානය :- අක්මීමන මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| රේඩියෝ ටීවී අළුත්වැඩියාව | යතුරු පැදි කාර්මික ශිල්පී |

**මධ්‍යස්ථානය :- අකුරැස්ස මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිගණක යෙදවුම් සහයක | |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිගණක සහතික පත්‍ර | |

**මධ්‍යස්ථානය :- මාතර මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| රූපලාවන්‍ය ශිල්පී | තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී පාඨමාලාව |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| මනාලියන් හැඩගැන්වීම | පරිගණක යෙදවුම් සහයක |

**මධ්‍යස්ථානය :- එරමිණියාය මධ්‍යස්ථානය**

| **පූර්ණ කාලීන පාඨමාලා** | |
|---|---|
| මෝටර් රථ කාර්මික | ඉංග්‍රීසි භාෂාව |
| යතුරු පැදි කාර්මික ශිල්පි | පැස්සුම් ශිල්පී |

| අර්ධ **කාලීන පාඨමාලා** | |
|---|---|
| තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන තාක්ෂණ ශිල්පි පාඨමාලාව | ක්ෂේත්‍ර සහයක |
| පැල තවාන් සංවර්ධන සහයක | |

**මධ්‍යස්ථානය :- යායවත්ත මධ්‍යස්ථානය**

| **පූර්ණ කාලීන පාඨමාලා** | |
|---|---|
| පරිගණක ආශ්‍රිත ඇදීම් | පරිගණක යෙදවුම් සහයක |
| වෘත්තීය ඉංග්‍රීසි | |

| අර්ධ **කාලීන පාඨමාලා** | |
|---|---|
| පරිගණක යෙදවුම් සහයක | වෘත්තීය ඉංග්‍රීසි |
| පරිගණක ආශ්‍රිත ඇදීම් | |

**මධ්‍යස්ථානය :- පොල්ගොල්ල මධ්‍යස්ථානය**

| **පූර්ණ කාලීන පාඨමාලා** | |
|---|---|
| මෝටර් රථ කාර්මික | කොණ්ඩා මෝස්තර ශිල්පී |
| හෝටල් කළමනාකරු | බල විදුලි ශිල්පී |
| රූපලාවන්‍ය ශිල්පි | |

| අර්ධ **කාලීන පාඨමාලා** | |
|---|---|
| වෘත්තීය ඉංග්‍රීසි | වෙබ් අඩවි නිර්මාණ |
| මෝටර් රථ කාර්මික | ඇදුම් මැසීම |
| බල විදුලි ශිල්පී | විද්‍යුත් තාක්ෂණ ශිල්පී |

| | |
|---|---|
| වායුසමන හා ශිතකරණ අළුත්වැඩියා ශිල්පි | ගෘහ නිර්මාණ ශිල්පී |
| රේඩියෝ ටීවී අළුත් වැඩියාව | ඉංග්‍රීසි භාෂාව - ඩිප්ලෝමා |
| ප්‍රමාණ හා මිණුම්කරණය | ඉංග්‍රීසි භාෂාව - වෘත්තීය |
| පරිඝණක ආශ්‍රිත ඇදීම් | දෙමළ භාෂාව |
| පරිඝණක යෙදවුම් සහයක | ප්‍රංශ භාෂාව |
| වින්ඩෝස් යෙදවුම් | කොරියන් භාෂාව |
| පරිඝණක චිත්‍රක නිර්මාණ | |

**මධ්‍යස්ථානය :- උලපනේ මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන තාක්ෂණ ශිල්පය | |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| ඉදිකිරීම් අධීක්ෂක | ඉංග්‍රීසි භාෂාව - වෘත්තීය |
| පරිඝණක යෙදවුම් සහයක | පරිඝණක දෘඩාංග |
| පරිඝණක චිත්‍රක නිර්මාණ | දෙමළ භාෂාව |
| ඉංග්‍රීසි භාෂාව - ඩිප්ලෝමා | ඇඳුම් මැසීම |

**මධ්‍යස්ථානය :- උනුවින්න මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| තොරතුරු තාක්ෂණ හා සංනිවේදන තාක්ෂණ ශිල්පය | පරිඝණක යෙදවුම් සහයක |
| ඇඳුම් මැසීම | වෘත්තීය ඉංග්‍රීසි |
| රූපලාවන්‍ය ශිල්පි | විද්‍යුත් තාක්ෂණ ශිල්පී |

**මධ්‍යස්ථානය :- නාඋල මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන තාක්ෂණ ශිල්පය | |

**ධ්‍යස්ථානය :- දඹුල්ල මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| කෘෂි යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව | රේඩියෝ ටීවී අළුත් වැඩියාව |
| යතුරු පැදි කාර්මික ශිල්පී | |

**මධ්‍යස්ථානය :- අනුරාධපුර මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| මෝටර් රථ කාර්මික | පරිගණක යෙදවුම් සහයක |
| විදුලි කාර්මික | ඉංග්‍රීසි භාෂාව |
| රූපලාවන්‍ය ශිල්පී | සිංහල ලඝුලේඛන හා යතුරු ලියනය |
| කොණ්ඩා මෝස්තර ශිල්පී | පෙරපාසල් ගුරු |
| නැටුම් | කාමර සේවක |
| ඇදුම් මැසීම | බටහිර සංගීතය |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිසංණක සහතික පත්‍ර | විසිතුරු කේක් ආකෘති |

**මධ්‍යස්ථානය :- කැකිරාව මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| මෝටර් රථ කාර්මික | විද්‍යානුකූල ඇදුම් මැසීම |
| විදුලි කාර්මික | රූපලාවන්‍ය ශිල්පී |

**මධ්‍යස්ථානය :- කහටගස්දිගිලිය මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| ඉංග්‍රීසි භාෂාව | විදුලි කාර්මික |

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිසංණක යෙදවුම් සහයක | |

**මධ්‍යස්ථානය :- රත්නපුර මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිගණක යෙදවුම් සහයක | තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන තාක්ෂණ ශිල්පය |
| ඇඳුම් මැසීම | |

**මධ්‍යස්ථානය :- පැල්මඩුල්ල මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිගණක යෙදවුම් සහයක | |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිගණක සහතික පත්‍ර | |

**මධ්‍යස්ථානය :- ඇඹිලිපිටිය මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිගණක චිත්‍රක නිර්මාණ | විද්‍යානුකූල ඇඳුම් මැසීම |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| පරිගණක යෙදවුම් සහයක | වෘත්තීය ඉංග්‍රීසි |

**මධ්‍යස්ථානය :- බටංගල මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| මෝටර් රථ කාර්මික | පැල තවාන් සංවර්ධන සහයක |
| කෘෂි ක්ෂේත්‍ර සහයක | |

**මධ්‍යස්ථානය :- ඇතුගල්පුර මධ්‍යස්ථානය**

| පූර්ණ කාලීන පාඨමාලා | |
|---|---|
| තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන තාක්ෂණ ශිල්පය | නැටුම් |

| | |
|---|---|
| රූපලාවන්‍ය ශිල්පි | කාමර සේවක |
| කොණ්ඩා මොස්තර ශිල්පී | උද්‍යාන අලංකරණය |

| අර්ධ කාලීන පාඨමාලා | |
|---|---|
| රූපලාවන්‍ය ශිල්පි | දෙමළ භාෂාව |
| කොණ්ඩා මෝස්තර ශිල්පී | |

**මධ්‍යස්ථානය :- හලාවත මධ්‍යස්ථානය**

| 13 | Badulla | 10 | 350 | 0 | 1 | 100 | 0 | 10 | 1050 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 86 | 10502 | 2,659,300 |
| 14 | Monaragala | 11 | 1233 | 5,000 | 0 | 0 | 0 | 11 | 789 | 0 | 0 | 0 | 0 | 2 | 58 | 11,000 | 62 | 5709 | 644,600 |
| 15 | Polonnaruwa | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 11 | 782 | 0 | 0 | 0 | 0 | 64 | 5213 | 8,074,300 |
| 16 | Anuradhapura | 0 | 0 | 0 | 9 | 1105 | 10,000 | 12 | 881 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 52 | 4510 | 824,500 |
| 17 | Trincomalee | 0 | 0 | 0 | 0 | 0 | 0 | 20 | 995 | 0 | 4 | 110 | 0 | 0 | 0 | 0 | 87 | 6322 | 79,030 |
| 18 | Ampara | 0 | 0 | 0 | 0 | 0 | 0 | 14 | 752 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 14 | 752 | 0 |
| 19 | Batticaloa | 13 | 1242 | 5,000 | 2 | 99 | 0 | 24 | 1052 | 40,000 | 20 | 1255 | 20,000 | 12 | 1055 | 3,000 | 211 | 10790 | 2,223,841 |
| 20 | Kurunegala | 25 | 1450 | 5,000 | 53 | 209 | 9,000 | 14 | 2035 | 79,000 | 0 | 0 | 0 | 8 | 790 | 80,000 | 283 | 25141 | 1,538,038 |
| 21 | Puttalam | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 11 | 2055 | 0 | 0 | 0 | 0 | 30 | 3867 | 0 |
| 22 | Jaffna | 5 | 350 | 0 | 0 | 0 | 0 | 11 | 452 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 35 | 2100 | 0 |
| 23 | Vavuniya | 5 | 320 | 3,000 | 0 | 0 | 0 | 5 | 250 | 0 | 0 | 0 | 0 | 4 | 0 | 0 | 72 | 7013 | 130,312 |
| 24 | Mannar | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 47 | 2027 | 25,930 |
| 25 | Mulathivu | 6 | 170 | 0 | 0 | 0 | 0 | 12 | 852 | 0 | 0 | 0 | 0 | 5 | 0 | 0 | 61 | 3657 | 0 |
| 26 | Kilinocchi | 0 | 0 | 0 | 0 | 0 | 0 | 4 | 423 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 35 | 1328 | 0 |
| | Total | 133 | 7811 | 236,500 | 130 | 4073 | 57,000 | 256 | 14826 | 291,234 | 110 | 6629 | 20,000 | 62 | 2810 | 189,157 | 2391 | 172252 | 35,795,998 |

| | |
|---|---|
| සමස්ථ වැඩසටහන් ගණන | 2391 |
| සමස්ථ තරුණ සහභාගිත්වය | 172,252 |
| වැය කළ මුදල | 35,795,998.00 |

## ආශ්‍රිත වාර්තා / ලේඛන

- මූල්‍ය වාර්තාව 2010, ජාතික තරුණ සේවා සභාව
- මූල්‍ය වාර්තාව 2012, ජාතික තරුණ සේවා සභාව
- මූල්‍ය වාර්තාව 2013, ජාතික තරුණ සේවා සභාව
- මූල්‍ය වාර්තාව 2014, ජාතික තරුණ සේවා සභාව
- මූල්‍ය වාර්තාව 2015, ජාතික තරුණ සේවා සභාව
- මූල්‍ය වාර්තාව 2011, ජාතික තරුණ සේවා සභාව
- මූල්‍ය වාර්තාව 2016, ජාතික තරුණ සේවා සභාව
- සංයුක්ත සැලැස්ම 2012 – 2016, ජාතික තරුණ සේවා සභාව
- ක්‍රියාත්මක සැලැස්ම 2016, ජාතික තරුණ සේවා සභාව
- දිස්ත්‍රික් ප්‍රගති වාර්තා, ජාතික තරුණ සේවා සභාව
- ජාතික තරුණ සේවා සභාව ප්‍රධාන කාර්යාලීය අංශ ප්‍රගති වාර්තා
- භාණ්ඩාගාර /අමාත්‍යාංශ සංවර්ධන වියදම් වාර්තාව - 2016, ජාතික තරුණ සේවා සභාව

## ඇමුණුම් 1. විගණන කමිටු වාර්තාව

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම සම්බන්ධව නිකුත් කර ඇති චක්‍ර ලේඛ ප්‍රකාරව පැවැත්විය යුතු කමිටු සංඛ්‍යාව 4ක් ලෙස නිර්ණය කර ඇති අතර, ඒ අනුව 2016 වර්ෂයට අදාලව කමිටු රැස්වීම් 4ක් පවත්වා ඇත.

අදාල රැස්වීම් පැවැත්වීමෙන් අනතුරුව ගන්නා ලද කමිටු තීරණ ඇතුළත් වාර්තාවන් සහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියන් සඳහා ඉදිරිපත් කර ඇත. ගන්නා ලද කමිටු තීරණයන්හි සම්පිඩනයක් පහත දක්වා ඇත.

- රජයේ විගණන විමසුම් මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු අවම කිරීම සඳහා කටයුතු කිරීම
- අභ්‍යන්තර විගණක හා විමර්ශන වාර්තා මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු මඟහරවා ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිලිබඳ නිරීක්ෂණ ලබාදීම.
- සමස්ත ඉඩම් හා දේපල පවරා ගැනීමේ ක්‍රියාපටිපාටිය පිලිබඳ ප්‍රගති සමාලෝචනය
- ආයතනික සේවක මණ්ඩල කටයුතු සම්බන්ධ සමාලෝචනය
- ආයතනික සංවර්ධන කටයුතු පිලිබඳ සමාලෝචනය
- වත්කම් භාරකාරත්වය හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සම්බන්ධව ඇති වී තිබූ අඩුපාඩු හේතුවෙන් පළාත් මට්ටමින් අනුයුක්ත කර ඇති පරිපාලන නිලධාරින් හරහා ඒ ඒ පළාත් වලට අයත් පළාත් කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාලය හා පුහුණු මධ්‍යස්ථානයන්හි ඇති වත්කම් නැවත භෞතිකව පරික්ෂා කර ඒ පිලිබඳව වාර්තා කරන ලෙසට දැනුම්දීම.
- වාර්ෂික ගිණුම් කටයුතු සම්බන්ධව
- ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිත ආයතනයන්හි කටයුතු පිලිබඳ විමර්ශනයට ලක්කිරීම.

## ඇමුණුම් 2. මූල්‍ය විගණක ප්‍රකාශය

**ජාතික තරුණ සේවා සභාව**
**2016 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය**

(රු'000)

| | උප. අංක | 2016 | 2015 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | 1 | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | | 7,028 | 2,535 |
| ලැබිය යුතු දෑ | | 164,069 | 130,649 |
| තොග | | 11,175 | 9,075 |
| වෙනත් ජංගම වත්කම් | | 1,604 | 1,477 |
| | | 183,876 | 143,736 |
| **ජංගම නොවන වත්කම්** | 2 | | |
| වෙනත් මූල්‍ය වත්කම් | | 271,283 | 52,089 |
| පිරියත හා උපකරණ | | 390,888 | 448,434 |
| ඉඩම් හා ගොඩනැගිලි | | 801,763 | 836,685 |
| | | 1,463,934 | 1,337,208 |
| **මුළු වත්කම්** | | 1,647,810 | 1,480,944 |
| **බැරකම්** | | | |
| **ජංගම බැරකම්** | 3 | | |
| ගෙවිය යුතු දෑ | | 90,301 | 68,265 |
| වෙනත් බැරකම් | | 12,821 | 8,093 |
| | | 103,122 | 76,358 |
| **ජංගම නොවන බැරකම්** | 4 | | |
| පාරිතෝෂික වෙන්කිරීම් | | 439,211 | 430,386 |
| **මුළු බැරකම්** | | 542,333 | 506,744 |
| **ශුද්ධ වත්කම්** | | **1,105,477** | **974,200** |
| **ශුද්ධ වත්කම්/ ස්කන්ධය** | 5 | | |
| වෙනත් රාජ්‍ය අස්තිත්වයන්ගේ දායක වූ ප්‍රාග්ධනය | | 3,742,440 | 3,341,283 |
| සංචිත | | 34,155 | 34,155 |
| සමුච්චිත අතිරික්තය /(ඌනතාවය) | | (2,671,118) | (2,401,238) |
| **මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | **1,105,477** | **974,200** |

.................................................
ජී.ඩී.ටී.එස්. පෙරේරා
අධ්‍යක්ෂ (මුදල්)
ජාතික තරුණ සේවා සභාව

.................................................
නීතිඥ ඩබ්. පී. එස්.එරන්දික
සභාපති / අධ්‍යක්ෂ ජෙනරාල්
ජාතික තරුණ සේවා සභාව

ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 01 සිට 02 දක්වා ද ගිණුම්කරණ සටහන් පිටු අංක 05 සිට 08 දක්වා ද ඇතුළත් මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම සභාවේ කළමනාකරණ මණ්ඩලය විසින් දරනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශනය කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර පහත අත්සන් යොදා මේ සමඟ ඉදිරිපත් කෙරේ.

01. නීතිඥ දසුන් නාගස්සේන - සභා අධ්‍යක්ෂ ........................................
02. පුන්සඳ විජේකුමාර - සභා අධ්‍යක්ෂ ........................................

**<u>ජාතික තරුණ සේවා සභාව</u>**
**<u>2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා</u>**
**<u>මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය</u>**

| විස්තරය | උප.අංක අංක | 2016 | රු.'000 2015 |
|---|---|---|---|
| ආදායම් | | | |
| රජයේ දායකය (පුනරාවර්තන) | | 849,999 | 820,045 |
| රජයේ දායකය සංවර්ධන (පුනරාවර්තන) | | 286,039 | 262,179 |
| | | 1,136,038 | 1,082,224 |
| බාහිර දායකය (පුනරාවර්තන) | | | |
| පළාත් සභා | 3-2-3-1 | 198 | 250 |
| අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන (පුනරාවර්තන) | 3-2-3-2 | 374,860 | 202,869 |
| විදේශ සංවිධාන | 3-2-3-3 | 14,534 | 31,442 |
| වෙනත් බාහිර ආයතන | 3-2-3-4 | - | 1,498 |
| | | 389,592 | 236,059 |
| අභ්‍යන්තර ඉපයීම් | | | |
| ජාතික තරුණ මධ්‍යස්ථාන අදායම් (මහරගම) | 6-1 | 38,595 | 32,795 |
| පුහුණු මධ්‍යස්ථාන ආදායම් | 6-2 | 140,306 | 126,935 |
| සරසවි ආදායම් | 6-3 | 26 | 1,229 |
| විවිධ ආදායම් | 6-4 | 9,273 | 7,515 |
| සංදර්ශන ආදායම් | | 5,270 | 1,972 |
| ලැබිය යුතු රක්ෂණ වන්දි | | 32 | - |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම් ලාභය | | 665 | 760 |
| ගොවිපල කාරක ගිණුම | 6-5 | 7,332 | - |
| අඩමාණ ණය අධි වෙන්කිරීම | | 232 | 227 |
| | | 201,731 | 171,433 |
| | | 1,727,361 | 1,489,716 |
| මෙහෙයුම් වියදම් | | | |
| අඩු කළා :- | | | |
| ආයතන හා පරිපාලන වැය | 7-1 | 1,014,398 | 1,014,892 |
| ස්ථාවර වත්කම් ක්ෂය | 2-4 | 199,531 | 155,412 |
| ගොවිපල කාරක ගිණුම | | - | 458 |
| | | (1,213,929) | (1,170,762) |
| | | 513,432 | 318,954 |
| තරුණ සංවර්ධන වියදම් | 07 | | |
| සෞන්දර්ය කුසලතා සංවර්ධන අංශය | 2-1 | 48,403 | 44,538 |
| මාධ්‍ය අංශය | 2-2 | 5,983 | 7,881 |
| පර්යේෂණ හා සැලසුම් අංශය | 2-3 | 3,749 | 4,696 |
| වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන අංශය | 2-4 | - | 567 |
| අධ්‍යාපන හා සංවර්ධන අංශය | 2-5 | - | 462 |
| තරුණ සේවා සරසවිය | 2-5-2 | - | 1,104 |
| කාර්මික හා වෘත්තිය පුහුණු අංශය | 2-6 | 21,571 | 20,207 |
| ජාතික තරුණ මධ්‍යස්ථාන නඩත්තු අංශය | 2-7 | 1,051 | 2,520 |
| ජාත්‍යන්තර තරුණ සම්බන්ධතා අංශය | 2-8 | 26,221 | 40,819 |
| යෞවන තිළිණ අධිකාරි අංශය | 2-9 | 3,502 | 1,933 |
| ක්‍රීඩා සංවර්ධන අංශය | 2-10 | 98,146 | 165,016 |
| තරුණ සංවිධාන හා සංවර්ධන අංශය | 2-11 | 23,610 | 142,407 |
| ගොවිපල සංවර්ධන අංශය | 2-12 | 7,091 | 4,830 |
| තරුණ සමුපකාර හා ව්‍යාපාර සංවර්ධන අංශය | 2-13 | 4,858 | 4,444 |
| නිස්කෝ විඩියෝ අංශය | 2-14 | 3,146 | 4,036 |
| ඇගයීම් අංශය | 2-15 | 6,773 | 3,184 |
| ප්‍රගති සමාලෝචන අංශය | 2-16 | - | 2,136 |
| තොරතුරු තාක්ෂණ අංශය | 2-17 | 1,279 | 61 |
| විශේෂ ව්‍යාපෘති අංශය | 2-18 | 374,350 | 619 |
| පුහුණු මධ්‍යස්ථාන | 2-6 | 134,179 | 136,370 |
| ජාතික තරුණ මධ්‍යස්ථානය - මහරගම | 2-6-1 | 19,307 | 13,962 |
| | | 783,219 | 601,792 |
| වර්ෂයේ වියදම් අතිරික්තය | | (269,787) | (282,838) |
| එකතු කළා :- | | | |
| වියදම් අතිරික්තය (2016.01.01) | | (2,401,239) | (2,118,369) |
| පෙර වර්ෂයට ගැලපීම් | | (92) | (32) |
| ඉදිරියට ගෙනා ශේෂය | | (2,671,118) | (2,401,239) |

ඇමුණුම් 3. විගණකාධිපති වාර්ථාව

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. — වීටීවයි/ඒ/එන්වයිඑස්සී/ 1/16/12 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date — 2017 ඔක්තෝබර් 16 දින |

23 OCT 2017

සභාපති

ජාතික තරුණ සේවා සභාව

**ජාතික තරුණ සේවා සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික තරුණ සේවා සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනතේ 29(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය  ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38  දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික තරුණ සේවා සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව 1981 වර්ෂයේ දී ආරම්භ කරන ලද සීමාසහිත තරුණ සේවා (පුද්) සමාගමේ මූල්‍ය ප්‍රකාශන, සභාවේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

### 2.2.2 සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම

සීමාසහිත තරුණ සේවා (පුද්) සමාගමෙහි සහ සීමාසහිත ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමයෙහි ද සභාපති ලෙස සභාවෙහි සභාපතිවරයා කටයුතු කරනු ලබන අතර සමාගමෙහි පරිපාලන කටයුතු මෙන්ම ව්‍යාපාරික ස්ථානය ද සභාවෙහි ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියෙහි සභාවට අයත් ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබයි. එයට අවශ්‍ය විදුලිය, ජලය ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් ද කිසිඳු අයකිරීමකින් තොරව සභාව විසින්ම සපයා තිබුණි. ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

**2.2.3 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් භාවිතයේ පවතින පිරිවැය රු. 863,866,199 ක් වූ ගොඩනැගිලි 459 ක් මෝටර් රථ 50 ක් හා ලී බඩු උපකරණ ඒකක 7,295 ක් සම්බන්ධයෙන් ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද එහි දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09

ප්‍රමිතයේ 15 ඡේදය ප්‍රකාරව වර්ෂ අවසාන තොග අගය කිරීම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි යන අගයන්ගෙන් අඩු අගයට සිදු කළ යුතු වුවත් ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ තොග අගය කිරීම පිරිවැයට සිදුකරන බව හෙළිදරව් කර තිබුණි. තවද සභාව සතු ගොවිපලවල වර්ෂ අවසාන කෘෂිකාර්මික තොගය අගය කිරීමේ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණු අතර එහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**2.2.4 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාරිතෝෂික ගණනය කිරීමේදී නිලධාරීන් 07 දෙනෙකුගේ සේවා කාලය අඩුවෙන් ගණනය කර තිබීම හේතුවෙන් සහ 2010 වර්ෂයේ සිට සේවයට බඳවාගත් නිලධාරීන්ට පාරිතෝෂික දීමනා සඳහා වෙන් නොකිරීම හේතුවෙන්, 2016 දෙසැම්බර් 31 දිනට සේවක පාරිතෝෂික වෙනුවෙන් රු. 18,266,227 ක් අඩුවෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

(ආ) සභාව සතු පිරිවැය රු. 139,931,500 ක් වූ ඉඩම් 12 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) වර්ෂ 50 ක දීර්ඝකාලීන බදුපදනම මත රු. 3,330,000 ක් ගෙවා නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගත් ඉඩමේ වටිනාකම, බදු ඉඩම් ලෙස දක්වනු වෙනුවට, සභාව සතු සින්නක්කර ඉඩම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එම බදු වටිනාකමින් වාර්ෂිකව ක්‍රමක්ෂය ලෙස අඩුවිය යුතු රු. 66,600 ක්, 2000 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගොවිපල මෙහෙයුම් කටයුතු වලින් රු.7,332,035 ක ලාභය ගණනය කිරීමේදී, ගොවිපල සංවර්ධනය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු රු. 8,157,928 ක් ආදායම් ලෙස ගෙන තිබුණු අතර වත්කම් ක්ෂයවීම්, අවසන් තොග සහ ණයට විකුණුම් යනාදිය සැලකිල්ලට ගෙන නොතිබුණි.

### 2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සීමාසහිත තරුණ සේවා සමාගම වෙත ගෙවිය යුතු ණය ශේෂය රු. 4,163,446 ක් වුවත්, එම සමාගම විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එදිනට සභාවෙන් අයවිය යුතු ණය ශේෂයන්ගේ එකතුව රු. 60,600,552 ක් වූයෙන් එම ශේෂයන් දෙක අතර රු. 56,437,106 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව එකතුව රු. 1,517,000 ක් වූ ණයගැති ශේෂ 3 කින් හා සේවය අතහැර ගිය නිලධාරීන් 07 දෙනෙකුට අදාලව එකතුව රු. 631,405 ක් වූ ණය ශේෂවලින් කිසිඳු මුදලක් වර්ෂය තුළ අයකරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු වර්ෂ 06 ඉක්මවූ රු. 538,950 ක ශේෂය අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2015 වර්ෂයට අදාලව සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී සමීක්ෂණ මණ්ඩල නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2) පරිදි කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 269,787,000 ක ඌනතාවක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 282,838,000 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 13,051,000 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන ප්‍රදාන පුනරාවර්තන ලැබීම් රු. 172,000,000 කින් වැඩිවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු. 73,710,000 ක් වූ ඌනතාවය සමාලෝචිත වර්ෂය වන විට රු. 269,787,000 ක් දක්වා එනම් සියයට 266 කින් වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු. 476,949,000 ක් වූ ආයතනයේ දායකත්වය සමාලෝචිත වර්ෂය වන විට රු. 762,826,000 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනත අනුව, ප්‍රධාන අරමුණු 14 ක් මත ජාතික තරුණ සේවා සභාව ක්‍රියාත්මක වන අතර සමාලෝචිත වර්ෂයේ එම අරමුණු ඉටුකරගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යසාධන වාර්තා අනුව, සභා පනතේ 4 වන වගන්තියේ සඳහන් ප්‍රධාන අරමුණු ඉටුකරගැනීම සඳහා සෘජු දායකත්වයක් දක්වන වැඩසටහන් 03 ක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර ඒ සඳහා වෙන්කළ එකතුව රු. 26,400,000 ක් වූ ප්‍රතිපාදන වෙනත් වැඩසටහන් සඳහා යොදාගෙන තිබුණි.

(ආ) (i) යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන සමාජයේ ප්‍රජාතාන්ත්‍රීය රාමුවට තරුණ පරපුර අනුගත කිරීමේ අරමුණෙන් 2010 වර්ෂයේ ආරම්භ කළ මෙම වැඩසටහන සඳහා 2016 වර්ෂයේ දී එකතුව රු.224,448,278 ක් වැයකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ වියදමින් රු. 23,615,712 ක් (50%) යොවුන් පාර්ලිමේන්තු මැතිවරණය

පැවැත්වීමට වැයකර තිබුණ ද, 334,026 ක් වූ ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 33 ක් එනම් ඡන්ද 112,367 ක් පමණක් ඡන්දය ප්‍රකාශ කර තිබුණි.

(ii) 2015 හා 2016 වර්ෂ සඳහා වූ පාර්ලිමේන්තු සැසිවාර 5 ක් තුළ පවත්වන ලද රැස්වීම් වාර 13 ක් සඳහා මන්ත්‍රීවරුන් 2,925 ක සහභාගීත්වයක් අපේක්ෂා කළද සත්‍ය සහභාගීත්වය 1,716 කි. එමෙන්ම පළමු සැසිවාරය සඳහා මන්ත්‍රීවරුන්ගේ පැමිණීමේ ප්‍රතිශතය සියයට 98 ක් වුවත් 4 වන හා 5 වන සැසිවාර සඳහා පැමිණීමේ ප්‍රතිශතය සියයට 44 ක් දක්වා අඩු වී තිබුණි. ඉහත සඳහන් පරිදි සැලකිය යුතු මුදලක් මෙම වැඩසටහන සඳහා වැය කර තිබුණද වැඩසටහන සඳහා යෞවන සමාජ සාමාජිකයන්ගේ මෙන්ම තේරී පත්වූ මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය අවම මට්ටමක පැවතීමෙන් වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂා කළ අරමුණ ඉටුවී තිබේද යන්න ගැටලු සහගත විය.

(ඇ) 2016 වර්ෂයේ ගොවිපල සංවර්ධන කටයුතුවලට වෙන් කළ රු. මිලියන 24.3 න් සියයට 71 ක් එනම් රු. මිලියන 17.2 ක් අදාල සංවර්ධන කටයුතු සඳහා යොදවා නොගෙන වෙනත් වැඩසටහන් සඳහා වැය කර තිබුණි. එබැවින් ගොවිපලවලින් අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීමට ඒවායෙහි යටිතල පහසුකම් සංවර්ධනය නොවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ඇ) ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනෙහි ක්‍රියාකාරී සැලැස්මට අනුව, ඇස්තමේන්තු පිරිවැය වූ රු. මිලියන 1,353 ක් වූ ව්‍යාපෘති 12 ක් සභාව යටතේ ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. 2016 වර්ෂය නිම වන විට ඉන් රු. මිලියන 435 ක් වැයකර තිබුණි. ඊට අදාල විගණන නිරීක්ෂණ පහත සඳහන් වේ.

(i) 2016 වර්ෂය අවසන් වන විට රු. මිලියන 385 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත පුහුණු මධ්‍යස්ථාන 10 ක නවීකරණ කටයුතු නිමකර, ව්‍යාපාර සැලසුම් 10 ක් සංවර්ධනය කර ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. එහෙත් 2016 වර්ෂය අවසන් වන විට ඉන් රු. මිලියන 339 ක් වැයකර පුහුණු මධ්‍යස්ථාන 06 ක පමණක් නවීකරණ කටයුතු සිදුකරමින් පැවතුණි. ඒ අනුව ව්‍යාපාර සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වී තිබුණි.

(ii) මෙම පුහුණු මධ්‍යස්ථාන නවීකරණ කටයුතු නිමකර 2016 වර්ෂය අවසානයේදී රු.16,000,000 ක උපකරණ මිලදී ගැනීමට සැලසුම්කර තිබුණ ද, නවීකරණ කටයුතු නිමකර නොතිබියදී ඇස්තමේන්තු මුදල රු.62,227,915 කින් ඉක්මවා 2015 හා 2016

වර්ෂ දෙක තුළ එකතුව රු.78,227,915 ක උපකරණ මිලදී ගෙන තිබුණි. එම හේතුවෙන් විගණන දිනය වූ 2017 ජූලි 12 දින වන විට ආරම්භ කර නොතිබුණු පුහුණු පාඨමාලාවලට අදාළව රු. 7,623,658 ක් වටිනා පුහුණු උපකරණ නිෂ්ක්‍රියව පැවතුණි.

(iii) වැඩසටහන යටතේ නවීකරණය කරමින් පවතින පුහුණු මධ්‍යස්ථාන 04 ක පාඨමාලා හැරයාමේ ප්‍රතිශතය සියයට 35 සිට සියයට 50 අතර පරාසයක පැවතුණි.

(iv) සභාවට අයත් පුහුණු මධ්‍යස්ථානවල තොරතුරු කළමනාකරණ පද්ධති සමාලෝචනය කර තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපිත කර ඊට අදාල පුහුණුවක් ලබාදීමේ වැඩසටහන සඳහා රු. 7,500,000 ක් වෙන්කර තිබුණු අතර එය 2015 දෙසැම්බර් 31 දින වන විට නිම විය යුතුව තිබුණි. 2016 වර්ෂය අවසාන වන විට රු. 7,181,441 ක් වැයකර තිබුණත් එම කටයුත්ත නිම කර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන් සැලැස්මට අනුව, 2014 වර්ෂයේ ආරම්භ කර 2016 වර්ෂය අවසන් වන විට රත්මලාන පුහුණු මධ්‍යස්ථානයේ ගොඩනැගිලි නවීකරණය නිමකර නව පාඨමාලා හඳුන්වාදීම තුළින් ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කල යුතුව තිබුණි. අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට හා ඉදිකිරීම් කටයුතු නඩිනමින් නිම කිරීමට සැලසුම්ගත වැඩපිළිවෙලක් සකස්කර, පවතින ගොඩනැගිල්ල නවීකරණය කරනු වෙනුවට 2014 වර්ෂයේදී නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කර තිබුණි. 2016 වර්ෂය නිම වන විට ඒ සඳහා රු. 158,787,849 ක් වැය කර තිබුණ ද, එහි ඉදිකිරීම් කටයුතු විගණන දිනය වූ 2017 මැයි 30 දින වන විටත් නිම කර නොතිබුණි. නවද, එම පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට 2014 වර්ෂයේ සිට කුලියට ලබාගත් බාහිර පාර්ශවයකට අයිති ගොඩනැගිල්ලේ සංවර්ධන කටයුතු සහ කුලිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය දක්වා එකතුව රු. 34,968,988 ක වියදමක් දරා තිබුණි.

(ආ) තරුණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු. 3,330,000 ක් වැය කර 2000 ජූලි 07 සිට අවුරුදු 50 ක බදු කාල සීමාවකට නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගත් බේරුවල පිහිටි අක්කර 01 ක ඉඩම සංවර්ධනය කිරීම සඳහා තවත් රු. 467,184 ක් වැයකර තිබුණි. 2016 වර්ෂය අවසන් වන විට වසර 16 ක් ගතවී ඇතත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

සමාලෝචිත වර්ෂය තුළ සභාවේ පුහුණු මධ්‍යස්ථාන 49 ක ක්‍රියාත්මක කළ පුහුණු පාඨමාලා 471 (සිසුන් සංඛ්‍යාව 15,691) ක් වූ අතර එය පූර්ණ කාලීන පාඨමාලා 201 (සිසුන් සංඛ්‍යාව 6,793) කින් සහ අර්ධකාලීන පාඨමාලා 270 (සිසුන් සංඛ්‍යාව 8,898) කින් (භාෂා පුහුණු පාඨමාලා 77 ක් ද ඇතුලුව) සමන්විත විය. මුළු පාඨමාලා 471 න් 80 (සිසුන් සංඛ්‍යාව 2293) ක් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) නොවන පාඨමාලා විය. ඒ අනුව එම පාඨමාලා හදාරන සිසුන්ට දේශීයව හා විදේශීයව සුදුසු රැකියා අවස්ථා ලබා ගැනීම අවිනිශ්චිතව පැවතුණි.

**4.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

1999 ඔක්තෝබර් 11 දිනැති අංක 1101/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් කෘෂිකාර්මික හා සත්ත්ව පාලන කටයුතු සඳහා භාවිතා කිරීමේ කොන්දේසි මත රු. 3,750,000 ක වටිනාකමකට 1999 සැප්තැම්බර් 14 දින සභාවට පවරා දී තිබුණු අක්කර 26 යි රූඩ් 01 යි පර්. 15.5 ක ඉඩමෙන් අක්කර 11 ක් පමණ කොටස නීත්‍යානුකූල පැවරීමකින් තොරව භාණ්ඩාගාර අනුමැතිය සහ විෂය භාර අමාත්‍යතුමියගේ එකඟතාවය මත 2007 වර්ෂයේ සිට ආරක්ෂක අමාත්‍යාංශයේ පුහුණු මධ්‍යස්ථානයක් වෙනුවෙන් ලබාදී තිබුණි.

**4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

ප්‍රධාන කාර්යාලයේ ගබඩාව තුළ වසරකට අධික කාලයක සිට රු. 1,784,200 ක් වටිනා කාණ්ඩ 05 කට අයත් ක්‍රීඩා භාණ්ඩ 1,972 ක් ද, 2016 යෞවන ක්‍රීඩා උළෙල වෙනුවෙන් 2016 සැප්තැම්බර් මාසයේදී මිලදීගෙන ගබඩාවට භාර දී තිබූ වටිනාකම රු. 416,058 ක් වූ හිස් වැසුම් (කැප්) 2,550 ක් ද විගණන දිනය වූ 2017 අප්‍රේල් 27 වන විටත් නිෂ්ක්‍රීයව පැවතුණි.

**4.6 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ හලාවත පුහුණු මධ්‍යස්ථානය සඳහා රු. 7,932,900 ක් වැයකර පරිගණක 75 ක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 (අ) i, ii හා iii ඡේද අනුව සංකීර්ණ පිරිවිතරයන් සහිත හා දිනෙන් දින නව තාක්ෂණය අනුව අළුත්වන පරිගණක වැනි තාක්ෂණ උපකරණ මිලදී ගැනීම් සඳහා වෙළඳ පොළ මිල සැඳහුම් ක්‍රමය යොදා ගැනීම

සුදුසු නොවුවද ඒ ගැන නොසළකා මිල සැදැහුම් ක්‍රමය භාවිතා කර මිල ගණන් කැඳවා තිබුණු අතර මිලගණන් කැඳවීම සඳහා ද විධිමත් ලංසු ලියවිලි භාවිතා කර නොතිබුණි.

(ii) පරිගණක සඳහා සුදුසු පරිදි පිරිවිතර සකස් කර නොතිබුණු අතර සකස් කරන ලද පිරිවිතරයෙහි පරිගණකයක තිබිය යුතු අත්‍යවශ්‍ය අංග 03 ක් ඇතුළත් කර නොතිබුණි.

(iii) මිල ගණන් ඇගයීමේදී මිල ඉදිරිපත් කළ ආයතන 05 කින් 03 ක් හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කර තිබුණු අතර අවම මිල හා උපරිම මිල ඉදිරිපත් කර තිබූ ආයතන දෙකෙහි මිල ගණන් පමණක් ඇගයීමට ලක් කර තිබුණි.

(iv) ඉහත පරිගණක 75 න් පිරිවැය රු. 740,404 ක් වටිනා පරිගණක 07 ක් විවිධ හේතූන් අනුව භාවිතයට ගැනීමට පෙර සිටම අක්‍රියව පැවතුනු බව 2016 දෙසැම්බර් 20 දින සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂාවේදී හෙළිදරව් විය.

(v) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ඡේදය ප්‍රකාරව විධිමත් ගිවිසුමක් අත්සන් කිරීම, 5.4.10 ඡේදය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගැනීමට හා ගෙවන මුදලින් යම් ප්‍රතිශතයක් ගිවිසුම් ගත කාල පරිච්ඡේදයක් සඳහා රඳවා තබාගැනීමට ආයතනය කටයුතු නොකිරීම හේතුවෙන් පරිගණකවල පැවති තාක්ෂණික දෝෂයන් පිළිබඳව සැපයුම්කරුට එරෙහිව නීතිමය කටයුතු කිරීමට නොහැකි වී තිබුණි.

## 4.7 ආර්ථික නොවූ ගනුදෙනු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාවට අයත් පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල හා පුහුණු මධ්‍යස්ථානවල නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් තැබීම වෙනුවෙන්, ඇඟිලි සලකුණු යන්ත්‍ර 60 ක් මිලයට ගැනීම සඳහා අවස්ථා දෙකක දී සභාව විසින් කාර්යසාධන ඇපකරයක් ලබාගැනීමකින් තොරව සහ යන්ත්‍ර නියමිත ප්‍රමාණයෙන් හා අපේක්ෂිත ගුණත්වයෙන් සපයා ඇති බවට තහවුරුවකින් තොරව සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 2,793,167 ක මුදලක් ගෙවා තිබුණි. ඉන් යන්ත්‍ර 09 ක් විගණන දිනය වූ 2017 මැයි 31 දින වන විටත් සපයා නොතිබුණි. සපයන ලද යන්ත්‍ර 51 න් අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමට හැකි වී තිබුණේ යන්ත්‍ර 3 ක් පමණි. සවිකරන ලද යන්ත්‍ර 29 කට මෘදුකාංග ඇතුළත් කර නොතිබුණු අතර මෘදුකාංග ඇතුළත් කර ඇතත් පැමිණීමේ වාර්තා ලබාගැනීමට නොහැකිවූ යන්ත්‍ර 16 ක් පැවතුණි.

(ආ) සභාව විසින් යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන යටතේ මන්ත්‍රීවරුන් වෙත බෙදා හැරීම සඳහා රු. 15,859,500 ක් වැයකර 2015 දෙසැම්බර් 31 දින ටැබ් පරිගණක 327 ක් මිලදී ගෙන තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එම යන්ත්‍ර හොඳ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින බවට සහතික කර තිබුණද, යන්ත්‍ර 23 ක් සැපයුම්කරු ගබඩාවට භාරදෙන අවස්ථාව වන විටත් ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණ බව නිරීක්ෂණය විය. තවද, සැපයූ ටැබ් යන්ත්‍ර බොහෝ දෝෂ සහිත බව මන්ත්‍රීවරුන් විසින් විගණනයට ප්‍රකාශ කර තිබුණි.

(ඇ) 2016 මාර්තු 31 සිට අප්‍රේල් 04 දක්වා පවත්වන ලද යොවුන්පුර ජාතික වැඩසටහනට සහභාගීවන තරුණ තරුණියන් වෙත බෙදාහැරීම සඳහා ටී ෂර්ට් 11,928 ක් රු. 9,973,220 ක් වැයකර මිලදීගෙන තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයකින් තොරව, වැඩසටහන පවත්වන ලද දිනට පසුව සපයන ලද ටී ෂර්ට් 1773 ක් සඳහා ඉහත මුදලින් රු. 1,932,500 ක් ගෙවා තිබුණි.

මෙම මිලදී ගැනීම් කටයුතු විධිමත් පරිදි සැලසුම් කර නියමිත කාල පරිච්ඡේදය තුළ ප්‍රසම්පාදන ආරම්භ නොකිරීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවීම හේතුවෙන් වැඩි මිලක් යටතේ ටී ෂර්ට් මිලදී ගැනීමෙන් සභාවට රු. 1,848,840 ක පමණ අලාභයක් සිදුවී තිබුණි.

**4.8 ප්‍රමාද වූ ව්‍යාපෘති**

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) යොවුන් පාර්ලිමේන්තු වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක කල "යූත් ගොට් ටැලන්ට්" වැඩසටහන යටතේ දිවයින පුරා ක්ෂේත්‍රයන් 06 ක් ඔස්සේ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති 1,500 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. 112,500,000 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 1,500 න් 1,375 ක් ම පොදු අවශ්‍යතා මත පදනම් වූ ව්‍යාපෘති වී තිබුණි.

(ii) දිස්ත්‍රික්ක 12 කින් ලැබුණු තොරතුරු අනුව, 2016 නොවැම්බර් 12 දින වන විට නිම කළ යුතුව තිබූ ව්‍යාපෘති 493 කින් සභාව විසින් රු. 12,150,000 ක් නිදහස් කරන ලද ඇස්තමේන්තු පිරිවැය රු. 75,841,473 ක් වූ ව්‍යාපෘති 162 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි.

(iii) 2017 පෙබරවාරි 14 සිට 17 දින දක්වා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සිදුකල භෞතික විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

- දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 26 ක් අතරින් ව්‍යාපෘති 6 කට අදාලව තාක්ෂණික නිලධාරී විසින් සහතික කළ වැඩවල වටිනාකම රු. 1,288,196 ක් වුවද සත්‍ය වශයෙන් නිමකර තිබූ වැඩවල වටිනාකම රු. 678,366 ක් පමණ විය.

- අරමුදල් නොමැති වීම මත ඇස්තමේන්තු ගත පිරිවැය රු. 814,252 ක් වූ ව්‍යාපෘති 05 ක් අත්හැර තිබුණු අතර ඇස්තමේන්තුගත පිරිවැය රු. 5,369,000 ක් වූ වෙනත් ව්‍යාපෘති 17 ක ඉදිකිරීම් කටයුතු 2017 පෙබරවාරි අවසන් වන විටත් නිම කර නොතිබුණි.

- එමෙන්ම අපේක්ෂිත ප්‍රමිතයට අනුව සිදු නොකළ වැඩවල පිරිවැය රු. 831,234 ක් වූ ව්‍යාපෘති 04 ක් පැවති අතර වැඩ නිමකර ඇතත් ප්‍රයෝජනයට නොගෙන තිබුණු රු. 814,120 ක පිරිවැය වූ ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් සභාව රු. 225,000 ක් වැයකර තිබුණි.

- පිරිවැය රු. 1,905,890 ක් වූ ව්‍යාපෘති 08 ක වියදම් තහවුරු කිරීමට අදාල බිල්පත් හෝ වෙනත් පිළිගත හැකි සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**4.9 වෙනත් ආයතන වෙත ලබාදුන් සභාවෙහි සම්පත්**

-------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1972 අංක 05 දරන සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ පාලනයට හා අධීක්ෂණයට ලක්වන ආයතනයක් වන සීමාසහිත ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපාකාර සමිති සංගමයේ කටයුතු සඳහා විධිමත් අනුමැතියකින් තොරව සභාවේ සේවකයන් 19 දෙනෙකු පූර්ණකාලීනව ද තවත් සේවකයන් දෙදෙනෙකු අර්ධ කාලීනව ද සේවයේ නියුක්ත කර තිබුණි. ඉන් සේවකයින් 05 දෙනෙකු වසර 05 කට වඩා වැඩි කාලපරිච්ඡේදයක සිට සේවා නියුක්ත කර තිබුණි. පූර්ණ කාලීනව සේවයේ නියුක්ත සේවකයන් වෙනුවෙන් සභාව, 2016 වර්ෂය සඳහා පමණක් එකතුව රු. 8,466,833 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

තවද එම ආයතනය විසින් වසරකට දෙවරක් සභා භූමිය තුළ සභාවේ සම්පත් උපයෝගී කරගෙන පවත්වනු ලබන නිස්කෝ ව්‍යාපාරික පොළ සඳහා 2016 වර්ෂයේ දී සභාවේ පොදු පහසුකම් භාවිතා කිරීම වෙනුවෙන් අවස්ථා දෙකකදී රු. 100,000 ක් සභාවට ලබා දෙමින් එම ආයතනය ඉන් රු. 2,473,100 ක ආදායමක් උපයා තිබුණි.

(ආ) ජාතික තරුණ සේවා සභාවට අයත් කැබ් රථ දෙකක් 2012 වර්ෂයේ සිට සහ 2015 වර්ෂයේ සිට විධිමත් අනුමැතියකින් හා පැවරීමකින් තොරව සීමා සහිත තරුණ සේවා සමාගමට ලබා දී තිබූ අතර එම කාල පරිච්ඡේදයට අදාලව සභාව විසින් එම වාහන වෙනුවෙන් එකතුව රු. 339,265 ක රක්ෂණ වාරික ගෙවා තිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී වාහන 2 ක් හා 2013 වර්ෂයේදී එක් වාහනයක් ලෙස ආයතනය සතු පිරිවැය රු. 24,100,000 ක් වූ වාහන 03 ක් රේඛීය අමාත්‍යාංශයේ පරිහරණය සඳහා ලබා දී තිබුණි. එම වාහනවල රක්ෂණ වාරික ලෙස 2016 වර්ෂයේ පමණක් එකතුව රු. 224,306 ක් සභාව විසින් ගෙවා තිබුණි.

**4.10 කාර්ය මණ්ඩල පරිපාලනය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 නොවැම්බර් 22 දින අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියට අනුව නිලධාරීන් බඳවා ගැනීමට සමාලෝචිත වර්ෂය නිමවන විටත් සභාවට නොහැකි වී තිබුණි. ඒ අනුව, අනුමත තනතුරු 1,845 න් තනතුරු 275 ක් සමාලෝචිත වර්ෂය නිම වන විට පුරප්පාඩුව පැවතුණි.

(ආ) ප්‍රධාන කළමනාකරණ තනතුරු හතරක් ඇතුළුව අනෙකුත් මාණ්ඩලික හා මාණ්ඩලික නොවන තනතුරු සඳහා සුදුසුකම් සපුරන ලද නිලධාරීන් බඳවාගැනීමෙන් තොරව වැඩ ආවරණය කිරීමේ හෝ ද්විතියන පදනම මත නිලධාරීන් අනුයුක්ත කිරීම දිගින් දිගටම සිදු කර තිබුණු අතර එම තනතුරු සඳහා සුදුසුකම් සහිත ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවාගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) ජ්‍යෙෂ්ඨ සහ මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු පුරප්පාඩු පිළිවෙලින් 15 ක් හා 35 ක් පැවතියද ඒ සඳහා නිලධාරීන් 42 දෙනෙකු හා 51 දෙනෙකු වැඩ ආවරණය සඳහා පත්කර තිබුණි.

| | |
|---|---|
| 2015 - 5.4 (ආ) | 2013 වර්ෂයේ භාවිතයෙන් ඉවත් කර පුහුණු උපකරණ ලෙස යොදාගෙන ඇති වාහන 15 පිළිබඳ වාර්තා නොතිබීම. |
| 2015 - 5.4 (ඇ) | සීමාසහිත නැටුම් හා සංගීත සමාගමෙහි ආයෝජන විධිමත් අනුමැතියකින් තොරව පොත්පත්වලින් ඉවත් කිරීම. |
| 2015 - 4.4 (අ) | නීති විද්‍යාලයේ ශිෂ්‍ය සංගමය නියෝජනය කළ සිසුන් වෙනුවෙන් බටංගල පුහුණු මධ්‍යස්ථානයේ 2014 අගෝස්තු මාසයේදී පැවැත්වූ පුහුණු වැඩසටහන වෙනුවෙන් 2015 වර්ෂයේදී ගෙවා තිබුණු රු. 818,000 ක මුදල සඳහා ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර තිබීම. |
| 2015 - 4.4 (ආ) | හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානයට ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් සිදුවී තිබූ අක්‍රමිකතා. |
| 2015 - 4.7 | සභාව සතු කැබ් රථ දෙකක් පිළිවෙලින් 2012 නොවැම්බර් 06 හා 2015 අප්‍රේල් 01 දින සිට අවිධිමත් පරිදි සීමා සහිත තරුණ සේවා සමාගමේ පරිහරණය සඳහා ලබාදී තිබුණි. |

## 5.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික අයවැය ලේඛනය අවස්ථා 04 කදී සංශෝධනය කර තිබුණු අතර අවසන් සංශෝධනය 2016 නොවැම්බර් 18 දින සිදුකර තිබුණි. එසේ වුවද, ආයතනයේ අරමුණු ඉටු කිරීම කෙරෙහි සෘජු දායකත්වයක් දක්වන අංශ 08 ක් සඳහා වෙන්කර දී තිබූ වාර්ෂික අයවැය ප්‍රතිපාදන අදාල අරමුණු සඳහා යෙදවීමෙන් තොරව ඉතිරිව තිබුණි. එම ඉතිරිය සියයට 25 සිට සියයට 90 දක්වා පරාසයක විය. ඒ අනුව අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ප්‍රසම්පාදන පාලනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල වන පරිදි විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ස්ථාපිත කර රජයේ මුදල් කාර්යක්ෂමව, ඵලදායීව හා ආර්ථිකව උපයෝජනය නොකිරීම. |
| (ආ) අයවැය පාලනය | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස් පරිදි ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වන පරිදි වාර්ෂික අය වැය ලේඛන පිළියෙළ නොකිරීම හා කාලීන පදනමක් මත කාර්ය සාධනය ඇගයීමට ලක් කර අවශ්‍ය සංශෝධන නොකිරීම. |
| (ඇ) ගිණුම්කරණය | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කරමින් මූල්‍ය තොරතුරු නිවැරදිව වාර්තා වන පරිදි විධිමත් ගිණුම්කරණ පද්ධතියක් පවත්වා නොගැනීම. |
| (ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය | අනුමත කාර්යය මණ්ඩලයට සහ බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව බඳවාගැනීම්, උසස් කිරීම්, පුහුණුව හා සංවර්ධනය කිරීම හා ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට හැකිවන පරිදි මානව සම්පත් සැලැස්මක් සකස් කර සමාලෝචනය කර යාවත්කාලීන නොකිරීම. |
| (ඉ) පුහුණු පාඨමාලා පැවැත්වීම | වර්තමාන තරුණ අවශ්‍යතා සපුරාගත හැකි පරිදි පුහුණු වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක නොකිරීම. |
| (ඊ) වත්කම් පාලනය | සභාව සතු වත්කම්වල ආරක්ෂාව හා පැවැත්ම තහවුරු වන පරිදි විධිමත් ලේඛන පවත්වා ගැනීම හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මගින් හෙළිදරව් වන කරුණු පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම. |

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

16

**ජාතික තරුණ සේවා සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

| | | |
|---|---|---|
| 2.2.1 | **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම** | |
| | ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව 1981 වර්ෂයේ ආරම්භ කරන ලද සී/ස තරුණ සේවා (පුද්) සමාගමේ මූල්‍ය ප්‍රකාශන, සභාවේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | 2016.12.31 දිනනේ අවසන් වර්ෂය සඳහා විගණිත ගිණුම් 2017.01.30 දිනට පෙර ඉදිරිපත් කරන ලෙස සී/ස තරුණ සේවා සමාගම වෙත දැනුම්දී ඇතත්, සභාවේ 2016 අවසාන ගිණුම් වාර්තා 2017.02.28 දින විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන අවස්ථාව වන විටත් ලබාදී නොතිබූ බැවින් ඒකාබද්ධ කල නොහැකි විය. |
| 2.2.2 | **සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම** | |
| | පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| (අ) | සීමාසහිත තරුණ සේවා (පුද්) සමාගමෙහි සහ සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමයෙහි ද සභාපති ලෙස සභාවෙහි සභාපති තුමා කටයුතු කරනු ලබන අතර ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | ඉදිරි මුදල් වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මීට අදාළ හෙළිදරව් කිරීමට සටහන් කර ඇති බව කාරුණිකව සලකන්න. |
| (ආ) | සමාගමෙහි පරිපාලන කටයුතු මෙන්ම ව්‍යාපාරික ස්ථානය ද සභාවෙහි ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියෙහි සභාවට අයත් ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන අතර ඊට අවශ්‍ය විදුලිය, ජලය ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් ද කිසිඳු අයකිරීමකින් තොරව සභාව විසින්ම සපයනු ලබයි. එහෙත් ඒ පිළිබඳ කිසිඳු හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශන තුළ කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කිරීමටත්, සම්පත් පරිහරණය කිරීම වෙනුවෙන් වන අයකිරීම් ගණනය කිරීමෙන් අනතුරුව සභා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කොට ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කරගන්නා ලදී. |
| 2.2.3 | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති | |
| | පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු ගොඩනැගිලි 459 ක් මෝටර් රථ 50 ක් හා ලී බඩු උපකරණ ඒකක 7,295 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද එහි දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හා 3 අනුව ජංගම නොවන වත්කම් මූල්‍ය ප්‍රකාශණවල අනාවරණය කිරීමට ඉදිරියේදී සැලසුම් කර ඇත. මෝටර් රථ වත්කම් ප්‍රත්‍යාගණනය අවසන් කර ඇති අතර 2017.12.31 දිනට වත්මන් තක්සේරු අගය මූල්‍ය ප්‍රකාශණවල අනාවරණය කලහැකි බව සඳහන් කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09 හි 29 ඡේදය ප්‍රකාරව සභාව සතු ගොවිපල 17 හි වර්ෂ අවසාන කෘෂිකාර්මික තොගයෙහි වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 9 හි 29 ඡේදය ප්‍රකාරව සභාව සතු ගොවිපල 17 හි වර්ෂ අවසාන කෘෂිකාර්මික තොගයෙහි වටිනාකම 2016.12.31 දිනට ගණනය කර එවන මෙන් පළාත් කර්යාල දැනුවත් කර ඇතත් ගණනය කර එවා නොමැති බැවින් ගිණුම ගත කිරීමට නොහැකි විය. ගොවිපල පරිපාලන හා අධ්‍යයන කටයුතු විධිමත් කිරීම යන මැයෙන් 2017.06.01 දිනැතිව නිකුත් කර ඇති 2017/01 ගොවිපල චක්‍රලේඛය මගින් විධිමත්ව ගිණුම් කටයුතු පවත්වාගෙන යන ලෙස ලබා දී ඇති උපදෙස් අනුව ඉදිරියේ දී මෙම තත්ත්වයන් නිවැරදි කර ගත හැක. |
| 2.2.4 | ගිණුම්කරණ අඩුපාඩු | |
| | පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | |

| | | |
|---|---|---|
| (අ) | පාරිතෝෂික ගණනය කිරීමේදී නිලධාරීන් 07 දෙනෙකුගේ සේවා කාලය අඩුවෙන් ගණනය කර තිබීම හේතුවෙන් සහ 2010 වර්ෂයේ සිට සේවයට බඳවාගත් නිලධාරීන්ට පාරිතෝෂික දීමනා සඳහා වෙන් නොකිරීම හේතුවෙන්, 2016 දෙසැම්බර් 31 දිනට සේවක පාරිතෝෂික ශේෂය රු. 18,266,227 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මෙම නිලධාරීන් වැටුප් රහිත නිවාඩු ලබාගෙන විදෙස් ගතවීම නිසා එම සේවා කාලය අඩුකර පාරිතෝෂිතය ගණනය කර ඇත. 2016.12.31 දිනට පාරිතෝෂිත වෙන්කිරීම් පරිගණක ගත කිරීමේදී අතපසුවීමකින් 2006,2007 ලෙස ඇතුලත් කර ඇති වර්ෂ 2008,2009,2010 හා 2011 ලෙස නිවැරදි විය යුතුය. |
| (ආ) | සභාව සතු ඉඩම් 12 ක වටිනාකම වූ රු. 139,931,500 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර සභාව වෙත නීත්‍යානුකූලව අයිතිය පවරා නොගත් වටිනාකම රු. 18,005,019 ක් වූ ඉඩම් 12 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. | ගිණුම් සටහන් 8-1 අනුව ඉඩම් අයිතිය නොමැති වුවත් ඉඩමට දරණ වියදම් (වැට ඉදිකිරීම, පිඩැලි ඇල්ලීම,ගල් ඇතිරීම ආදී) ගිණුම් ගතකර ඇත. සභාව සතු ඉඩම් ප්‍රත්‍යාගණන කිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතින අතර තක්සේරු වටිනාකම් ලැබුණු පසු 2017 වර්ෂයේදී නීත්‍යානුකූල ඉඩම් වටිනාකම ගිණුම් ගත කරනු ලැබේ. |
| (ඇ) | වර්ෂ 50 ක දීර්ඝ කාලීන බදුපදනම මත රු. 3,330,000 ක් ගෙවා නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගත් ඉඩමක වටිනාකම බදු ඉඩම් ලෙස නොව සභාව සතු ඉඩම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එම බදු වටිනාකමින් වාර්ෂිකව ක්ෂය ලෙස අඩුවිය යුතු රු. 66,600 ක් 2000 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි | බදු පදනමට මිලදීගත් දින සිට වාර්ෂිකව අයකල යුතු බදු ප්‍රමාණය 2017 වර්ෂයේදී ගිණුම් ගත කරනු ලැබේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගොවිපල මෙහෙයුම් කටයුතු වලින් රු. 7,332,035 ක ලාභයක් පෙන්නුම් කරන අතර, එම ලාභාලාභ ගණනය කිරීමේදී ගොවිපල සංවර්ධනය කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු. 8,157,928 ක් ගොවිපල ආදායමක් ලෙස ගෙන තිබුණි. එමෙන්ම ගොවිපල වලට අදාල වත්කම් ක්ෂයවීම්, සත්ත්ව නිෂ්පාදන හා කෘෂිභෝගවල අවසන් තොග සහ ගොවිපල නිෂ්පාදන ණයට විකුණුම් යනාදිය ඉහත ලාභාලාභ ගණනයේදී සැලකිල්ලට ගෙන නොතිබුණි. ඒ අනුව ගොවිපල මෙහෙයුම් කටයුතු වලින් වූ ලාභය ලෙස දක්වා ඇති ඉහත වටිනාකම නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර සංවර්ධන වියදම් ගොවිපල කාරක ගිණුමට වියදමක් ලෙස පෙන්වා ඇති බැවින් ගොවිපල සඳහා භාණ්ඩාගාරයෙන් ගොවිපල සංවර්ධනයට වෙන්වූ ලැබීම් 8,157,928 ක මුදල කාරක ගිණුමට ආදායම් ලෙස ගැලපීම් කර ඇත. සත්ව නිෂ්පාදන හා කෘෂි භෝගවල අවසන් තොග පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමට පෙර නොලැබුන බැවින් මූල්‍ය ප්‍රකාශණවලට ඇතුලත් නොකල අතර, ප්‍රාග්ධන වත්කම්වලට අදාල ක්ෂය මූල්‍ය තත්ව ප්‍රකාශණයෙහි සටහන් කර ලාභය ගැලපීමට උපයෝගී කරගෙන ඇත. සත්ත්ව නිෂ්පාදන හා කෘෂිභෝගවල අවසන් තොග පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් අදාළ නිලධාරින් වෙතින් කරුණු විමසීම සඳහා කටයුතු කරන අතර, ඉදිරි මුදල් වර්ෂයේ සිට මෙම වටිනාකම් ගිණුම්ගත කිරිම සඳහා පියවර ගන්නා බව දන්වා සිටිමි. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 9 හි 15 වන ඡේදයට අනුව, පිරිවැය හෝ ශුද්ධ උපලබ්දි අගය යන වටිනාකමින් අඩු අගයට තොග ගණනය කළ යුතු වුවද තොග සමීක්ෂණ මණ්ඩලය විසින් විනාශ කළ යුතු බවට නිර්දේශ කර තිබූ අයිතම් 16 කට අදාල ඒකක 1,889 කින් සමන්විත තොග රු. 87,720 ක් වූ පිරිවැයට වර්ෂ අවසාන තොග ශේෂයට ඇතුළත් කර තිබුණි. | ප්‍රධාන ගබඩාවේ පාරිභෝගික තොගයෙහි සඳහන් අයිතම් 16 විනාශ කලයුතු බවට නිර්දේශ කර තිබූ පමණින් තොග වටිනාකමෙන් ඉවත් කිරීම සිදු නොවේ. එම තොග වෙන්දේසි හා විනාශ කිරීමේ කමිටු වාර්තා අනුව තොග පොත්වලින් ඉවත් කිරීම සිදු කෙරේ. |
| 2.2.5 | නොසැසඳූ ශේෂ | |
| | මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සීමාසහිත තරුණ සේවා සමාගම වෙත ගෙවිය යුතු ණය ශේෂය රු. 4,163,446 ක් ලෙස දක්වා තිබුණ ද එම සමාගම විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එදිනට සභාවෙන් අයවිය යුතු ණය ශේෂයන්ගේ එකතුව රු. 60,600,552 ක් වූයෙන් එම ශේෂයන් දෙක අතර රු. 56,437,106 ක වෙනසක් නිරීක්ෂණය විය. | අයවීමට ඇති ශේෂ සම්බන්ධව අමාත්‍යාංශය සමඟ පවත්වන ලද සාකච්ඡා වලදී අදාළ ශේෂ පිළිබද පැහැදිලි විස්තර දන්වා එවන ලෙස සී/ස තරුණ සේවා සමාගමට ලිඛිතව හා වාචිකව දැනුම් දූන්නද මේ වන තෙක් අදාළ ශේෂ සම්බන්ධව වාර්තා කර නොමැත. |
| 2.2.6 | පිළිතුරු නොලත් විගණන විමසුම් | |
| | 2016 වර්ෂයේ විගණනය සම්බන්ධයෙන් නිකුත් කළ විගණන විමසුම් සඳහා පිළිතුරු 2017 අප්‍රේල් 30 දින වන විටත් ලබාදී නොතිබුණි. | |

| | විගණන විමසුම් අංකය | නිකුත් කළ දිනය | විමසුමට අදාල කාරණය | |
|---|---|---|---|---|
| | VTY/A/NYSC/ 2015/08 | 2016.02.24 | ජාතික තරුණ සේවා සභාවේ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය සහ දිස්ත්‍රික් යෞවන සමාජ සම්මේලනයේ කටයුතු පිළිබඳ විගණන පරීක්ෂාව | 2016.05.05 දින ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට පිටපත් සහිතව විගණකාධිපති වෙත පිළිතුරු යොමුකර ඇත. |
| | VTY/A/NYSC/ 2015/18 | 2016.03.03 | ජාතික තරුණ සේවා සභාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණයේ තනතුරු සඳහා බඳවාගැනීමේ පරිපාටිය හා අදාල බඳවාගැනීම් පරීක්ෂාව | 2017.07.19 දින ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට පිටපත් සහිතව විගණකාධිපති වෙත පිළිතුරු යොමුකර ඇත. |
| | VTY/A/NYSC/ 2015/29 | 2016.05.25 | ජංගම නොවන වත්කම් පිළිබඳ පරීක්ෂාව | 2016.05.06 දින ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට පිටපත් සහිතව විගණකාධිපති වෙත පිළිතුරු යොමුකර ඇත. |
| | VTY/A/NYSC/ 2016/03 | 2016.11.18 | පවිත්‍රතා සේවා කටයුතු සපයා ගැනීම | 2017.07.26 දින ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට පිටපත් සහිතව විගණකාධිපති වෙත පිළිතුරු යොමුකර ඇත. |
| | VTY/A/NYSC/ 2016/06 | 2017.01.31 | සංස්කෘතික අංශයේ නිලධාරීන් සේවයට වාර්තා කිරීම පිළිබඳ විගණනය | පිළිතුරු කෙටුම්පත් කර ඇත. කඩිනමින් ලබාදීමට පියවර ගැනේ. |
| | VTY/A/NYSC/ 2016/07 | 2017.03.08 | අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තා - 2016 | 2017.05.16 දින ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට පිටපත් සහිතව විගණකාධිපති වෙත පිළිතුරු යොමුකර ඇත. |
| 2.2.7 | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | | | |
| | පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | | |
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් එකතුව රු. 1,517,000 ක් වූ ණයගැති ශේෂ 3 කින් හා නිලධාරී 07 දෙනෙකුට අදාලව එකතුව රු. 631,405 ක ණය ශේෂ වලින් කිසිඳු වාරිකයක් වර්ෂය තුළ අයකරගෙන නොතිබුණි. | | | **<u>1,517,000 ක් වූ ණයගැති ශේෂ 3 සම්බන්ධ තොරතුරු</u>**<br>එඩ්වඩ් නිර්මලී ක්‍රිශාන්ති මෙය - ගෙවීම් පැහැර හැර ඇති බැවින් ගම්පහ උසාවිය මගින් දේපල තහනම් කිරීමේ රීට් ආඥාවක් නිකුත් කිරීමට කටයුතු කර ඇත.<br>කේ.ජී.කේ.සඳරුවන් මයා - මේ වන විට අඛණ්ඩව ගෙවීම් සිදුකර ඇත.<br>ආර්.කරුණෙයිනාදන් මයා - නඩුව සමථයකට පත්ව ඇත්තේ මුලින් රු.100,000 ක් ගෙවීමටත්, මසකට රු.35,000 බැගින් ගිවිසුම්ගත මුදල අවසන් වන තෙක් ගෙවීමටත්ය. මේ වන විට රු.100,000 ක මුදල ගෙවා රු.35,000 ක එක් වාරිකයක් ගෙවා ඇත.<br>**<u>නිලධාරී 07 දෙනෙකුට අදාලව එකතුව රු. 631,405 ක ණය ශේෂ සම්බන්ධ තොරතුරු</u>**<br>එච්.කාලිංග මුදලි මයා - අංක 43010/එම් යටතේ ගම්පහ උසාවියේ නඩුවක් පවතී.<br>බී.වයි.රාජකරුණා මයා - ගිවිසුම අනුව දින 26 කට විදේශ ශිෂ්‍යත්වයක් සඳහා සහභාගී වී ඇති අතර, මසකට අඩු කාලයක් බැවින් ඒ වෙනුවෙන් ගිවිසුම් ගතවීමේ අවශ්‍යතාවයක් නොමැත. එබැවින් අදාල වටිනාකම් ගණනය කිරීම නිවැරදි නොවන බැවින් ඉදිරියේදී ගිණුම් සටහන් මගින් නිවැරදි කිරීමට පියවර ගැනේ.<br>ඩබ්.ජී.ආනන්ද මයා - නීතිපති උපදෙස් සඳහා සාකච්ඡාවක් පවත්වන ලද අතර, මුදලේ ප්‍රමාණාත්මක භාවය සැලකීමේදී නීතිමය ක්‍රියාමාර්ගයන්ට යොමුවීම ඵලරහිත බව පවසන ලදී. ඇපකරුවන් වෙතින් අයකර ගැනීමේ හැකියාව පිළිබඳව සොයා බලා ඒ අනුව කටයුතු කිරීමට දන්වන ලදී. |

| | | |
|---|---|---|
| | | ඩබ්.ඒ.ආනන්ද මයා<br>එස්.එම්.අමරා කුමාරි මිය<br>එච්.එම්.සරත් මයා<br>කේ.එස්.පොන්නයියා මයා — මෙම නිලධාරින්ගේ පදිංචිය තහවුරු කරගැනීම සඳහා අදාළ ග්‍රාම නිලධාරී වෙත ලිපි යොමු ඇත. |
| (ආ) | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 06 කට වඩා පැරණි රු. 538,950 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂය තුළ දී ද අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | විගණන හා කළමණාකරන කමිටුවේදී මේ පිළිබඳව සාකච්ඡා කරන ලද අතර, අයවීම සම්බන්ධයෙන් වන ලිඛිත තොරතුරු ඇතුලත් කොට සහා සන්දේශයක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී. ඒ අනුව 2017.07.21 දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සන්දේශයක් ඉදිරිපත් කර ඇති අතර, **තීරණයේ උධෘත පිටපතක්** උපලේඛණ අංක 01 **ලෙස දක්වා ඇත.** |
| 2.2.8 | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම | |
| | 2015 වර්ෂයට හා ඊට පෙර වර්ෂවලට අදාලව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්තතා හා ඌනතා සම්බන්ධයෙන් සහ වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2) පරිදි කටයුතු කර නොතිබුණි. | 2015 වර්ෂයේ හා ඊට පෙර වර්ෂ වලට අදාළව ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන ගබඩාවෙන් නිකුත් කර තිබූ 2015.12.31 දිනට අදාළ භාණ්ඩ ඌණතා වාර්තාව අනුව නිවැරදිව නම්, තනතුර සඳහන් ජාතික තරුණ සේවා සභාවේ දැනට සේවය කරන සියළු නිලධාරින්ට භාණ්ඩ ඌණතා නිරවුල් කරන ලෙසට ලිපි යොමු කර ඇත. එම ලිපි අනුව නිරවුල් කල අයගේ ලේඛණයක් සකස් කර ඇත. විවිධ හේතූන් මත යම් යම් සහන ඉල්ලා ලිපි යොමු කර ඇති අයවළුන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත්, නිරවුල් කිරීම් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් නිලධාරින් සම්බන්ධයෙන් 2017 අගෝස්තු මස සිට වැටුපෙන් අයකිරිමට කටයුතු කරනු ලැබේ. (උපලේඛණ අංක 02) |

| | | |
|---|---|---|
| | මූල්‍ය සමාලෝචනය | |
| 3.1 | මූල්‍ය ප්‍රතිඵල | |
| | සමාලෝචිත වර්ෂයේ සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රුපියල් මිලියන 269.79 ක ඌනතාවක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රුපියල් මිලියන 282.84 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රුපියල් මිලියන 13.05 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. ඊට භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන වියදම් සඳහා ලද මුදල් රුපියල් මිලියන 172 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | |
| 3.2 | විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය | |
| | පසුගිය වර්ෂ කිහිපයක මූල්‍ය ප්‍රතිඵල සමාලෝචනය කිරීමේ දී සභාවෙහි මූල්‍ය ප්‍රතිඵලයෙහි අඛණ්ඩව වර්ධනය වන ඌනතාවයක් පවතින බව නිරීක්ෂණය විය. 2011 වර්ෂයේ දී රු. මිලියන 48.75 ක් වූ ඌනතාවය සමාලෝචිත වර්ෂය වන විට රු. මිලියන 269.78 දක්වා වර්ධනය වී තිබුණි. 2011 වර්ෂයට සාපේක්ෂව මෙහෙයුම් වියදම් හා තරුණ සංවර්ධන වියදම් පිළිවෙලින් රු. මිලියන 561.2 කින් (සියයට 86) හා රු. මිලියන 325.6 කින් (සියයට 71) වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. එමෙන්ම 2011 වර්ෂයේ රු. මිලියන 560 ක් වූ පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකය 2016 වන විට රු. 850 ක් දක්වා සියයට 52 කින් වර්ධනය වී තිබුණි. | |
| 4. | මෙහෙයුම් සමාලෝචනය | |
| 4.1 | කාර්ය සාධනය | |
| | පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| (අ) | සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධන වාර්තා අනුව, සභා පනතේ 4 වන වගන්තියේ සඳහන් ප්‍රධාන අරමුණු ඉටුකරගැනීම සඳහා සෘජු දායකත්වයක් දක්වන පහත සඳහන් වැඩසටහන් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළද ක්‍රියාත්මක කර නොතිබුණි | |

| සැලසුම්ගත වැඩසටහන | ඉලක්කය | ප්‍රතිපාදනය රු. | |
|---|---|---|---|
| බාධිත තරුණ සංවර්ධන වැඩසටහන් සිහිනය | වැඩසටහන් 01 ප්‍රතිලාභීන් 750 | 5,000,000 | මුල් ක්‍රියාකාරී සැලැස්මේ මෙම වැඩසටහන් 02 සඳහා ප්‍රතිපාදන ඇතුලත් කර තිබුනද අපේක්ෂිත ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් 2016 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම වරින්වර සංශෝධනයට ලක්විය. ඒ අනුව අවසාන වරට අනුමත කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ මෙම වැඩසටහන් 02 ඇතුලත්ව නැත. (උපලේඛණ අංක 03) |
| ශ්‍රී ලංකා යූත් පාර්ක් | මාතර දිස්ත්‍රික්කය ප්‍රතිලාභීන් 20,000 | 10,000,000 | |
| නිස්කෝ වීඩියෝ චිත්‍රාගාරය නවීකරණය | වැඩසටහන් 01 ප්‍රතිලාභීන් සියළුම තරුණ ප්‍රජාව | 11,400,000 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් මෙම වැඩසටහන සඳහා රු.11,400,000 ක ප්‍රතිපාදන වෙන්කර ඇතත්, 2015.12.23 දින කරන ලද සංශෝධනය අනුව මේ සඳහා වන ප්‍රතිපාදනය රු.මි.0.4 දක්වා අඩුකර ඇත. ඒ අනුව අදාළ කාර්යය ක්‍රියාත්මක කිරීමට නොහැකිවී ඇත. |

<table>
<tr><td>(ආ)</td><td colspan="5">සභාවෙහි සංවර්ධන සැලැස්මට අනුව ක්‍රියාත්මක කල වැඩසටහන් බොහොමයකින් අපේක්ෂිත ඉලක්කයන් ලඟාකරගෙන තිබුණ ද තරුණ තරුණියන්ට රැකියා අවස්ථා උදාකර ගැනීමට සෘජු සබඳතාවයක් ඇති පහත සඳහන් වැඩසටහන් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි.</td><td></td></tr>
<tr><td></td><td>සැලසුම්ගත වැඩසටහන</td><td colspan="2">වැඩසටහන් සංඛ්‍යාව</td><td colspan="2">ප්‍රතිලාභීන් ගණන</td><td></td></tr>
<tr><td></td><td></td><td>ඉලක්කගත</td><td>තථ්‍ය</td><td>ඉලක්කගත</td><td>තථ්‍ය</td><td></td></tr>
<tr><td></td><td>තරුණ සමූපකාර සංවර්ධන වැඩසටහන</td><td>04</td><td>01</td><td>178</td><td>58</td><td>2016 වාර්ෂික සැලැස්මට අනුව භාණ්ඩාගාර ප්‍රතිපාදන තුලින් නිස්කෝ තරුණ සංවර්ධන වැඩසටහන් සඳහා රු.250,000 ක මුදලක් අනුමත කරන ලද අතර, එම ප්‍රතිපාදන සීමාසහිත තරුණ සේවා සමූපකාර සමිති සංගමයේ මහා සභා නියෝජිතයින් 100 ක් පුහුණු කිරීම සඳහා වෙන්කරන ලදී. මෙම වැඩමුළුව සඳහා 58 දෙනෙකු සහභාගී වූ අතර, 2016 සැලැස්මට අනුව ඉලක්කගත වැඩසටහන් 01 ක් වශයෙන් ඇතුලත්ව ඇත.</td></tr>
<tr><td></td><td>උද්‍යාන අලංකරණ පාඨමාලාව</td><td>04</td><td>01</td><td>60</td><td>09</td><td rowspan="2">2015 වර්ෂයේ පූර්ව සැලසුම් සකස් කිරීම් වලදී නිපුණතා ආංශික ව්‍යාපෘතිය යටතේ මෙම පාඨමාලා සඳහා අරමුදල් ලබාගැනීමේ අපේක්ෂාව ඇතිව සැලසුම් කලද 2015 ආරම්භයේ අමාත්‍යාංශ මාරුවීම හේතුවෙන් මෙම වැඩසටහන් සඳහා ප්‍රතිපාදන ලබාගැනීමට නොහැකි විය.</td></tr>
<tr><td></td><td>රූම් බෝයි පාඨමාලාව</td><td>14</td><td>02</td><td>210</td><td>35</td></tr>
<tr><td>(ඇ)</td><td colspan="5">සමාජයේ ප්‍රජාතාන්ත්‍රිය රාමුවට තරුණ පරපුර අනුගත කිරීමේ අරමුණෙන් 2010 වර්ෂයේ ආරම්භ කළ යොවුන් පාර්ලිමේන්තු වැඩසටහනට 2015 වර්ෂය දක්වා එකතුව රු. 177,418,246 ක් ද, 2016 වර්ෂයේ දී රු. 47,030,032 ක් ද වැයකර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.</td><td></td></tr>
<tr><td>(i)</td><td colspan="5">මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ වියදමින් රු. 23,615,712 ක් එනම් සියයට 50 ක් යොවුන් පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට වැයකර තිබුණ ද, 334,026 ක් වූ ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 33 ක් එනම් ඡන්ද 112,367 ක් පමණක් ප්‍රකාශ කර තිබුණි.</td><td>මැතිවරණය පැවැත්වෙන කාල වකවානුව වර්ෂයේ අග භාගය වන බැවින් වර්ෂය මුල සහ මැද භාගයේ සක්‍රියව සිටින යෞවන යෞවනියන් බොහොමයක් වර්ෂය අවසන් වන විට තම පෞද්ගලික අධ්‍යාපන හා වෘත්තීය ඉලක්ක වෙත යොමු වන බැවින් එම කටයුතු වලින් බැහැරව මහ මැතිවරණයකදී තරම් උනන්දුවකින් ඡන්දය ලබා දෙන ස්ථානයට පැමිණීමට උනන්දුවක් නොදැක් වීම, කුඩා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල තරුණ නායක නායිකාවන්ට තේරීපත් වීමට ඇති ඉඩකඩ (ඔවුන්ගේ ලියාපදිංචි තරුණ තරුණියන්ගේ සංඛ්‍යාව අවම වන බැවින්) එම ප්‍රදේශයේ තරුණයින් ඡන්දය දැමීමට දක්වන අලස බව, යොවුන් පාර්ලිමේන්තු මැතිවරණයේ ඡන්ද ප්‍රතිශතය අවම වීමට බලපා ඇති ප්‍රධාන හේතු ලෙස හදුනා ගෙන ඇති අතර එම ගැටළු වලට පිළියම් ලෙස යොවුන් පාර්ලිමේන්තු මැතිවරණය වර්ෂය මුල් කාර්තුවෙම සිදුකිරීමටත්, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම සෑම ඡන්දයකටම නිසි වටිනාකමක් ලැබෙන අයුරින් ඡන්දය පැවැත්වීම සඳහා අවශ්‍ය සංශෝධන සිදු කිරීමටත් අවශ්‍ය පියවර ගනිමින් සිටී, කෙසේ නමුත් යොවුන් පාර්ලිමේන්තු මැතිවරණය තරුණයින් වෙත සමීප කිරීම සඳහා ගත් උපාය මාර්ගයන් නිසාවෙන් 2015 පැවති මැතිවරණයේදී ප්‍රකාශිත ඡන්ද ප්‍රතිශතය 17% සිට 2016 වන විට එය 33% දක්වා එනම් දෙගුණයකින් වර්ධනය කර ගැනීමට සමත් වී ඇත.</td></tr>
</table>

| | | |
|---|---|---|
| (ii) | 2015 හා 2016 වර්ෂ සඳහා එක් පාර්ලිමේන්තු වැඩසටහනක් පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ යටතේ සැසිවාර 5 ක් තුළ රැස්වීම් වාර 13 ක් පවත්වා තිබුණි. පැවැත් වූ රැස්වීම් වාර 13 සඳහා මන්ත්‍රීවරුන් 2,925 ක සහභාගීත්වයක් අපේක්ෂා කලද සත්‍ය සහභාගීත්වය 1,716 දෙනෙකු පමණක් විය. පළමු සැසිවාරය සඳහා පැමිණීමේ ප්‍රතිශතය සියයට 98 ක් වුවත් 4 වන හා 5 වන සැසිවාර සඳහා මන්ත්‍රීවරුන්ගේ පැමිණීමේ ප්‍රතිශතය සියයට 44 ක් දක්වා අඩු වී තිබුණි. | අදාල සටහනේ දැක්වෙන පරිදි 04 වන සහ 05 වන සැසිවාර සඳහා මන්ත්‍රීවරුන්ගේ පැමිණීමේ ප්‍රතිශතය 44% ක් ලෙස දක්වා තිබුනද සත්‍ය සහභාගීත්වය (පැමිණීමේ ලේඛන අනුව) එය පිළිවෙලින් 56.89% ක් සහ 57.33% ක් වේ. උපලේඛණ අංක 04 |
| (iii) | 2015/2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා යොවුන් පාර්ලිමේන්තු 5.1 ස්ථාවර නියෝගය අනුව එහි ගණ පූර්ණය 75ක් විය යුතු වුවත්, සිව්වන හා පස්වන සැසිවාර සඳහා පිළිවෙලින් මන්ත්‍රීවරු 60 ක් හා 57 ක් පමණක් සහභාගී වී තිබුණි. ඒ අනුව එම සැසිවාර දෙකෙහිම ගණ පූරණය 75 ට අඩු බැවින් එහි විධිමත් බවක් විගණනයේදී නිරීක්ෂණය නොවුණි. | අදාල සටහනේ දක්වා ඇති පරිදි සිව් වැනි සහ පස්වැනි සැසිවාර සඳහා මන්ත්‍රීවරුන්ගේ පැමිණීම 60ක් සහ 57 ක් ලෙස සටහන්ව තිබුනද සත්‍ය සහභාගීත්වය සිව්වන සභාවාරයේ 128 ක් සහ පස්වන සභාවාරයේ 129 කි. උපලේඛණ අංක 04 |
| (iv) | වාර්ෂිකව යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන නිම කරන මන්ත්‍රීවරුන්ට සමාජගත වීම සඳහා ඉදිරි වැඩපිළිවෙලක් සභාව සතුව නොමැති අතර, රැකියා වියුක්තව සිටි අයට රැකියා අවස්ථා උදා කර ගැනීමට හෝ එමගින් අවකාශ නොලැබෙන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | යොවුන් පාර්ලිමේන්තු වැඩසටහනේ අරමුණු අතර වැඩසටහනින් පසු ඔවුන්ට සෘජු රැකියා ලබා දීම පිළිබඳ සඳහන් නොවන නමුත් යොවුන් පාර්ලිමේන්තුව පිළිබද චක්‍රලේක සහ උපදෙස්හි සඳහන් ආකාරයට තරුණ තරුණියන් ස්වේච්ඡාවෙන් මෙම කාර්යයට සහභාගි විය යුතු අතර එමගින් ඔවුන් ලබන නායකත්ව, පෞරුෂ සංවර්ධන, වෘත්තීය කුසලතා සහ කලමණාකරන කුසලතා සෘජු ලෙසම ඔවුන්ගේ වෘත්තිය ජීවිතයට බද්ධ කළ හැකි වේ.<br><br>එමෙන්ම ඔවුන්ට මේ තුලින් ඇති වන සමාජ පිළිගැනීම, මහජන සම්බන්ධතා, වෘත්තිය අත්දැකීම් තුලින් ඉතා කඩිනමින් වෘත්තියකට ප්‍රවේශවීමේ ඉඩ කඩ ඇති වන බව පැහැදිළිය.<br><br>මේ නිසාම සිව්වැනි යොවුන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් උදෙසා විශේෂයෙන්ම වෘත්තිය මාර්ගෝපදේශනය, වෘත්තිය මාර්ග සැලසුම් කිරීම, වෘත්තීය කුසලතා ආකල්ප සංවර්ධනය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය යන ක්ෂේත්‍ර පිළිබඳව වැඩි දැනුමක් සහ පුහුණුවක් ලබා දීමට කටයුතු සැලසුම් කර ඇත. |
| (ඇ) | 2016 වර්ෂයේ ගොවිපල සංවර්ධන කටයුතුවලට වෙන් කළ වාර්ෂික ප්‍රතිපාදනය වූ රු. මිලියන 24.3 න් සියයට 71 ක් එනම් රු. මිලියන 17.2 ක් අදාල සංවර්ධන කටයුතු සඳහා යොදවා නොතිබුණු අතර විගණනයට ලබා දුන් තොරතුරු අනුව වගා කළ හැකි අක්කර 288 ක් වූ භූමි ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් අක්කර 108 ක් හෙවත් සියයට 37.5 ක් වල් බිහිවී තිබුණි. | ප්‍රතිපාදන ඉතිරිය සම්බන්ධ අදාළ පිළිතුර උපලේඛණ අංක 05 මගින් වේ. |
| 4.2 | කළමනාකරණ අකාර්යක්ෂමතා | |

| | | |
|---|---|---|
| | ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන් සැලැස්මට අනුව රත්මලාන පුහුණු මධ්‍යස්ථානයේ ගොඩනැගිලි නවීකරණය කර නව පාඨමාලා හඳුන්වාදීම තුලින් ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීමට සැලසුම් කර තිබුණි. අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට හා එහි ඉදිකිරීම් කටයුතු නඩිනමින් නිම කිරීමට සැලසුම්ගත වැඩපිළිවෙලක් නොමැතිව නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම 2014 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර 2016 වර්ෂය නිම වන විට ඒ සඳහා රු. 158,787,849 ක් වැය කර තිබුණ ද, එහි ඉදිකිරීම 2017 මැයි 30 දින වන විටත් නිම කර නොතිබුණි. ඒ අතර තුර කාලය සඳහා පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට 2014 වර්ෂයේ සිට කුලියට ලබාගත් බාහිර ගොඩනැගිල්ලේ සංවර්ධන කටයුතු සහ කුලිය වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට රු. 34,968,988 ක වියදමක් දරා තිබුණි. තවද පිළිගත හැකි පදනමකින් හා විධිමත් ගිවිසුමකින් තොරව සමාලෝචිත වර්ෂයේ මාර්තු සිට එම ගොඩනැගිල්ලේ මාසික කුලිය රු. 157,500 කින් වැඩිකර තිබුණි. | නිපුණතා සංවර්ධන වැඩසටහන මගින් රත්මලාන පුහුණු ගොඩනැගිල්ල නවීකරණය කිරීම මගින් පමණක් නව පාඨමාලා 10 ක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණත්, ගොඩනැගිල්ල නවීකරණයෙන් පමණක් ගොඩනැගිලි වර්ග ප්‍රමාණය වැඩි කිරීමට නොහැකි බව හඳුනාගෙන නොතිබුණි.<br><br>නව පාඨමාලා 10 සහ පවතින පාඨමාලා ප්‍රමිතීන්ට අනුකූල වන අකාරයට මහල් 04 ක් හා මුළු වටිනාකම රු.මි 220 ක ගොඩනැගිල්ලට අදාල සැලසුම් හා ඇස්තමේන්තු 2014 වර්ෂයේදි උපදේශක ආයතනය ඉදිරිපත් කර ඇත. එහෙත් නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන මගින් මෙම මුළු ප්‍රතිපාදන ප්‍රමාණයම 2014 වර්ෂයේ ලබා නොදීම නිසා අදියරයන් වශයෙන් වර්ෂ 3 කින් ගොඩනැගිල්ල නිම කිරීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ක්‍රියාත්මක වි ඇත. ඒ අනුව,<br><br>පළමු අදියර - 2014/09/11 සිට 2015/11/10 දක්වා ඉටුකර<br><br>දෙවන අදියර - 2016/03/10 සිට 2017/03/10 දක්වා ඉටුකර අවසන් වි ඇති අතර<br><br>අවසන් අදියර - 2016/11/11 සිට 2017/11/11 දින දක්වා ඉටු වෙමින් පවති. මේ වනවිට අවසන් අදියර 85% ක ප්‍රගතියක් ලබා ඇති අතර 2017/11/11 ගොඩනැගිල්ල භාර ගැනීමට සියල්ල සූදානම් කර ඇත. එබැවින් ඉදිකිරීම් නිමවන තෙක් තවදුරටත් බාහිර ගොඩනැගිල්ල කුලීපදනමට ලබාගත යුතු හෙයින් ඒ සඳහා ගිවිසුම්ගතවීමක් සිදුකරන ලදි. (උපලේඛණ අංක 06) |
| 4.3 | මෙහෙයුම් අකාර්යක්ෂමතා | |
| | පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ | |
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ සභාවේ පුහුණු මධ්‍යස්ථාන 49 ක ක්‍රියාත්මක කළ පුහුණු පාඨමාලා 471 ක් (පුහුණුව ලැබූ මුළු සිසුන් සංඛ්‍යාව 15,691 ක්) වූ අතර එය පූර්ණ කාලීන පාඨමාලා 201 කින් ( හැදෑරූ සිසුන් සංඛ්‍යාව 6,793 කි) සහ භාෂා පුහුණු පාඨමාලා 77 ක් ඇතුලුව අර්ධකාලීන පාඨමාලා 270 කින් (හැදෑරූ සිසුන් 8,898 ක් විය) සමන්විත විය. පාඨමාලා 471 න් 80 ක්ම ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) නොවන පාඨමාලා වූ බැවින් එම පාඨමාලා හැදෑරූ සිසුන්ට දේශීයව හා විදේශීයව පවතින රැකියා අවස්ථාවන්ට ඇතුල්වීමට මෙම පුහුණුව ඉවහල් කර ගැනීමට නොහැකි වනු ඇත. | භාෂා පුහුණු පාඨමාලා 77 අර්ධකාලීන පාඨමාලා වශයෙන් පවත්වනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් ලත් පාඨමාලා නොවන අතර, පූර්ණ කාලීන පාඨමාලා සඳහා පමණක් NVQ සහතික ලබාදෙනු ලබන අතර, ඒ අනුව දැනට ක්‍රියාත්මක වන පාඨමාලා වලින් ප්‍රතීතනය ලබාගැනීමට අයදුම් කර ඇත. එහෙත් තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් මෙම පාඨමාලා ප්‍රතීතනය කිරීම සඳහා කටයුතු නොකිරීම හේතුවෙන් විශාල ප්‍රමාදයක් සිදුවී ඇත. එබැවින් මේ පිළිබඳව නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වෙත දැනුම්දී ඇත. පුහුණු මධ්‍යස්ථාන ආශ්‍රිතව සතිඅන්තව ක්‍රියාත්මක වන අර්ධ කාලීන පාඨමාලා හැදෑරීම සඳහා පැමිණෙන සිසුන් බහුතරයක් රැකියාගත වූවන් වන බැවින් ඔවුන් නිරත ඇති වෘත්තිය මට්ටම වැඩිදියුණු කරගැනීම සඳහා එය ඉවහල් වනු ඇත. |
| (ආ) | ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ හලාවත පුහුණු මධ්‍යස්ථානය සඳහා රු. 7,932,900 ක් වැයකර පරිගණක 75 ක් මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| (i) | මෙම මිලදී ගැනීම සඳහා ජාතික තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කල යුතු වුවත් ඒ සඳහා වෙළඳ පොල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර තිබුණි. | මේ භාණ්ඩ මිළදී ගැනීමේදි වෙළඳපොල මිළ සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීම සුදුසු නැති බැවින් ඒ සම්බන්ධයෙන් සැපයුම් නිලධාරීන් කැඳවා අවවාද කරන ලදි. ඉදිරියේදි මෙවැනි මුදලක් වැය කරන අවස්ථාවලදි ජාතික තරඟකාරී |

| | | |
|---|---|---|
| | | ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කලයුතු බවට උපදෙස් දී ඇත. |
| (ii) | මිල ගණන් ඉදිරිපත් කල ආයතන 05 කින් 03 ක් හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කර තිබුණි. | මිළ ගණන් ඉදිරිපත් කල ආයතන අතරින් වැඩිම මිළ ඉදිරිපත් කල ආයතනයත් අඩුම මිළ තිබෙන ආයතනයක් පමණක් සැලකිල්ලට ලක්කරමින් තාක්ෂණික කමිටුව විසින් වාර්තාව සකස් කර ඇත. මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති සැලස්මට අනුව සියලුම ආයතනවල තත්ත්වයන් පරික්ෂාවට ලක්කර තාක්ෂණික වාර්තාව සැකසීමට තාක්ෂණික ඇගයීම් කමිටුවට උපදෙස් ලබාදී ඇත. |
| (iii) | මිලදීගෙන තිබූ පරිගණක 75 න් 07 ක් විවිධ තාක්ෂණික දෝෂ හේතුවෙන් මිලදීගත් අවස්ථාවේ සිටම ක්‍රියා විරහිතව තිබුණු අතර පරිගණක දෙකක් සඳහා VGA සපයා නොතිබුණි. අනෙකුත් පරිගණක සඳහා සපයා තිබූ VGA විවිධ ධාරිතාවයන්ගෙන් යුක්තව තිබුණි. | මේ සම්බන්ධයෙන් හලාවත පුහුණු මධ්‍යස්ථානයෙන් විස්තර වාර්තාවක් ගෙන්වාගෙන ඇත. එම වාර්තාව තුල මෙවැනි සදහනක් නැත.<br>(උපලේඛන අංක 07) |
| (iv) | මිලදී ගැනීම සඳහා විධිමත් ටෙන්ඩර් ලියවිලි (Bid document) භාවිතා කර නොතිබුණු අතර ඊට අදාලව සකස් කරන ලද පිරිවිතරයන් හි පරිගණක පුහුණු මධ්‍යස්ථානයට අවශ්‍ය කරන පරිගණකයක තිබිය යුතු පහත සඳහන් අත්‍යවශ්‍ය අංග 06 ක් ඇතුලත් කර නොතිබුණි.<br>- Chip set<br>- Memory (RAM) Capacity<br>- Hard Capacity<br>- Ms office License<br>- Warranty Period<br>- Separate VGA Card | මෙම පරිගණක මිළදීගෙන ඇත්තේ විශේෂ පරිගණක පුහුණු ( Auto cad, Photo shop ) සඳහා පරිගණක පුහුණු සහතිකපත් පාඨමාලාව හා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා වේ. එබැවින් මෙම පරිගණක මිළදි ගැනිමේදි විශේෂ අවශ්‍යතාවයන් අවශ්‍ය නොවන අතර 23-5th Generation සඳහා ලැබෙන සම්මත තත්ත්වයන් ප්‍රමාණවත් බැවිනි. |
| (v) | ඉහත පරිගණක 75 න් 03 ක් Power Frailer හේතුවෙන් ද , 02 ක් මෘදුකාංග දෝෂ හේතුවෙන් ද, CPU ප්‍රශ්නයක් මත පරිගණක 02 ක්ද, පුහුණු මධ්‍යස්ථානයට සපයන ලද අවස්ථාවේ සිටම ක්‍රියාත්මක කළ නොහැකිව තිබුණු බව 2016 දෙසැම්බර් 20 දින සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂාවේ දී හෙළිදරව් විය. එමෙන්ම සැපයූ පරිගණක 75 න් පරිගණක 2 ක් සඳහා VGA විගණන දින වන විටත් සපයා නොතිබුණු අතර පරිගණකවලට ඇතුලත් කර තිබූ VGA විවිධ ධාරිතාවන්ගෙන් යුක්ත බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | හලාවත මධ්‍යස්ථානයේ මෙවැනි තත්වයක් පිළිබඳ මධ්‍යස්ථාන භාර නිලධාරි වාර්තා කර නොමැත |
| (vi) | මීට අදාලව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1 ප්‍රකාරව විධිමත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණු අතර මාර්ගෝපදේශ 5.4.10 ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් තබාගැනීමට හා ගෙවන මුදලින් යම් ප්‍රතිශතයක් ගිවිසුම් ගත කාල පරිච්ඡේදයක් සඳහා රඳවා තබාගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කටයුතු කල නිලධාරීන්ගේ නොදැනුවත්කම මත මෙම අඩුපාඩුව සිදුවී ඇති බව පිලිගනිමි. කෙසේ වුවද ඉදිරි කාලයේදී නිවැරදි ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කරන ලෙස උපදෙස් දුනිමි. |
| 4.4 | මතභේදයට තුඩු දෙන ගනුදෙනු | |
| | 1999 ඔක්තෝබර් 11 දිනැති අංක 1101/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් කෘෂිකාර්මික හා සත්ත්ව පාලන කටයුතු සඳහා භාවිතා කිරීමේ කොන්දේසි මත රු. 3,750,000 වටිනාකමකට 1999 සැප්තැම්බර් 14 දින සභාවට පවරා දී තිබුණු අක්කර 26 යි රූඩ් 01 යි පර්. 15.5 ක ඉඩමෙන් අක්කර 11 ක් පමණ කොටස විධිමත් පැවරීමකින් තොරව භාණ්ඩාගාර අනුමැතිය සහ විෂය භාර අමාත්‍යතුමියගේ එකඟතාවය මත 2007 වර්ෂයේ සිට ආරක්ෂක අමාත්‍යාංශයේ පුහුණු මධ්‍යස්ථානයක් වෙනුවෙන් ලබාදී තිබුණි. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම මැතිවරණ කොට්ඨාශයේ පිටිහි හෙයියන්තුඩුව වත්ත ඉඩම වන අතර, මෙකී ඉඩමෙන් ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය සඳහා නිදහස් කර ඇත්තේ රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් ගේ අංක:PF/FS/01 හා 2008.06.27 දිනැති ලිපිය හා තරුණ කටයුතු අමාත්‍යංශයේ ලේකම් ගේ අංක: MYA/3/9/1/16 හා 2008.10.08 දිනැති ලිපි වලට අනුව ලබාදී ඇති බව දන්වමි.<br>(උපලේඛණ අංක 08) |

| | | |
|---|---|---|
| 4.5 | නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම් | |
| | පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| (අ) | ප්‍රධාන කාර්යාලයේ ගබඩාව තුළ වසරකට අධික කාලයක සිට රු. 1,784,200 ක් වටිනා කාණ්ඩ 05 කට අයත් ක්‍රීඩා භාණ්ඩ අයිතම 1,972 ක තොගයක් නිෂ්කාර්යයව පැවතුණි. | මෙම භාණ්ඩ නිකුත්කිරීම් සිදුකර ඇතත් ඒ පිළිබඳ විස්තර තොගපොත් වල සටහන් නොකිරීම නිසා මෙවැනි තත්ත්වයක් පෙන්නුම් කර ඇත. මේ වන විට එම ශේෂයන් ඇමුණුමේ දක්වා ඇති පරිදි බව කාරුණිකව දන්වමි. පොත්පත් යාවත්කාලීන නොකිරීම සම්බන්ධව ගබඩාභාරකරුවන්ගෙන් කරුණු විමසා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කෙරේ.<br>(උපලේඛණ අංක 09) |
| (ආ) | අවශ්‍යතාවය නිසි ඇගයීමකට ලක් නොකර 2016 යෞවන ක්‍රීඩා උළෙල වෙනුවෙන් 2016 සැප්තැම්බර් මස මිලදීගෙන ගබඩාවට භාර දී තිබූ හිස් වැසුම් (කැප්) 3,550 කින් වටිනාකම රු. 416,058 ක් වූ හිස් වැසුම් (කැප්) 2,550 ක් විගණන දිනය වූ 2017 අප්‍රේල් 27 දින වන විටත් ගබඩාවේ පවතින බව නිරීක්ෂණය විය. | |
| (ඇ) | තරුණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.3,330,000 ක් වැය කර 2000 ජූලි 07 සිට අවුරුදු 50 ක බදු කාල සීමාවකට නාගරික සංවර්ධන අධිකාරියෙන් මිලදීගත් බේරුවල පිහිටි අක්කර 01 ක ඉඩම සංවර්ධනය කිරීම සඳහා තවත් රු. 467,184 ක් වැයකර 2016 වර්ෂය අවසන් වන විට පුරා වසර 16 ක් ගතවී ඇතත් එය කිසිදු ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා යොදාගෙන නොතිබුණි. | බේරුවල ඉඩම සංවර්ධනයට මූලික පියවරක් ලෙස ආරක්ෂිත වැටක් ඉදිකර අවසන් කර ඇති අතර, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් තරුණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා අරමුදල් ලබාදීමට එකඟ වී ඇති බැවින්, ඉදිකිරීමට අපේක්ෂිතය. |

| | | |
|---|---|---|
| 4.6 | ආර්ථික නොවූ ගනුදෙනු | |
| | පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| (අ) | සභාවට අයත් පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල හා පුහුණු මධ්‍යස්ථානවල නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් තැබීම වෙනුවෙන් ඇඟිලි සලකුණු යන්ත්‍ර 60 ක් මිලයට ගැනීම වෙනුවෙන් අවස්ථා දෙකක දී සභාව විසින් එකතුව රු. 2,793,167 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණ ද, ඉන් යන්ත්‍ර 09 ක් විගණන දිනය වූ 2017 මැයි 31 දින වන විටත් සපයා නොතිබුණි. සපයන ලද යන්ත්‍ර 51 න් අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමට හැකි වී තිබුණේ යන්ත්‍ර 3 ක් පමණි. සවිකරන ලද යන්ත්‍ර 29 කට මෘදුකාංග ඇතුළත් කර නොතිබුණු අතර මෘදුකාංග ඇතුළත් කර ඇතත් පැමිණීමේ වාර්තා ලබාගැනීමට නොහැකිව පැවති යන්ත්‍ර ගණන 16 කි. මෙම සැපයුමට අදාලව කාර්යසාධන ඇපකරයක් ලබාගැනීමකින් තොරව සහ යන්ත්‍ර නියමිත ප්‍රමාණයෙන් හා අපේක්ෂිත ගුණත්වයෙන් සපයා ඇති බවට කිසිදු තහවුරුවක් ලබා නොගෙන ඉහත මුදල ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. | බස්නාහිර පළාත තුල මෙය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අදාළ සැපයුම්කරු කටයුතු කර ඇත. අනෙකුත් පළාත් වලට මෙය ව්‍යාප්ත කිරීමට කටයුතු සිදුවෙමින් පවතී.<br>මේ දක්වා ගෙවා ඇත්තේ නියමිත මුදලින් 50% ක් පමණි.<br>සපයා නොමැති යන්ත්‍ර ඒ ඒ ස්ථාන වලට සපයන ලෙස සැපයුම්කරුට උපදෙස් දී ඇත. |
| (ආ) | ජාතික තරුණ සේවා සභාව විසින් යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන යටතේ මන්ත්‍රීවරුන් වෙත බෙදා හැරීම සඳහා රු. 15,859,500 ක් වැයකර ටැබ් පරිගණක 327 ක් මිලදී ගෙන තිබුණු අතර ඒ පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| (i) | මෙම ගනුදෙනුව විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට අනුකූලව සිදුකර නොතිබුණි. | **මෙම ටැබ් යන්ත්‍ර මිලදී ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් මගින් මිල ගණන් කැඳවා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති එසේම විශේෂ පහසුකමක් සැපයිය හැකි බවද සැලකිල්ලට ගෙන මිලදී ගෙන තිබුණි.** |
| (ii) | ටැබ්යන්ත්‍ර 23 ක් ගබඩාවට භාරදෙන අවස්ථාව වන විටත් ක්‍රියාකාරී තත්වයේ නොපැවතුණි. | **ගබඩාවට භාරදෙන අවස්ථාවේ දී ටැබ් යන්ත්‍ර 23 ක් අක්‍රියව පැවති බවට තොරතුරු සැපයීම් අංශයට ලැබී නොමැත.** |
| (iii) | සැපයූ ටැබ් පරිගණක යන්ත්‍ර බොහෝ දෝෂ සහිත බව මන්ත්‍රීවරුන් ප්‍රකාශ කර තිබුණි. | **මෙම ටැබ් යන්ත්‍ර පරිහරණය කරන ලද මන්ත්‍රීවරුන් විසින් ඒවා දෝෂ සහිත ටැබ් පරිගනක බවට වාර්තාකර නොමැත.** |
| (iv) | වෙළඳපොල සාමාන්‍ය මිල ගණන් වලට වඩා ඉතා ඉහළ මිලකට පරිගණක මිලදී ගෙන තිබීම හේතුවෙන් එම ගනුදෙනුවෙන් සභාවට අවම වශයෙන් රු. 5,000,000 අලාභයක් සිදුවී තිබුණි. | **මිල ගණන් කැඳවීමේදී ආයතන 04 කින් මිල ගණන් ලබාගෙන තිබූ අතර, මිල ගණන් කැඳවීම පුවත්පත් මගින් සිදුකර ඇත. තාක්ෂණය දිනෙන් දින නව්‍යතාවයට පත්වන බැවින් හා විවෘත වෙළෙඳපලේ විවිධ නිෂ්පාදන මීට වඩා අඩු මිළගණන් යටතේ තිබිය හැක. මෙම ටැබ් යන්ත්‍රය තෝරා ගැනීමට ප්‍රථම අදාල පිරියත තාක්ෂණික කමිටුවක් විසින් ඇගයීමකට ලක්කර ඇත. ඒ අනුව අවම මිල හා පිරිවිතර සංසන්දනයන් කිරීමෙන් අනතුරුව මෙම මිලදී ගැනීම සිදුකර ඇත.** |
| (ඇ) | 2016 යොවුන්පුර ජාතික වැඩසටහනට සහභාගීවන තරුණ තරුණියන් වෙත බෙදාහැරීම සඳහා ටී ෂර්ට් 13,500 ක් මිලදී ගැනීමට තීරණය කර ඉන් ටී ෂර්ට් 7,128 ක් රු. 865 බැගින් ද, ටී ෂර්ට් 1500 ක් රු 875 බැගින් ද, රු. 750 බැගින් ටී ෂර්ට් 2500 ක් සහ රු.775 බැගින් ටී ෂර්ට් 800 ක්ද වශයෙන් ටී ෂර්ට් 11,928 ක් රු. 9,973,220 ක් වැයකර මිලදීගෙන තිබුණි. ඊට අදාල විගණන නිරීක්ෂණ පහත පරිදි වේ. | |
| (i) | මිලදී ගැනීමේ අවශ්‍යතාවය තීරණය කර අවශ්‍ය ප්‍රතිපාදන ලැබී තිබිය දී සැපයීම් අංශය විසින් මිල ගණන් කැඳවීම අසාමාන්‍ය ලෙස ප්‍රමාද කර තිබුණි. | සැපයීම් අංශය මගින් මිළ ගණන් ප්‍රමාද කිරීමක් පිළිබඳව නිරීක්ෂණය නොවේ. |

| | | |
|---|---|---|
| | | ටී ෂර්ට් සඳහා මිල ගණන් කැඳවීමට, සකස් කල යුතු ටී ෂර්ට් වල ආකෘතියක් ලබාදිය යුතුය. සහභාගිවන තරුණ තරුණියන්ට නිලධාරින්ට අවශ්‍ය වන්නේ කුමණ ප්‍රමාණවලින් කොපමන ද යන්න දිස්ත්‍රික්කවලින් ලබාගත යුතුය.<br><br>2016 යොවුන්පුරය වැඩසටහන අවුරුදු 27කට පමණ පසු ක්‍රියාත්මක කල වැඩසටහන් බැවින් සාකච්ඡා වට කීපයකින් පසු වඩාත් නිවැරැදිව අවශ්‍යතාවයන් තෝරාගෙන පූවත්පත් දැන්වීම පලකල යුතු බැවින් මුල් අවස්ථාවේම එනම් ජනවාරි 05 හෝ ඊට ආසන්න දිනකදී පූවත්පත් දැන්වීම පලකර නොමැති බව නිරික්ෂණය කරමි.<br><br>අවශ්‍යතාවයෙන් අවශ්‍යතාවයට, පුවත්පත් දැන්වීම පල කිරිම අනාර්ථක ක්‍රියාවක් වන නිසාවෙනි. |
| (ii) | මිලදී ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව සිදුකර නොතිබුණි. | ටී ෂර්ට් මිලදී ගැනීම ජාතික තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කර සිදුකර ඇත. එහෙත් මිල ගණන් ඉදිරිපත් කර ඇත්තේ ආයතන දෙකක් පමණි. මිළ ගණන් විවෘත කර අවම මිළ ගණන් ඉදිරිපත් කල ආයතනයට කැඳවීම් කළේ 2016.03.21 දිනය.මෙය ඉටුකල නොහැකි බව එම ආයතනයේ නිලධාරියෙකු මෙම කාර්යාලයට පැමිණ තමා සතුව ඇත්තේ මැෂින් 50 ක් පමණක් බැවින් මෙම ටී ෂර්ට් ප්‍රමාණය සම්පූර්ණ කල නොහැකි බව දන්වන ලදි. ඒ පිළිබඳව ලිපියක් ඉල්ලුව ද එය ප්‍රතික්ෂේප කර ලදි. |
| (iii) | අවම මිල ඉදිරිපත් කල හා තෝරාගත් සැපයුම්කරු වෙත විධිමත් පරිදි ප්‍රසම්පාදනය ප්‍රදානය කර නොතිබුණි. | මෙම ආයතනයට අදාළ ප්‍රසම්පාදන තීරණය 2016.03.19 දින ලබාගෙන ඇත. ඒ අනුව එදිනම එම ආයතනයට ලිපිය තැපැල් කර කඩිනම් අවශ්‍යතාවය මත දුරකථනයෙන් ද දැනුම්දී ඉහත කී නිලධාරියා මෙම කාර්යාලයට ගෙන්වා ගන්නා ලදි. |
| iv) | තෝරාගත් සැපයුම්කරු වෙත ප්‍රසම්පාදනය ප්‍රදානය කල බව සඳහන් දිනයේම දෙවන අවම මිල ඉදිරිපත් කල සැපයුම්කරුගෙන් මිලදී ගැනීමට ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය ලැබී තිබුණු අතර එදිනම ටී ෂර්ට් 7,128 ක් සභාවෙහි ගබඩාව වෙත සපයා තිබීම. | ඉහත (ii) හා (iii) අනුව එම ආයතනයට දුන් ඇණවුම 2016.03.21 දින අවලංගු කර ඔහුගේ ලංසු සුරක්ෂණ ඇපකරය නිදහස් නොකරන ලෙස බැංකුවට දන්වන ලදී. ඉන් පසුව 2016.03.21 දින ඊළඟ අඩුම මිළ ඉදිරිපත් කල කැනිල්ටා ආයතනයට අදාළ ප්‍රසම්පාදන තීරණය ලබාගන්නා ලදී. එහෙත් පරිගණකයේ ඇති ප්‍රසම්පාදන ආකෘතියම දෙවන තීරණය සඳහාද යොදා ගෙන ඇති බැවින්, දෙවන තීරණය පමණක් වෙනස් කර මුද්‍රණය කරගෙන ඇත. ඒ අනුව 2016.03.19 දිනය වෙනස් කිරීමට අමතක වීමකින් මෙම වරද සිදුවී ඇත. ඒ අනුව එකම දිනයකදී ප්‍රසම්පාදන තීරණ දෙකක් ලබාගෙන නොමැති බව කාරුණිකව දන්වමි. එසේම එම දිනයේම ටී ෂර්ට් 7128 ක් ගබඩාවට භාරදී නැති බව කාරුණිකව දන්වමි. වරින්වර ලැබුණු ටී ෂර්ට් සියල්ල එකතුකර ගබඩා භාරකරු විසින් පසුදිනක භාරගත් සියළු ම ටී ෂර්ට් සඳහන් කරමින් 2016.03.24 දිනට මෙම ටී ෂර්ට් සියල්ලම ලැබුණු ලෙස ලබාදී ඇති තොග සහතිකය සාවද්‍ය බව කාරුණිකව දන්වමි. මෙලෙස නොසැකිල්ලෙන් තොග සහතික නිකුත් කිරීම සම්බන්ධයෙන් අදාළ ගබඩා භාර නිලධාරියාට තරයේ අවවාද කර ඇත. ඇත්ත වශයෙන්ම 2016.03.24 දින කැනිල්ටා ආයතනයෙන් භාරදී ඇත්තේ ටී ෂර්ට් 1400 ක් පමණි. ඒ වෙනුවෙන් රු.1,000,000 ක මුදලක් ගෙවා ඇති බව අදාළ වව්චරයෙන් තහවුරු වේ. (උපලේඛණ අංක 10) |
| (v) | එක් දිනක් තුළ වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය මත තවත් ටී ෂර්ට් 4,800 ක් මිලදී ගැනීමට කටයුතු කිරීම හා ඉන් ටීෂර්ට් 1,500 ක් වැඩසටහන නිමවීමෙන් දින 2 කට පසු සපයා තිබීම. | රේන්වෙයාර් ඇපරල් ආයතනය ටී ෂර්ට් සැපයීම ප්‍රතික්ෂේප කිරීම නිසා දෙවැනි ආයතනයට ලබාදුන්නද සියළු ටී ෂර්ට් ලබාදීමට එම ආයතනයට හැකියාවක් නොමැති බව දැන්වීමෙන් අනෙකුත් ටී ෂර්ට් 4800 සපයා ගැනීමට තවත් ආයතන 03 ක |

| | | |
|---|---|---|
| | | සහය ලබාගැනීමට සිදුවිය. එහෙත් මෙම සියළුම ටිෂර්ට් යොවුන් පූරය ආරම්භ කිරිමට ප්‍රථමව සහ ආරම්භ කර පළමු දිනය තුලදී ලැබී ඇති බව ඡායාරූප මගින් පැහැදිලි වේ. |
| (vi) | තාක්ෂණික කමිටු නිර්දේශයෙන් තොරව මෙම මිලදී ගැනීමට අදාලව රු. 1,932,500 ක් ගෙවා තිබුණි. | නිලධාරි ටී ෂර්ට් මාධ්‍ය වෙදින්ගේ ටී ෂර්ට් සහාය කණ්ඩායම් ටී ෂර්ට් යන මෙ සියළුම ටී ෂර්ට් ඉතා හදිසියේ මසා ලබාගැනීමට සිදුවූ බැවින් මසා නිම කිරිමෙන් පසු තාක්ෂණික වාර්තාවක් ලබා ගැනීමට අවස්ථාව ලැබී නැත. |
| | ඉහත සඳහන් කරුණු අනුව ඉදිරිපත් වූ අවම මිල නොසලකා දෙවන අවම මිලට ටී ෂර්ට් 11,928 ක් මිලදී ගැනීමෙන් සභාවට රු. 1,848,840 ක අලාභයක් සිදුවී තිබුණි. | 2016.03.19 දින සකස් කර ඇති පළමු ප්‍රසම්පාදන පත්‍රිකාවෙන් අවම මිළ ඉදිරිපත් කරන ලද රේන්වෙයාර් ඇපරල් ආයතනයට ටී ෂර්ට් මැසිම ප්‍රධානය කර ඇත. එහෙත් එම ආයතනය එම කාර්යය ඉටුකිරීමට නොහැකි බව වාචිකව දැන්වූ නිසා දෙවන ආයතනයට සහ අනෙකුත් ආයතන වලට ටී ෂර්ට් මැයීම ලබාදීමට සිදුවී ඇත. |
| 4.7 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ දුර්වලතා | |
| | යොවුන් පාර්ලිමේන්තු වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක කරන ලද යූත් ගොට් ටැලන්ට් වැඩසටහන යටතේ දිවයින පුරා යෞවන සමාජ මට්ටමින් ක්ෂේත්‍රයන් 06 ක් ඔස්සේ ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති 1,500 ක් ක්‍රියාත්මක කිරීම සඳහා එක් ව්‍යාපෘතියකට රු. 75,000 බැගින් රු. 112,500,000 ක් සභාවෙහි දිස්ත්‍රික් කාර්යාල වෙත ලබා දී තිබුණි. අනුමත ව්‍යාපෘති වලට අදාල තාක්ෂණික නිලධාරී සහතික කරන ලද ඇස්තමේන්තු පදනම් කර රු. 50,000 ක් මුල් අදියරයේ දී හා කළ වැඩ සහතිකය පදනම් කරගෙන ඉතිරි රු. 25,000 ක මුදල ගෙවීමට නියමිතව තිබුණි. ඊට අදාල විගණන නිරීක්ෂණ පහත සඳහන්වේ | |
| (අ) | ක්ෂේත්‍රයන් 06 ක් ඔස්සේ ව්‍යාපෘති තෝරාගත හැකිව තිබුණත් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 1,500 න් 1,375 ක් ම පොදු අවශ්‍යතා මත පදනම් වූ ව්‍යාපෘති වූ අතර ප්‍රාදේශීයව සුවිශේෂී වූ එක් ව්‍යාපෘතියක් හෝ ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම තෝරාගත් අනෙකුත් ක්ෂේත්‍රයන් ආර්ථික සංවර්ධනයට මෙන්ම නව රැකියා උත්පාදනයට ඉලක්ක කර සැලසුම් කර ඇතත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දිරිගැන්වීම් සිදු වී නොතිබුණි. | ජාතික තරුණ සේවා සභාව හරහා ලබාදෙන රු:75,000.00 ක මුදලට අමතරව ප්‍රදේශයේ ධන පරිත්‍යාගශීලීන් මගින් සපයා ගනු ලබන ප්‍රතිපාදන මත මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබන අතර, තරුණ කොටස් ප්‍රමුඛතාවය දෙනු ලබන යෝජනා ප්‍රාදේශීය කමිටුවක් මගින් තෝරා ක්‍රියාත්මක කරනු ලබයි.<br>එවැනි පසුබිමක ලබාදී ඇති අනෙකුත් ක්ෂේත්‍රයන් ඔස්සේ ව්‍යාපෘති ආරම්භ කිරීමේදී වැඩි පිරිවැයක් දැරීමට සිදුවීමත්, ඒ සඳහා යෞවන සමාජ සාමාජික සාමාජිකාවන්ට මුහුණ පෑමට සිදුවන අභියෝග හමුවේ ඇතිවන ගැටළුකාරි තත්ත්වයන් සැලකිල්ලට ගෙන ග්‍රාමීය ප්‍රජාවගේ ඉල්ලීම් හා අපේක්ෂාවන් වෙනුවෙන් පොදු අවශ්‍යතා මත පදනම් වූ ව්‍යාපෘති තෝරා ගැනීමට සිදුවූ බවත් අනාවරණයවේ. |
| (ආ) | ව්‍යාපෘති ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක 12 කින් ලැබුණු තොරතුරු අනුව, 2016 නොවැම්බර් 12 දින වන විට නිම කළ යුතු ව්‍යාපෘති 493 කින් සභාව විසින් රු. 12,150,000 ක් නිදහස් කරන ලද ඇස්තමේන්තු පිරිවැය රු. 75,841,473 ක් වූ ව්‍යාපෘති 162 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි. නිම නොකරන ලද එම ව්‍යාපෘති සම්බන්ධයෙන් පසු විපරම් වැඩපිළිවෙළක් නොමැතිවීම හේතුවෙන් ඒවායේ ක්‍රියාත්මක වීම අවිනිශ්චිත බව විගණනයේ දී නිරීක්ෂණය විය. | 2016 වර්ෂයේ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව 2016 අගෝස්තු 13 සිට නොවැම්බර් 12 දින දක්වා වූ මාස 03 ක කාලසීමාව වූවද, විවිධ ප්‍රදේශවල එම කාල සීමාව තුල ඇතිවූ ස්වභාවික හා පාරිසරික තත්ත්වයන් හේතුවෙන් හා ව්‍යාපෘති සඳහා තරුණ සේවා සභාවෙන් ලබාදුන් රු: 75,000/= ක මුදලට අමතරව ව්‍යාපෘතියේ පිරිවැය වෙනුවෙන් අවශ්‍ය අනෙකුත් ප්‍රතිපාදන සපයා ගැනීමේ විවිධ දුෂ්කරතා හේතුවෙන් එම කාලසීමාව තුල ව්‍යාපෘති නිම කිරීමට නොහැකිවී ඇති බව සඳහන් වේ. එමෙන්ම, එම කාලපරිච්ඡේදය තුළ ජාතික තරුණ සේවා සභාව හරහා ක්ෂේත්‍රයේ තවත් බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහාද එම තරුණ සේවා නිලධාරින් යොමුවීමද මෙම ව්‍යාපෘති අවසන් කිරීම කල්ගතවීමට හේතුවක් වූ බව අනාවරණයවේ. |

| | | |
|---|---|---|
| | | 2016 වර්ෂයේ නිම කර නොමැති ව්‍යාපෘති සම්බන්ධයෙන් අවධානය යොමුකර, වැඩ අවසන් කොට නොමැති ව්‍යාපෘතිවල වැඩ කටයුතු නිම කර ජනතා අයිතියට පත් කරන ලෙස දන්වමින් සහකාර අධ්‍යක්ෂ (විශේෂ ව්‍යාපෘති) ගේ අත්සනින් යුතුව ජා.ත.සේ.ස/වි.ව්‍යා/YWT/2017 හා 2017.06.02 දිනැති ලිපියෙන් සියළුම දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇත. |
| (ඈ) | ඉහත වැඩසටහන යටතේ ත්‍රිකුණාමලය, කොළඹ, ගම්පහ සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක 04 හි ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 39 ක් 2017 පෙබරවාරි හා මාර්තු මාසවල භෞතිකව පරීක්ෂාවට ලක් කරන ලද අතර ඊට අදාල තොරතුරු පහත සඳහන් වේ. | |
| (i) | තාක්ෂණ නිලධාරී සහතික කර එවනු ලබන පිරිවැය ඇස්තමේන්තු හා කල වැඩ වාර්තා මත පදනම්ව සභාව විසින් මුදල් නිදහස් කරනු ලැබුවද විගණන නියැදි පරීක්ෂාවට භාජනය වූ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 6 කට අදාලව තාක්ෂණික නිලධාරී විසින් සහතික කළ වැඩවල වටිනාකම රු. 1,288,196 ක් වුවද සත්‍ය වශයෙන් නිමකර තිබූ වැඩවල වටිනාකම රු. 678,366 ක් පමණ විය. | ප්‍රාදේශීය වශයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී තාක්ෂණ නිළධාරින්ගේ පිරිවැය ඇස්තමේන්තු හා කලවැඩ වාර්තා අනුව ජාතික තරුණ සේවා සභාවෙන් ලබාදෙන රු: 75,000/= ක මුදල, රු: 50,000/= හා රු: 25,000/= වශයෙන් වාරික 02 ක් යටතේ නිදහස් කිරීමට කටයුතු කරන ලද අතර, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තාක්ෂණික නිළධාරි විසින් සහතික කල වැඩවල වටිනාකමට වඩා අඩු වටිනාකමක්, සත්‍ය වශයෙන් නිමකර තිබූ වැඩවල වටිනාකම බව ඔබගේ විමසුම් තුලින් පෙන්වා දී ඇත.<br>මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය සභාවල සේවයේ නිරත කාර්මික නිළධාරින්ගේ සේවය යොදා ගැනුන අතර, ඔවුන් විසින් ලබාදෙනු ලබන වාර්තා සැලකිල්ලට ගෙන යෞවන සමාජ වෙත මුදල් නිදහස් කිරීම සිදුකර ඇත. ඔවුන්ගෙන් මෙම සේවය ලබා ගැනීම වෙනුවෙන් ජාතික තරුණ සේවා සභාවෙන් ලබා දෙනු ලබන ගෙවීම රු: 1000.00 ක් වූ අතර, ඔවුන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවරෙන අනෙකුත් සියළු රාජකාරීන්ට අමතරව මෙම කාර්යයද සිදුකර ඇති අතර, මේ පිළිබඳව විශේෂ සොයා බැලීමක් සිදු කරගෙන යනු ලබයි. |
| (ii) | අරමුදල් නොමැති වීම මත ඇස්තමේන්තු ගත පිරිවැය රු. 814,252 ක් වූ ව්‍යාපෘති 05 ක් අත්හැර තිබුණු අතර ඇස්තමේන්තුගත පිරිවැය රු. 5,369,000 ක් වූ වෙනත් ව්‍යාපෘති 17 ක ඉදිකිරීම් කටයුතු 2017 පෙබරවාරි අවසන් වන විටත් අවසන් කර නොතිබුණි. එමෙන්ම අපේක්ෂිත ප්‍රමිතයට අනුව සිදු නොකළ පිරිවැය රු. 831,234 ක් වූ ව්‍යාපෘති 04 ක් පැවති අතර වැඩ නිමකර ඇතත් ප්‍රයෝජනයට නොගෙන තිබුණු රු. 814,120 ක පිරිවැය වූ ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් සභාව රු. 225,000 ක් ලබාදී තිබුණි. | 2016 ප්‍රජා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ එක් ව්‍යාපෘතියක් වෙනුවෙන් ජාතික තරුණ සේවා සභාව මඟින් රු: 75,000/= ක මුදලක් ලබාදී රු: 225,000/= ක අවම වටිනාකමකින් යුත් ව්‍යාපෘති සිදු කරන ලෙසට උපදෙස් ලබාදී ඇතත්, යෞවන සමාජ විසින් තම අභිප්‍රායන් අනුව ඉතා විශාල වටිනාකමකින් යුතු ව්‍යාපෘති තෝරාගෙන ඇත. සැළසුම් කල ආකාරයට ආධාර හා ප්‍රදාන නොලැබියාමේ ප්‍රායෝගික දුෂ්කරතාවයන් හේතුවෙන් එම ව්‍යාපෘති නතර වී ඇති බවක්, පොදුවේ නිරීක්ෂණය වේ. ස්වේච්ඡා මට්ටමින් සිදු කරන ලබන මෙම කාර්යයන් තුළ මෙම තත්ත්වය දැකිය හැකි අතර, අදාළ නිලධාරීන් මඟින් මෙම ව්‍යාපෘති නිමකරලීමට මේවන විට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. |
| (iii) | රු. 1,905,890 ක් පිරිවැය දක්වා තිබූ ව්‍යාපෘති 08 ක වියදම් තහවුරු කිරීමට අදාල බිල්පත් හෝ වෙනත් පිළිගත හැකි සාක්ෂි ගොනුගත කර නොතිබුණි. | විගණන පරීක්ෂණය සිදුකරන අවස්ථාවේ ව්‍යාපෘති 08 ක වියදම් තහවුරු කිරීමට අදාළ බිල්පත් හෝ වෙනත් පිළිගත හැකි සාක්ෂි ගොනු ගතකර නොතිබුණු බව ඔබගේ නිරීක්ෂණයන්හි සඳහන් වුවද, මේ වන විට ඉන් බොහෝ ව්‍යාපෘතිවලට අදාළ බිල්පත් හා අනෙකුත් ලිපිලේඛණ ඉදිරිපත් කර ඇති බව සඳහන් කරමි.<br>එසේ නොමැති ව්‍යාපෘති සඳහා දරණ ලද වියදම් වෙනුවෙන් බිල්පත් ඉදිරිපත් කරන ලෙසත්, 2017 වර්ෂයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඒ පිළිබඳව දැඩි අවධානයකින් කටයුතු කරන ලෙසටත් චක්‍රලේඛ උපදෙස් තුලින් දන්වා ඇති අතර, ඒ සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් සෑම දිස්ත්‍රික්කයක් තුළම මේවන විට ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 4.8 | වෙනත් ආයතන වෙත ලබාදුන් සභාවෙහි සම්පත් | |

| | | |
|---|---|---|
| | පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| (අ) | ජාතික තරුණ සේවා සභාවට කිසිඳු සම්බන්ධතාවයක් නොමැති 1972 අංක 05 දරන සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ පාලනයට හා අධීක්ෂණයට ලක්වන ආයතනයක් වන සීමාසහිත ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමූපාකාර සමිති සංගමයේ කටයුතු සඳහා විධිමත් අනුමැතියකින් තොරව සභාවේ සේවකයන් 19 දෙනෙකු පූර්ණකාලීනව ද තවත් සේවකයන් දෙදෙනෙකු අර්ධ කාලීනව ද සේවයේ නියුක්ත කර තිබුණි. ඉන් සේවකයින් 05 දෙනෙකු වසර 05 කට වඩා වැඩි කාලපරිච්ඡේදයක සිට එසේ සේවා නියුක්ත කර තිබුණි. පූර්ණ කාලීනව සේවයේ නියුක්ත සේවකයන් වෙනුවෙන් සභාව 2016 වර්ෂය සඳහා පමණක් එකතුව රු. 8,466,833 ක පාරිශ්‍රමික ලෙස ගෙවා තිබුණි.<br><br>තවද කිසිදු ගාස්තු අයකිරීමකින් තොරව එම ආයතනයෙහි පරිපාලන කාර්යාල, සභාවේ පරිශ්‍රය තුළ පවත්වාගෙන යාමට අවසර දී තිබුණු අතර ඊට අවශ්‍ය විදුලිය, ජලය හා අනෙකුත් සියළු යටිතල පහසුකම් සභාව විසින් සපයා තිබුණි. එමෙන්ම එම ආයතනය විසින් වසරකට දෙවරක් පවත්වනු ලබන නිස්කෝ ව්‍යාපාරික පොළ, සභා භූමිය තුළ සභාවේ සම්පත් උපයෝගී කරගෙන පවත්වනු ලබන අතර 2016 වර්ෂයේ දී එම ව්‍යාපාරික පොල සඳහා සභාවේ පොදු පහසුකම් භාවිතා කිරීම වෙනුවෙන් අවස්ථා දෙකකදී රු. 100,000 ක් සභාවට ලබා දෙමින් එම ආයතනය ඉන් රු. 2,473,100 ක ආදායමක් උපයා තිබුණි. | ජාතික තරුණ සේවා පනතේ 4 (ඒ) වගන්තියේ සඳහන් පරිදි රාජ්‍යයේ ආර්ථික සැකසුම ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව දීර්ඝ කාලීන ප්‍රතිපත්ති පදනමක් මත ඵලදායී ලෙස අරමුදල් ආයෝජනය කිරීමෙන් තරුණයන් සඳහා ක්‍රමික සේවා නියුක්තිය සඳහා අවස්ථා සැලසීමේ උපාය මාර්ගයක් ලෙස ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිතව නිස්කෝ තරුණ සේවා සමූපකාර සමිති සංගමය පිහිටුවා ඇත. තරුණ සංවර්ධනය වෙනුවෙන් නිස්කෝ තරුණ සේවා සමූපකාර සමිති සංගමයට අනහිතදීමක් වශයෙන් තරුණ සේවා සභාව ආරම්භයේ සිටම මෙම අනුග්‍රහය ලබාදී ඇත. එම ආයතනය තරුණයන්ගේ ව්‍යාපාරික ප්‍රවර්ධනය කිරීමේ සේවාව වෙනුවෙන් තරුණ සේවා සභාව එසේ සිදුකර ඇත.ජලය විදුලිය හා අනෙකුත් යටිතල පහසුකම් නොමිළේ නිස්කෝ ආයතනට සැපයීම ආරම්භක ප්‍රතිපත්තියකි. එසේ වුවද වසරකට දෙවරක් පැවැත්වෙන නිස්කෝ පොළ වෙනුවෙන් සාධාරණ ගාස්තුවක් අයකිරිම සඳහා අදාළ නිලධාරින්ට උපදෙස් දුනිමි. |
| (ආ) | 1980 ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ සමාජ සේවා සංවිධානයක් වශයෙන් ලියාපදිංචි වූ යෞවන සමාජ සම්මේලනය වෙත නීත්‍යානුකූල පදනමකින් තොරව සභාවේ සේවකයින් 04 දෙනෙකු පූර්ණකාලීනව මුදාහැර ඔවුන් වෙනුවෙන් 2016 වර්ෂය සඳහා සභාව රු. 1,390,499 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. | මෙහි පරිපාලන කටයුතු සඳහා ලේකම්වරයෙකු තරුණ සේවා සභාව මගින් පත්කරනු ලබන අතර, සම්මේලනයේ මුදල් පරිහරණ කටයුතු සම්බන්ධයෙන් සභාවේ අධීක්ෂණය මත සේවකයන් දෙදෙනෙක් යෙදවීමටත් කාර්යාල කටයුතු පහසු කරගැනීම සඳහා කාර්යාල කාර්ය සහයකයෙකු යොදවා ඇත. මෙසේ යෙදවීමට හේතුවී ඇත්තේ සම්මේලනය සඳහා පත්වන ජාතික මණ්ඩල නියෝජිතයින් තරුණ ප්‍රජාව නියෝජනය කිරීමේ හැකියාව තිබුනද, ආයතනයේ පවතින නීතිරීති පිළිබඳ දැනුවත්භාවය නොමැතිවීම නිසා ඔවුන්ට මඟපෙන්වීම සඳහාය. |
| (ඇ) | ජාතික තරුණ සේවා සභාවට අයත් අංක 51 - 7262 හා PC-3675 දරන කැබ් රථ පිළිවෙලින් 2012 වර්ෂයේ සිට සහ 2015 වර්ෂයේ සිට විධිමත් අනුමැතියකින් හා පැවරීමකින් තොරව සීමාසහිත තරුණ සේවා සමාගමට ලබා දී තිබූ අතර එම කාල පරිච්ඡේදයට අදාලව සභාව විසින් එම වාහන වෙනුවෙන් එකතුව රු. 339,265 ක රක්ෂණ වාරික ගෙවා තිබුණි. | තරුණ සේවා සමාගමට ලබාදී තිබූ වාහන වෙනුවෙන් සාධාරණ ගාස්තුවක් එම වාහන වෙනුවෙන් දරණ ලද රක්ෂණ ගාස්තු සමඟ අයකිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දුනිමි. |
| (ඈ) | ආයතනය සතු පිරිවැය රු. 24,100,000 ක් වූ වාහන 03 ක් රේඛීය අමාත්‍යාංශ පරිහරණය සඳහා ලබා දී තිබුණු අතර ඉන් වාහන 02 ක් 2012 වර්ෂයේ සිට ද, එක් වාහනයක් 2013 වර්ෂයේ සිට ද අමාත්‍යාංශය විසින් පාවිච්චි කරනු ලැබූ එම වාහනවල රක්ෂණ වාරික ලෙස 2016 වර්ෂයේ පමණක් එකතුව රු. 224,306 ක් සභාව විසින් ගෙවා තිබුණි. | තරුණ සේවා සභාව පාවිච්චි කරන අමාත්‍යාංශය සතු වාහන පවරා ගැනීමටත්, අමාත්‍යාංශය පාවිච්ච කරන සභාව සතු වාහන පවරාදීමටත් කටයුතු කරමි. ඒ අනුව ඉදිරි වර්ෂ වලදී අදාළ රක්ෂණ වාරික අයිතිකාර පාර්ශවයෙන් දරනු ඇත. |
| 4.9 | කාර්ය මණ්ඩල පරිපාලනය | |
| | සභාවෙහි අරමුණු හා පරමාර්ථ ඉටුකරගැනීමට අවශ්‍ය කරන කාර්ය මණ්ඩලය හා ඔවුන් සතුව තිබිය යුතු සුදුසුකම් | |

| | | |
|---|---|---|
| | ඇතුළත්ව 2012 නොවැම්බර් 22 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කර ගන්නා ලද බඳවා ගැනීමේ පරිපාටියට අනුව නිලධාරීන් බඳවා ගැනීමට සමාලෝචිත වර්ෂය නිමවන විටත් සභාව කටයුතු කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| (අ) | 2016 දෙසැම්බර් 31 දිනට විගණනය සඳහා ඉදිරිපත් කළ තොරතුරු අනුව අනුමත තනතුරු 1,606 ට අමතරව එම තනතුර දරන්නාට පමණක් පුද්ගලික වන සේ වූ තනතුරු 239 සමග අනුමත තනතුරු 1,845 න් තනතුරු 275 ක් සමාලෝචිත වර්ෂය නිම වන විට පුරප්පාඩුව පැවතුණි. විස්තර පහත දැක්වේ. | |

| තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | අනියම් / කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| ඉහළ කළමනාකරණ මට්ටම (HM-1-1) | 05 | 04 | 01 | මෙයට අදාළ විස්තරාත්මක පිළිතුර උපලේඛණ අංක 11 මගින් වේ |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම (MM-1-1) | 64 | 49 | 15 | |
| මධ්‍යම මට්ටමේ කළමනාකරණ තනතුරු | 106 | 71 | 35 | |
| අනෙකුත් | 1,670 | 1,446 | 224 | |
| **එකතුව** | **1,845** | **1,570** | **275** | |

| | | |
|---|---|---|
| (ආ) | ප්‍රධාන කළමනාකරණ තනතුරු හතරක් වන අධ්‍යක්ෂ(මුදල්), අධ්‍යක්ෂ(පාලන), අධ්‍යක්ෂ(පුහුණු), අධ්‍යක්ෂ(සංවර්ධන), යන තනතුරු ඇතුළුව අනෙකුත් මාණ්ඩලික හා මාණ්ඩලික නොවන තනතුරු සඳහා සුදුසුකම් සපුරන ලද නිලධාරීන් බඳවාගැනීමෙන් තොරව ඉහත සඳහන් පරිදි තනතුරු පුරප්පාඩු වීමට ඉඩහැර ඒ සඳහා වැඩ ආවරණය කිරීමේ හෝ ද්විතියන පදනම මත නිලධාරීන් අනුයුක්ත කිරීම දිගින් දිගටම සිදු කෙරේ. ඒ හේතුවෙන් එම තනතුරු සඳහා ප්‍රවීණ ස්ථිර කාර්ය මණ්ඩලයක් ඇති කිරීමට කිසිඳු වැඩපිළිවෙලක් සභාවට නොමැති බව නිරීක්ෂණය විය. | ජාතික තරුණ සේවා සභාව රජයේ මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, ප්‍රසම්පාදන මාර්ගෝපදේශය හා රජයේ වෙනත් චක්‍රලේඛ අනුව කටයුතු කරන ආයතනයකි. එබැවින් මෙහි සඳහන් ප්‍රධාන තනතුරු රාජ්‍ය සේවයේ පලපුරුදු නිලධාරීන් ද්විතියණයකරණය කිරිම තුලින් සභාවේ මූල්‍ය සහ පරිපාලන කටයුතු කාර්යක්ෂම කිරිම අපේක්ෂා කෙරේ. එම නිලධාරීන් මගින් ස්ථිර කාර්ය මණ්ඩලය පුහුණු කිරිම තුලින් අනාගතයේ ස්ථිර කාර්ය මණ්ඩලය මගින්ම එම කාර්යයන් ඉටුකර ගැනීමට මගසැලසෙනු ඇත. |
| (ඇ) | සහ මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු පුරප්පාඩු පිළිවෙලින් 15 ක් හා 35 ක් පැවතියද ඒ සඳහා නිලධාරීන් 42 දෙනෙකු හා 51 දෙනෙකු වැඩ ආවරණය සඳහා පත්කර තිබුණි. | මෙයට අදාළ විස්තරාත්මක පිළිතුර උපලේඛණ අංක 11 මගින් වේ |
| (ඈ) | ආයතනයේ මූලික අරමුණුවලට සෘජු දායකත්වයක් දක්වන සහකාර තරුණ සේවා නිලධාරී තනතුරු 330 ක් අනුමත කරගෙන තිබුණද 2016 දෙසැම්බර් 31 දිනට ඉන් 44 ක් පුරප්පාඩුව පැවතුණි | |

| | | |
|---|---|---|
| 5 | ගිණුම් කටයුතුභාවය හා යහපාලනය | |
| 5.1 | අභ්‍යන්තර විගණනය | |
| | මේ පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය | |
| (අ) | සභාවෙහි සංවිධාන ව්‍යුහය අනුව අභ්‍යන්තර විගණක මධ්‍යම කළමනාකරණ II මට්ටමේ තනතුරක් වන අතර සභාවෙහි කාර්ය භාරය හා විෂය පථයට ගැලපෙන ආකාරයට අභ්‍යන්තර විගණක තනතුරක් ඇතිකිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම එම තනතුර ස්ථිරව පිරවීමට කටයුතු නොකර ඒ සඳහා 2016 දෙසැම්බර් 05 දින සිට මාස 06 ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනමින් නිලධාරියෙකු බඳවාගෙන තිබුණි. | මේවන විට අනුමත කාර්ය මණ්ඩලයෙහි ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරක් ජ්‍යෙෂ්ඨ කළමණාකරන මට්ටමේ අනුමත කර ඇත. එම තනතුර මේ වන විට කොන්ත්‍රාත් පදනම මත ශ්‍රී ලංකා ගණකාධිකරන සේවයේ 1 වන පන්තියේ විශ්‍රාමික නිලධාරියෙකු සේවය කරයි. කෙසේ වුවද මෙම තනතුර සඳහා මේ වන විට පුවත්පත් මගින් දැන්වීම් පලකර අයදුම්පත් කැඳවා ඇත. එම අයදුම් පත් අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වා ස්ථිර ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු පත්කිරිම සඳහා කටයුතු සිදුකරමින් පවතී. |
| (ආ) | ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ සභාව වෙත රු. 218,244,242 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ලිපිය (Implementation Document) අනුව අභ්‍යන්තර විගණන ඒකකය විසින් ඊට අදාල කාර්යසාධන දීමනා ක්‍රමය ඇතුළුව අවදානම් පදනම් වූ වැඩි බලපෑමක් පවතින ක්ෂේත්‍ර (Risk base and high impact) හඳුනාගෙන විගණන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කල යුතුව තිබුණි. විගණනය වෙත එවා තිබූ වාර්තා අනුව උක්ත අරමුණු ඉටුවන පරිදි ප්‍රමාණවත් විගණනයක් සිදු වී නොමැති බව නිරීක්ෂණය විය. | 2017 වර්ෂයේ විගණන සැලැස්මට ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘති සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි විශේෂ අවධානය යොමුකර ඇති බව කාරුණිකව වාර්තා කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් සිදුකරන ලද පරීක්ෂාවන්ගෙන් අනාවරණය වී තිබූ ආයතනයේ මූල්‍ය හා පරිපාලනය කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් විය හැකි විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ආයතනය තුළ ක්‍රියාත්මක වී නොතිබුණි. ඒ අනුව සභාව විසින් එහි අභ්‍යන්තර පාලන ක්‍රමවේදය ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණනය ඵලදායීව උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය විය. | මේ වන විට අභ්‍යන්තර විගණන අංශය ඉදිරිපත් කරන ලද නිර්දේශ මත කාර්යාල නියෝග හා උපදෙස් නිකුත් කිරීම් සිදුකර ඇති අතර නිලධාරින්ගේ විනය පාලනය සහ පරිපාලන කටයුතු යථාවත් කිරීම සඳහා මෙම වාර්තා යොදා ගෙන ඇති බව කාරුණිකව දන්වමි. |
| 5.2 | අයවැය ලේඛනමය පාලනය | |
| | පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| | සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික අයවැය ලේඛනය අවස්ථා 04 කදී සංශෝධනය කර තිබුණු අතර අවසන් සංශෝධනය 2016 නොවැම්බර් 18 දින සිදුකර තිබුණි. එමෙන්ම පහත සඳහන් තොරතුරු අනුව සභාව විසින් එහි වාර්ෂික අයවැය ලේඛනය මූල්‍ය පාලන ක්‍රමයක් ලෙස ඵලදායීව උපයෝගී කර ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | |
| (අ) | ආයතනයේ අරමුණු ඉටු කිරීම කෙරෙහි සෘජු දායකත්වයක් දක්වන පහත සඳහන් අංශ සඳහා වෙන්කර දී තිබූ වාර්ෂික අයවැය ප්‍රතිපාදන අදාල අරමුණු කරා යෙදවීමෙන් තොරව සැලකිය යුතු ප්‍රතිශතයක් ඉතිරිව තිබුණි. | |

| අංශය | වෙන්කර තිබුණු වාර්ෂික ප්‍රතිපාදනය රු. | වැයකළ මුදල රු. | ඉතිරිය රු. | ඉතිරිය ප්‍රතිපාදිත මුදලෙහි ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| මාධ්‍ය අංශය | 10,000,000 | 5,983,192 | 4,016,808 | 46 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | පර්යේෂණ හා සැලසුම් අංශය | 7,000,000 | 3,749,438 | 3,250,562 | 46 | සැලසුම් සහ සංවර්ධන අංශය සඳහා 2016 වර්ෂයේ දී වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.7,000,000.00 ක් වන අතර එම වර්ෂයේ දී වැය වූ මුදල රු. 3,749,438.00 ක් වන අතර, ඉතිරිය රු.3,250,562.00 ක මුදලකි. මෙම මුදල 2016 වර්ෂයේ දී වැය නොවී ඉතිරි වීමට පහත සඳහන් කරුණු හේතු විය.<br>සැලසුම් ව්‍යාපෘතිය - 2016 වර්ෂයේ සංයුක්ත සැලැස්ම සකස් කිරීම සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනඅතුරින් ඇතැම් වැය දැරීම් සිදුවූයේ 2017 වර්ෂයේ දීය. 2016 වර්ෂයේ සංයුක්ත සැළැස්ම සඳහා වෙන් කර තිබූ මුද්‍රණ වියදම් ගෙවීමට සිදු වූයේ 2017 වර්ෂයේ දීය.<br><br>ප්‍රගති සමාලෝචන ව්‍යාපෘතිය - මීට ඉහතදී ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කළේ ප්‍රගති සමාලෝචන 2016 වර්ෂයේ දීම "ප්‍රගති සමාලෝචන" නම් වෙනත් අංශයක් විසිනි. එහෙත් 2016 වර්ෂයේ දී ප්‍රගති සමාලෝචන රාජකාරිය සැලසුම් සහ සංවර්ධන අංශය වෙත ලබාදීමට සිදුවිය. ඉන් පසුව ප්‍රගතිය ලබාගැනීම හා ප්‍රගති වාර්තා සකස්කිරීම ක්‍රමවත් කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් නිලධාරින් දැනුවත් කිරීම වෙනුවෙන් දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීමට කටයුතු යොදා ගෙන තිබුණත් එම රැස්වීම් පළාත් මට්ටමින් පැවැත්වීම.<br><br>තවද, සැලසුම් සහ සංවර්ධන අංශය මගින් 2013,2014 වාර්ෂික වාර්තාව සකස් කිරීම සිදුවූයේ 2016 වර්ෂයේ දීය. 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව සඳහා ඇතුළත් කළ යුතු විගණකාධිපති වාර්තාව 2016 වර්ෂයේ දී මෙම අංශ වෙත නොලැබීම මත වාර්ෂික වාර්තාව සකස් කරගැනීමට නොහැකි වීම. එමෙන්ම 2016 වර්ෂයේ දී එම වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීමට නොහැකි වීම. 2015 වාර්ෂික වාර්තාව මුද්‍රණය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය එම වර්ෂයේ දී වැය දැරීමට නොහැකි වීම. එම කරුණු ද 2016 වර්ෂයේ ප්‍රතිපාදන ඉතිරිවීමට හේතුවක් විය.<br><br>2016 වර්ෂයේ ජාතික තරුණ සේවා සභාවේ සියළුම නිලධාරින් කැඳවා ප්‍රගති සමාලෝචන වැඩසටහනක් පැවැත්වීමට කටයුතු යොදා තිබුණ ද එය 2016 වර්ෂයේ දෙසැම්බර් මස දක්වා ම කල් ගිය නිසාවෙන් එය 2016 වර්ෂයේ දී නොපැවැත්වීම හේතුවෙන් එම ප්‍රතිපාදනයන් ද 2016 වර්ෂයේ දී ඉතිරි විය.<br><br>සැලසුම් සහ සංවර්ධන අංශය යටතේ පැවති පුස්තකාලය සඳහා පොත් මිළදී ගැනීම සාමාන්‍ය පරිදි සිදුවූයේ සාහිත්‍ය මාසයේ දී පොත් වෙළඳ ප්‍රදර්ශනයේ දීය. 2016 වර්ෂයේ දී පුස්තකාලය සඳහා පොත් මිළදී ගැනීම විවෘත මිළ ගණන් කැඳවා ලබා ගැනීමට ක්‍රියා කළ නිසාවෙන්. වෙන් කර තිබූ මුළු මුදලින් පොත් මිළදී නොගැනීම හේතුවෙන් එම ප්‍රතිපාදනයන් අතුරින් ද මුදල් ඉතිරිවීමක් සිදුවිය. |
| | යෞවන තිළිණ අංශය | 4,000,000 | 2,971,397 | 1,028,603 | 26 | |
| | තරුණ මධ්‍යස්ථාන නඩත්තු අංශය | 10,008,000 | 1,051,289 | 8,956,711 | 90 | |

| | | | | |
|---|---|---|---|---|
| ආදායම් ප්‍රවර්ධන හා ගොවිපල සංවර්ධන අංශය | 24,326,250 | 7,091,349 | 17,234,901 | 71 |
| නිස්කෝ වීඩියෝ අංශය | 6,821,500 | 3,145,513 | 3,675,987 | 54 |
| ඇගයීම් අංශය | 10,500,000 | 6,773,317 | 3,726,683 | 35 |
| තොරතුරු තාක්ෂණ අංශය | 5,000,000 | 1,278,910 | 3,721,090 | 74 |

(ආ) ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීම් - පහත අංශ වෙනුවෙන් ප්‍රතිපාදිත මුදල සියයට 5 සිට සියයට 95 දක්වා වූ පරාසයකින් ඉක්මවා වියදම් දරා තිබෙනු නිරීක්ෂණය විය.

| අංශය | වෙන්කර තිබුණු වාර්ෂික ප්‍රතිපාදනය<br>රු. | වැයකළ මුදල<br>රු. | ප්‍රතිපාදන ඉක්මවා වියදම් වූ ප්‍රමාණය<br>රු. | ප්‍රතිපාදන ඉක්මවා වියදම් වූ ප්‍රමාණය ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|
| ආයතන | 863,080,000 | 968,045,278 | 104,965,278 | 12 | අතිකාල හිමි නිලධාරින්ගේ මූලික වැටුප වැඩිවීම, ගමන් වියදම් ඉහළ යාම, 1/20 දීමනා ගෙවීම, අභ්‍යාසලාභීන්ගේ සේවා වෙනුවෙන් ගෙවීම, මාසික දුරකථන දීමනාව ඉහළයාම/දීමනා ගෙවීමට නිලධාරින් වැඩි පිරිසක් සුදුසුකම් ලැබීම, විදුලිය හා ජලය පරිභෝජනය ඉහළයාම වෙනුවෙන් වියදම් වැඩිවීම, ආරක්ෂක සේවා වෙනුවෙන් ගෙවන මාසික දීමනාව රුපියල් ලක්ෂ 25 ක් පමණ වීම යන කරුණු මේ සඳහා බලපා ඇත. |
| ප්‍රවාහන | 24,350,000 | 30,209,136 | 5,859,136 | 24 | |
| ඉදිකිරීම් | 4,800,000 | 9,366,153 | 4,566,153 | 95 | |
| ජාත්‍යන්තර තරුණ සම්බන්ධතා අංශය | 25,000,000 | 26,220,600 | 1,220,600 | 5 | 2016 වර්ෂයේ වැඩසටහන් 08 සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදනය රු.මි.25 කි. වර්ෂය අවසානයේ වැයදරා ඇති මුදල රු.26,220,000 ක් වන අතර, ප්‍රධාන වැඩසටහන් 08 තුල අපේක්ෂිත ක්‍රියාකාරකම් 22 කි. නමුත් වර්ෂය අවසානය වන විට ක්‍රියාකාරකම් 55 ක් සිදුකිරීම ප්‍රතිපාදනය ඉක්මවීමට බලපා ඇත. |

5.3 නොවිසඳී ඇති විගණන ඡේද

2014 වර්ෂයේ විගණන වාර්තාව මගින් පෙන්වා දී ඇති ආයතනයේ මූල්‍ය හා පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් බලපෑමක් සිදුවී ඇති විගණන සොයාගැනීම් 03 ක් සම්බන්ධයෙන් හා පූර්ව වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් ප්‍රමාණවත් විගණන සොයාගැනීම් 05 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය නිමවන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2014 විගණකාධිපති වාර්තාව**

**5.4 ඡේදය**

(අ) විගණක වාර්තාව මගින් පෙන්වාදී ඇති භාණ්ඩ ඌණතා වටිනාකම වන රු.2,646,404 ක වටිනාකම් අයකර ගැනීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතී.

(ආ) 2013 වර්ෂයේදී භාවිතයෙන් ඉවත්කර පුහුණු උපකරණ ලෙස යොදා ගැනීම සඳහා ලබාදෙන ලද වාහන වලට අදාළව වටිනාකම් පුහුණු උපකරණ ලෙස ගිණුම්ගත

| | | |
|---|---|---|
| | | කිරීම සඳහා සටහන් කරගන්නා ලදී<br>(ඈ) 2014 ජූලි 10 දිනැති සභාතීරණ අංක 21/2014 යටතේ කපාහැර ඇති සී/ස තරුණ සේවා (නැටුම්) හා (සංගීත) සමාගම්හි ආයෝජනයන් පොත් වලින් ලියාහැරීමට අදාළව කැබිනට් අනුමැතිය ලබාගැනීම සඳහා වූ කටයුතු කරමින් පවතී.<br><br>2015 විගණකාධිපති වාර්තාව<br>5.4 ඡේදය<br>(අ) නීතිශිෂ්‍ය - මේ සම්බන්ධව අභ්‍යන්තර විමර්ශණයක් සිදුකරමින් පවතී.<br>(ආ) වැට් - විගණන විමසුමේ සඳහන් 2,682,451 ක ගෙවීමට අදාළ කොන්ත්‍රාත්කරු වන ඩී.එන්.වීරතුංග මයා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට මෙම මුදල් ගෙවා අවසන් කර වැට් ලිපි ගොනුව සක්‍රීය කර ඇති බව දේශීය ආදායම් කොමසාරිස් ගේ 2017.06.21 දිනැති ලිපිය මගින් දැනුම්දී ඇත. අදාළ ලිපිය උපලේඛණ අංක 12 වශයෙන් ඉදිරිපත් කර ඇත.<br>(ඇ) M-Cash - උපලේඛණ අංක 13<br>(ඈ) හෙයියන්තුඩුව ආහාර සැපයීම -<br>(ඉ) සභාවට අනුබද්ධිත ආයතනයක් වන සී/ස තරුණ සේවා සමාගමට ලබාදී ඇති වාහන වෙනුවෙන් සාධාරණ ගාස්තුවක් අයකිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දුනිමි. |

| | | |
|---|---|---|
| 6 | පද්ධති හා පාලනයන් | |
| | විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයන් අඩුපාඩු වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකල යුතුවේ. | පෙන්වාදී ඇති පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ගයන්ට යොමුවීම සඳහා සටහන් කරගන්නා ලද බව කාරුණිකව දන්වා සිටිමි. |
| (අ) | ප්‍රසම්පාදනය<br>රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල වන පරිදි විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම හා ඒ තුලින් රජයේ මුදල් කාර්යක්ෂමව ඵලදායීව හා ආර්ථිකව උපයෝජනය කිරීම. | |
| (ආ) | අයවැය පාලනය<br>රාජ්‍ය ව්‍යාපාර උපදෙස් පරිදි ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වන පරිදි අයවැයගත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු බව හා කාලීන පදනමක් මත කාර්ය සාධනය ඇගයීමට ලක්කර අවශ්‍ය සංශෝධන කළයුතු වීම | |
| (ඇ) | ගිණුම්කරණය<br>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කරමින් මූල්‍ය තොරතුරු නිවැරදිව වාර්තා වන පරිදි විධිමත් ගිණුම්කරණ පද්ධතියක් පවත්වා ගැනීම | |
| (ඈ) | කාර්ය මන්ඩල පරිපාලනය<br>අනුමත කාර්ය මණ්ඩලයට සහ බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව බඳවා ගැනීම්, උසස් කිරීම්, පුහුණුව හා සංවර්ධනය කිරිම හා ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට හැකිවන පරිදි මානව සම්පත් සැලැස්මක් සකස්කර සමාලෝචනය කර යාවත්කාලීන කිරීම | |
| (ඉ) | පුහුණු පාඨමාලා පැවැත්වීම<br>ආයතනය විසින් ක්‍රියාත්මක කරන පුහුණු වැඩසටහන් සඳහා උපදේශකවරුන් බඳවා ගැනීම හා ගෙවීම් කිරිම මෙන්ම වර්ථමාන තරුණ අවශ්‍යතා සපුරාගත හැකි පරිදි පුහුණු වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම | |
| (ඊ) | වත්කම් පාලනය<br>සභාව සතු වත්කම්වල ආරක්ෂාව හා පැවැත්ම තහවුරු වන පරිදි විධිමත් ලේඛණ පවත්වා ගැනීම හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මගින් හෙළිදරව් වන කරුණු පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම | |